වර්ෂය මැද
රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව
2026

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

2026 ඔක්තෝබර් 31



වර්ෂය මැද

රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව 2026

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ

50 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලදී.

අනුර කුමාර දිසානායක

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය

2026 ඔක්තෝබර් 31

වර්ෂය මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2026

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 50 වැනි වගන්තිය යටතේ

ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලදී.

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 50 වැනි වගන්තියට අනුව, වර්ෂය මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් වන වාර්තාවක් මුදල් අමාත්‍යවරයා විසින් අදාළ වර්ෂයේ ඔක්තෝබර් මස අවසාන දින හෝ අදාළ වර්ෂයේ විසර්ජන පනත සම්මත කර මාස දහයක් ගතවීම හෝ යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ දී මහජනතාවගේ දැන ගැනීම සඳහා නිකුත් කිරීමටත් සහ මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළකිරීමටත්, ඉන් ඉක්බිතිව එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය වේ.

ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙහි දක්වා ඇති රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය හා සසඳමින් ආණ්ඩුවේ වර්ෂය මැද මූල්‍ය කාර්යසාධනය ඇගයීම සඳහා මහජනතාවට පදනමක් සැලසීම මෙම වාර්තාවේ අරමුණ වේ.

2026 වර්ෂයේ පළමු මාස හය තුළ රජයේ ඇස්තමේන්තු කරන ලද ආදායම සහ සැබෑ ආදායම, ඇස්තමේන්තු කරන ලද වියදම සහ සැබෑ වියදම, ඇස්තමේන්තු කරන ලද මුදල් ප්‍රවාහය සහ සැබෑ මුදල් ප්‍රවාහය හා ඇස්තමේන්තු කරන ලද ණය ගැනීම් සහ සැබෑ ණය ගැනීම් මෙම වාර්තාවේ ඇතුළත් වේ. 2026 වර්ෂයේ පළමු මාස හය සඳහා වන අයවැය තත්ත්වය පිළිබඳ තාවකාලික දත්ත ද, මුදල් අංශයේ ප්‍රවණතා, උද්ධමනය, විදේශ මූල්‍යයනය, රාජ්‍ය ණය, නිල සංචිත ද ඇතුළත්ව සාර්ව ආර්ථික කටයුතුවල කාර්යසාධනය සහ රජය සතු ව්‍යවසායයන්ගේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු ද මෙම වාර්තාවේ ඇතුළත් වේ.

පටුන

පිටු අංකය

01 වන පරිච්ඡේදය ආර්ථික සන්දර්භය

1.1	සමාලෝචනය	1
1.2	උද්ධමනය	3
1.3	මුදල් සහ ණය	4
1.4	කොටස් වෙළෙඳපොළ	5
1.5	විදේශ අංශයේ ප්‍රවණතා	5
1.6	ගෝලීය ආර්ථික ප්‍රවණතා	9
1.7	ගෝලීය වෙළෙඳාම	11
1.8	මුදල් හා මූල්‍ය අංශය	12

02 වන පරිච්ඡේදය රාජ්‍ය මූල්‍ය ප්‍රවණතා

2.1	සමාලෝචනය	14
2.2	රාජ්‍ය ආදායම	16
2.3	රාජ්‍ය වියදම	31
2.4	භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය	38

03 වන පරිච්ඡේදය රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යසාධනය

3.1	සමාලෝචනය	40
3.2	රජය සතු ප්‍රධාන ව්‍යාපාර දහය පිළිබඳ සමාලෝචනය	40

04 වන පරිච්ඡේදය විදේශ මූල්‍යයනය සහ රාජ්‍ය ණය කළමනාකරණය

4.1	සමාලෝචනය	50
4.2	රාජ්‍ය ණය තොගය	50
4.3	ණය ගැනීමේ සීමා උපයෝජනය	51
4.4	විදේශීය මූල්‍යයනය	51
4.5	ණය සේවාකරණ ගෙවීම්	52
4.6	ණය ප්‍රතිසංස්කරණ වැඩසටහනේ ප්‍රගතිය	52
4.7	රජයේ ඇපකර	53

මූලික ආර්ථික දර්ශක

දර්ශකය	කාලපරිච්ඡේදය	ඒකකය	වර්ෂාකම	
			2025	2026 (තාවකාලික)
මූර්ත අංශය				
ආර්ථික වර්ධනය	පළමු භාගය	%	4.8	4.7
කෘෂිකර්මාන්ත	පළමු භාගය	%	0.6	-0.6
කර්මාන්ත	පළමු භාගය	%	7.9	7.2
සේවා	පළමු භාගය	%	3.3	3.1
උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය) (කො.පා.මී.ද. 2021= 100)	ජුනි අවසානයට	%	-0.6	6.8
සේවා වියුක්ති අනුපාතය	දෙවන කාර්තුව	%	3.7	4.0
ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය	දෙවන කාර්තුව	%	49.1	50.0
රාජ්‍ය මූල්‍ය අංශය				
අයවැය ශේෂය	ජන.-ජුනි	රු.මිලි.	-405,603	9,509
මුළු ආදායම	ජන.-ජුනි	රු.මිලි.	2,321,719	2,954,189
බදු ආදායම	ජන.-ජුනි	රු.මිලි.	2,152,087	2,710,552
බදු නොවන ආදායම	ජන.-ජුනි	රු.මිලි.	169,632	243,637
මුළු වියදම	ජන.-ජුනි	රු.මිලි.	2,730,707	2,946,494
වර්තන වියදම	ජන.-ජුනි	රු.මිලි.	2,506,828	2,669,889
රාජ්‍ය ආයෝජන	ජන.-ජුනි	රු.මිලි.	228,064	280,071
රාජ්‍ය ණය (ශුද්ධ පදනම)	ජුනි.අවසානයට	රු.බිලි.	29,635	31,278
විදේශ අංශය				
අපනයන	ජන.-ජුනි	ඇ.ඩො.මිලි.	6,492	6,903
එයින්; කෘෂි අපනයන	ජන.-ජුනි	ඇ.ඩො.මිලි.	1,428	1,450
කාර්මික අපනයන	ජන.-ජුනි	ඇ.ඩො.මිලි.	5,045	5,425
රෙදිපිළි හා ඇඟළුම්	ජන.-ජුනි	ඇ.ඩො.මිලි.	2,606	2,451
වෙනත්	ජන.-ජුනි	ඇ.ඩො.මිලි.	2,439	2,974
ඛනිජ අපනයන	ජන.-ජුනි	ඇ.ඩො.මිලි.	10	18
ආනයන	ජන.-ජුනි	ඇ.ඩො.මිලි.	9,762	12,392
පාරිභෝගික භාණ්ඩ	ජන.-ජුනි	ඇ.ඩො.මිලි.	2,316	3,037
අන්තර් භාණ්ඩ	ජන.-ජුනි	ඇ.ඩො.මිලි.	5,576	7,059
එයින්; ඛනිජ නිෂ්පාදන	ජන.-ජුනි	ඇ.ඩො.මිලි.	1,996	3,168
ආයෝජන භාණ්ඩ	ජන.-ජුනි	ඇ.ඩො.මිලි.	1,863	2,284
වෙළඳ ශේෂය	ජන.-ජුනි	ඇ.ඩො.මිලි.	-3,270	-5,489
සංචාරක පැමිණීම්	ජන.-ජුනි	සංඛ්‍යාව	1,168,044	1,146,573
සංචාරක ඉපැයීම්	ජන.-ජුනි	ඇ.ඩො.මිලි.	1,713	1,511
සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ	ජන.-ජුනි	ඇ.ඩො.මිලි.	3,738	4,605
සමස්ථ ගෙවුම් ශේෂය	ජන.-ජුනි	ඇ.ඩො.මිලි.	522	136
දළ නිල සංචිත	ජුනි අවසානයට	ඇ.ඩො.මිලි.	6,081	6,458
විනිමය අනුපාතය (මාසය අග)	ජුනි අවසානයට	ඇ.ඩොලරයට රුපියල්	299.97	336.66
විනිමය අනුපාතය (මාසික සාමාන්‍යය)	ජන.-ජුනි	ඇ.ඩොලරයට රුපියල්	297.80	317.84
මුදල් අංශය				
නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය	ජුනි.අවසානයට	%	7.25	8.25
නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය	ජුනි.අවසානයට	%	8.25	9.25
ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය	ජුනි.අවසානයට	%	2.00	2.00
වාණිජ බැංකු වල නව බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය	ජුනි.අවසානයට	%	10.28	12.13
වාණිජ බැංකු වල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය	ජුනි.අවසානයට	%	11.56	12.16
භණ්ඩාගාර බිල්පත් බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (දින 91)	ජුනි.අවසානයට	%	7.55	10.14
භණ්ඩාගාර බිල්පත් බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (දින 364)	ජුනි.අවසානයට	%	7.94	10.17
මුදල් සැපයුමේ වර්ධනය (M_{2b})	ජුනි 2026/ ජුනි 2025	%	10.4	11.5
පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි වර්ධනය	ජුනි 2026/ ජුනි 2025	%	17.9	27.4

ශ්‍රී ලංකාව : තෝරාගත් දර්ශක

දර්ශකය	කාලපරිච්ඡේදය	ඒකකය	වටිනාකම
විදුලි බලය			
විදුලි බලය සඳහා ඇති ප්‍රවේශය	2016	%	99.3
ජලය			
පිරිසිදු පානීය ජල සැපයුම් සඳහා ප්‍රවේශය	2025	ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස	93.9
නල ජල පහසුකම් සඳහා ප්‍රවේශය	2025	ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස	62.3
මාර්ග			
මාර්ග ඝනත්වය	2025	වර්ග කි.මී.	0.19
මාර්ග වල මුළු දිග	2023	කි.මී	1 44,967
සන්නිවේදනය			
ජංගම දුරකථන ඇතුළුව දුරකථන ඝනත්වය	2025	පුද්ගලයින් 100 කට	147.6
අන්තර්ජාලය සඳහා ප්‍රවේශය	2025	පුද්ගලයින් 100 කට	109.6
අධ්‍යාපනය			
පොදු අධ්‍යාපනය			
ප්‍රාථමික පාසල් සඳහා ඇතුළත්වීමේ අනුපාතය	2025	%	95.5
ශිෂ්‍ය/ගුරු අනුපාතය (රජයේ පාසැල්)	2025	සංඛ්‍යාව	15.5
සාක්ෂරතා අනුපාතය (සාමාන්‍යය)	2024	%	93.3
පරිගනක සාක්ෂරතා අනුපාතය (පළමු මාස 6)	2025	%	38.4
විශ්ව විද්‍යාල අධ්‍යාපනය			
ශිෂ්‍ය/ගුරු අනුපාතය	2025	සංඛ්‍යාව	26.3
වයස් විශේෂිත ලියාපදිංචි අනුපාතය (වයස අවුරුදු 19-22) [අ]	2025	%	10.9
සෞඛ්‍ය			
රෝහල් (බටහිර වෛද්‍ය)	2025	සංඛ්‍යාව	628
ඇඳන්	2025	සංඛ්‍යාව	89,141
රෝහල් ඇඳන්	2025	පුද්ගලයින් 1,000 කට	4.2
වෛද්‍යවරයෙක් සඳහා පුද්ගලයින්	2025	සංඛ්‍යාව	905
ජනගහනය			
ජනගහන ඝනත්වය	2025	වර්ග කි.මීටරයට පුද්ගලයින්	349
ජනගහන වර්ධනය	2025	%	-0.7
උපතේදී ආයු අපේක්ෂාව	2017	අවුරුදු	75.5
ළදරු මරණ අනුපාතිකය	2021	සජීවී උපත් 1,000 කට	6.0
මාතෘ මරණ අනුපාතිකය	2022	සජීවී උපත් 1,000 කට	22.6
දළ උපත් අනුපාතිකය	2025	පුද්ගලයින් 1,000 කට	9.9
දළ මරණ අනුපාතිකය	2025	පුද්ගලයින් 1,000 කට	7.9
යැපුම් අනුපාතිකය	2025	%	49.8
දරිද්‍රතාව			
දරිද්‍රතා දර්ශකය	2019	%	14.3
ගෘහ ඒකක ආදායමෙහි ගිනි සංගුණකය	2019	සංගුණකය	0.46
දරිද්‍රතා පරතර දර්ශකය	2019	%	2.8
දිනකට ලබා ගන්නා සාමාන්‍ය කැලරි ප්‍රමානය	2019	කිලෝකැලරි	2,120
ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම්			**ස්ථානය**
මානව සංවර්ධන දර්ශකය	2025	රටවල් 193 ක් අතරින් ස්ථානය	89
දූෂණ සංජානන දර්ශකය	2025	රටවල් 182 ක් අතරින් ස්ථානය	107
ගෝලීය තරහකාරීත්ව දර්ශකය	2019	රටවල් 141 ක් අතරින් ස්ථානය	84
ආර්ථික නිදහස් දර්ශකය	2025	රටවල් 184 ක් අතරින් ස්ථානය	144
ගෝලීය සාම දර්ශකය	2026	රටවල් 163 ක් අතරින් ස්ථානය	67
ඊ-රාජ්‍ය සංවර්ධන දර්ශකය	2024	රටවල් 193 ක් අතරින් ස්ථානය	98

(අ) අභ්‍යන්තර ලියාපදිංචි වූ සිසුන් පමණක් ඇතුළත් වේ.

1 වන පරිච්ඡේදය

ආර්ථික සන්දර්භය

1.1 සමාලෝචනය

දිටිවා සුළි කුණාටුව හා මැදපෙරදිග ගැටුම් යන ද්විත්ව කම්පන හේතුවෙන් හටගත් බලශක්ති අර්බුදය මධ්‍යයේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඔරොත්තු දීමේ හැකියාව පිළිඹිබු කරන ලදී. අඛණ්ඩව කාර්තු දොළහක් මුළුල්ලේ ආර්ථිකය වර්ධනය වූ අතර පරිභෝජනය සහ ආයෝජනය වේගවත් වීම හේතුවෙන් 2026 වසරේ පළමු භාගයේ දී ආර්ථික ක්‍රියාකාරකම් සියයට 4.7 කින් ප්‍රසාරණය විය. ඉහළ යන ඉන්ධන මිල ගණන් හේතුවෙන් කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කොපාමිද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය තනි ඉලක්කම් අගයක පැවතිය ද, වැඩි වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළ අතර 2026 වසරේ සැප්තැම්බර් මාසයේදී සියයට 8.0 ක් විය. 2027 වසරේ දෙවන භාගයේ සිට උද්ධමනය සියයට 5 ට අඩු මට්ටමක පවතිනු ඇතැයි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපේක්ෂා කෙරේ. 2026 වසරේ අගෝස්තු මස අවසාන වන විට දළ නිල සංචිත ප්‍රමාණය ඇ.ඩො. බිලියන 6.9 ක් දක්වා ඉහළ ගිය අතර, එය ආසන්න වශයෙන් මාස 3.0 ඉක්මවන ආනයන වියදමට සමාන වේ. වාහන ණය සහ සංස්ථාපිත ණය ලබා දීම සාමාන්‍ය තත්ත්වයට පත්වීම පිළිඹිබු කරමින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය 2025 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ සියයට 20.5 ක වර්ධනයට පසුව, 2026 වසරේ සියයට 24.5 කින් වර්ධනය විය. ආදායම් පරිපාලනය ශක්තිමත් වීම සහ ආර්ථික ක්‍රියාකාරකම් වේගවත් වීම පිළිඹිබු කරමින් 2025 වසරේ පළමු මාස අට තුළ රු. බිලියන 3,068 ක් වූ බදු ආදායම 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 3,683 දක්වා සියයට 20.0 කින් වර්ධනය විය. මීට අමතරව, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය බොහෝ දුරට අවසන් වී ඇත.

සාර්ව ආර්ථික ස්ථායීකරණය සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හේතුවෙන් 2025 සහ 2026 වසරවල දී ප්‍රධාන ජාත්‍යන්තර දර්ශක ශ්‍රේණිගත කිරීම් සහ ගෝලීය ඇගයීම් කිහිපයක් ඔස්සේ ශ්‍රී ලංකාව සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා කර තිබේ.

ගෝලීය ශ්‍රේණිගත කිරීම්වල ප්‍රධාන වර්ධනයන්:

- **දූෂණ සංජානන දර්ශකය (2025/2026):** ‘ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා’ ආයතනය විසින් නිකුත් කරන ලද මෙම දර්ශකයට අනුව, ශ්‍රී ලංකාවේ ලකුණු සංඛ්‍යාව 100 න් 32 සිට 35 දක්වා ඉහළ ගොස් ඇති අතර, ඒ හරහා ගෝලීය ශ්‍රේණිගතකිරීම ස්ථාන 14 කින් ඉදිරියට එමින් 107 වැනි ස්ථානයට පත්ව ඇත.

- **ආයෝජක සබඳතා සහ ණය විනිවිදභාවය (2026):** ‘ජාත්‍යන්තර මූල්‍ය ආයතනය’ විසින් සිදු කරන ලද ඇගයීමට අනුව, ආයෝජක සබඳතා වැඩිදියුණු කිරීමේ අංශයෙන් ඉහළම දස්කම් දැක්වූ රටවල් අතර ගෝලීය වශයෙන් 4 වැනි ස්ථානයටත්, ණය විනිවිදභාවය අතින් 5 වැනි ස්ථානයටත් ශ්‍රී ලංකාව පත්ව ඇත.

- **ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම (2026):** රාජ්‍ය මූල්‍ය ශේෂ සහ විදේශ සංචිත තත්ත්වය වර්ධනය වීම හේතුවෙන් ෆිච් ශ්‍රේණිගතකිරීම් ශ්‍රී ලංකාවේ දිගුකාලීන විදේශ මුදල් නිකුත්කරන්නන්ගේ පැහැරහැරීම් ශ්‍රේණිගතකිරීම ‘CCC+’ මට්ටමේ සිට ‘B-’ මට්ටම දක්වා ඉහළ නංවන ලදී.

- **සංචාරක හා සංචාරක කර්මාන්ත සංවර්ධන දර්ශකය (2026):** 2024 වසරට සාපේක්ෂව දර්ශක අගය සියයට 4.33 කින් ඉහළ යාමත් සමඟ ලෝක ආර්ථික සංසදය විසින් සංචාරක ආර්ථිකයන්ගෙන් වේගවත්ම දියුණුවක් පෙන්නුම් කළ රටවල් අතර ලෝකයේ 10 වන ස්ථානයට ශ්‍රී ලංකාව නම් කරන ලදී.

- **ගෝලීය සාම දර්ශකය (2026):** ශ්‍රී ලංකාව ස්ථාන 14 කින් ඉදිරියට පැමිණ ගෝලීය වශයෙන් 67 වන ස්ථානයට (2025 දී 97 වන ස්ථානයේ සිට) පත්වූ අතර, දකුණු ආසියාව තුළ දෙවන ස්ථානය හිමිකර ගන්නා ලදී.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන මගින් සහාය දක්වන ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන සඳහා රජය කැපවී සිටී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නියෝජනය කරනු ලබන කණ්ඩායමක් විසින් හත්වන සමාලෝචනය සහ 2026 වසරේ IV වන වගන්තිය යටතේ උපදේශන කටයුතු අවසන් කර, 2026 ඔක්තෝබර් මස 04 වන දින කාර්ය මණ්ඩල මට්ටමේ එකඟතාවයකට එළඹුණි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලය විසින් සමාලෝචනය සඳහා අනුමැතිය ලබා දීමෙන් පසු

ඇ.ඩො. මිලියන 345 ක මූල්‍ය පහසුකම් ලබා ගත හැකි වනු ඇත.

2026 වසරේ පළමු භාගය තුළ කෘෂිකාර්මික අංශය හැර ආර්ථිකයේ අනෙකුත් සියළුම අංශ ප්‍රසාරණය විය. ඉදිකිරීම්, ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය මෙන්ම පතල් හා කැණීම් කර්මාන්තයන්ගේ වූ සැළකියයුතු වර්ධනය හේතුවෙන් කර්මාන්ත අංශය සියයට 7.2 කින් වර්ධනය විය. තොග හා සිල්ලර වෙළඳාම, භාණ්ඩ හා මගී ප්‍රවාහනය මෙන්ම මූල්‍ය සේවා ක්‍රියාකාරකම්වල සිදුවූ ප්‍රසාරණය හේතුවෙන් සේවා අංශය සියයට 3.1 කින් වර්ධනය විය. සහනාධාර අඩු කිරීමෙන් පසු භාණ්ඩ හා සේවා මත අය කරන බදු සියයට 13.5 කින් වර්ධනය වූ අතර, මෙය 2025 වසරේ අනුරූප කාලසීමාව තුළ වාර්තා වූ සියයට 10.7 ක වර්ධනයට සාපේක්ෂව ප්‍රතිශතාංක 2.8 කින් වර්ධනය වේගවත් වීමකි. මේ අතර, සත්ත්ව නිෂ්පාදන, වී වගාව, කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීවී වගාව යන උප-අංශයන්ගේ සිදුවූ සංකෝචනය වීම හේතුවෙන් කෘෂිකාර්මික අංශය සියයට 0.6 කින් හැකිලීමට ලක් විය.

කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කොපා.මි.ද., 2021=100) වාර්ෂික ලක්‍ෂ්‍යමය වෙනස මඟින් මණිනු ලබන මතුපිට උද්ධමනය 2026 ජූලි මාසයේ දී සියයට 7.3 ක සිට 2026 අගෝස්තු හා සැප්තැම්බර් මාසවල දී සියයට 8.0 දක්වා වැඩි වූ අතර, ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (ජා.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්‍ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය ද, 2026 ජූලි මාසයේ දී සියයට 7.2 ක සිට 2026 අගෝස්තු මාසය වන විට සියයට 8.1 ක් දක්වා වැඩි විය. මෙම වැඩිවීම් සඳහා දේශීය බලශක්ති සහ ආහාර මිල ගණන් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු විය. කෙටි කාලීනව උද්ධමනය සියයට 5 ක ඉලක්කයට වඩා වැඩි මට්ටමක පවතිනු ඇති අතර, පසුව එය ක්‍රමයෙන් ඉලක්කය වෙත ලඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ආර්ථිකයේ යටිදැරි උද්ධමනය පිළිබිඹු කරනු ලබන කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කොපා.මි.ද., 2021=100) වාර්ෂික ලක්‍ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මූලික උද්ධමනය 2026 අගෝස්තු මාසයේ දී සියයට 5.1 ක පැවතුණි. ඉදිරි කාලසීමාව තුළ මූලික උද්ධමනය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එය උද්ධමන ඉලක්කය හා සමීපව සමපාත වනු ඇත. උද්ධමනය කෙටි කාලීනව තාවකාලික වැඩි වීමක් පෙන්නුම් කළ ද, මධ්‍ය කාලීන උද්ධමන අපේක්ෂාවන් ඉලක්කගත මට්ටම ආශ්‍රිතව ස්ථාවරව පවතී.

ශ්‍රී ලංකා මහ බැංකුව 2026 මැයි මාසයේ දී මුදල් ප්‍රතිපත්තිය දැඩි කරන ලදී. රජය සහ මහ බැංකුව විසින් ගනු ලැබූ අනෙකුත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන් සමඟ මෙම දැඩි කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රමයෙන් ආර්ථිකය තුලට කා වදිනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර එමඟින් ණය වර්ධනය මන්දගාමී කිරීමටත්, ඉදිරි කාලසීමාව තුළ ඉල්ලුම මත පදනම් වූ පීඩනයන් ලිහිල් කිරීමටත් සහාය ලැබෙනු ඇත. ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇති උද්ධමනය, බලශක්ති මිල ගණන් ගැලපීම හේතුවෙන් මතුපිට උද්ධමනයට ඇති විය හැකි ද්විතීයික බලපෑම්, ආනයන ඉල්ලුම ඉහළ නංවන පෞද්ගලික අංශයේ ණය අඛණ්ඩව ප්‍රසාරණය වීම, විදේශ අංශය මත පවතින පීඩනයන් සහ උද්ධමනය පිළිබඳ අපේක්ෂාවන් ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමට නොහැකි වීමේ අවදානම යන කරුණු සැලකිල්ලට ගනිමින්, 2026 මැයි මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 'එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය' සියයට 8.75 ක් දක්වා පදනම් අංක 100 කින් වැඩි කරන ලදී. ඒ අනුව, මෙම එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට බද්ද වී පවතින 'නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය' පිළිවෙලින් සියයට 8.25 ක් සහ සියයට 9.25 ක් දක්වා වර්ධනය විය.

2026 ජූනි මස අවසානය වන විට කොටස් වෙළඳපොළ ප්‍රබල ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළ අතර, එහිදී සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) පෙර වසරට සාපේක්ෂව සියයට 23.5 කින් ඉහළ ගොස් ඒකක 22,263.3 ක් ලෙසත්, ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් ශ්‍රී ලංකා 20 දර්ශකය (2004 = 1,000) පෙර වසරට සාපේක්ෂව සියයට 15.9 කින් ඉහළ ගොස් ඒකක 6,205.1 ක් ලෙසත් සටහන් විය.

මැදපෙරදිග ගැටුම උත්සන්න වීම හේතුවෙන් ගෝලීය ඉන්ධන මිල ගණන් ඉහළ යාම නිසා ආනයන වියදම් ඉහළ යාම සහ සංචාරක ඉපැයීම් කෙරෙහි අහිතකර ලෙස බලපෑම හේතුවෙන් 2026 වසරේ පළමු මාස අට තුළ දී ශ්‍රී ලංකාවේ විදේශ අංශය පීඩනයට ලක් විය. 2025 වසරේ පළමු මාස අට තුළ ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා වුව ද, මැදපෙරදිග ගැටුමේ බලපෑම පිළිබිඹු කරමින් 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 291 ක හිඟයක් වාර්තා කරන ලදී. අපනයන ඉපැයීම්වල සිදු වූ වර්ධනයට වඩා ආනයන වියදම් ඉහළ යාම හේතුවෙන් 2025 වසරේ පළමු මාස අට තුළ ඇ.ඩො. බිලියන 4.3 ක්ව පැවති වෙළඳ හිඟය, 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. බිලියන 7.2 ක් දක්වා පුළුල් විය. 2025 වසරේ පළමු මාස අට තුළ ඇ.ඩො. බිලියන 9.1 ක්ව පැවති අපනයන, 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. බිලියන 9.4 දක්වා සියයට 3.3 කින් වර්ධනය විය. ප්‍රධාන වශයෙන් බොර තෙල් සහ වාහන ආනයනය සඳහා දැරීමට සිදු වූ ඉහළ වියදම් හේතුවෙන්, 2025 වසරේ පළමු මාස අට තුළ ඇ.ඩො. බිලියන 13.3 ක්ව පැවති ආනයන 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. බිලියන 16.6 දක්වා සියයට 24.1 කින් වැඩි විය.

2025 වසරේ පළමු මාස අට තුළ ඇ.ඩො. බිලියන 5.1 ක්ව පැවති ශ්‍රමික ප්‍රේෂණ, 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. බිලියන 6.1 දක්වා සියයට 19.8 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය.

කෙසේ වෙතත්, සංචාරක පැමිණීම් සියයට 2.0 කින් අඩුවීම සහ සාමාන්‍ය දෛනික සංචාරක වියදම පහළ දැමීම හේතුවෙන්, සංචාරක ඉපැයීම් 2025 වසරේ පළමු මාස අට තුළ පැවති ඇ.ඩො. බිලියන 2.3 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. බිලියන 2.1 දක්වා සියයට 10.0 කින් පහත වැටුණි.

2026 අගෝස්තු මස අවසානය වන විට චීන මහජන බැංකුව සමඟ පවතින මුදල් හුවමාරු පහසුකම ද ඇතුළුව දළ නිල සංචිත ප්‍රමාණය ඇ.ඩො. බිලියන 6.9 ක් විය. වසරේ ආරම්භයේ සිට 2026 අගෝස්තු මස අවසාන දින වන විට ශ්‍රී ලංකාවේ රුපියල ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව සියයට 5.5 කින් අවප්‍රමාණය වී තිබුණි.

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 50 වන වගන්තියට අනුව, 2026 වසරේ පළමු මාස හයට අදාළ සංවර්ධනයන් පහත ඡේදයන්හි අන්තර්ගත වේ.

1.2 උද්ධමනය

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කොා.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2026 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා වූ සියයට 2.3 සිට 2026 වසරේ ජුනි මාසයේ දී සියයට 6.8 දක්වා තියුණු ලෙස ඉහළ යන ලදී. 2026 වසරේ අප්‍රේල් මාසයේ දී උද්ධමනය සියයට 5.4 දක්වා කැපී පෙනෙන ලෙස වර්ධනය වීමට පෙර, 2026 වසරේ පෙබරවාරි සහ මාර්තු මාසවල දී මතුපිට උද්ධමනය පිළිවෙළින් සියයට 1.6 ක් සහ සියයට 2.2 ක් ලෙස අඩු මට්ටමක පැවතුණි. මැදපෙරදිග කලාපයේ උත්සන්න වූ ආතතීන් හේතුවෙන් ගෝලීය භාණ්ඩ මිල ගණන්, විශේෂයෙන්ම පෙට්‍රෝලියම් මිල ඉහළ යාමේ බලපෑම පිළිබිඹු කරමින්, දේශීය බලශක්ති මිල අඛණ්ඩව ඉහළ නැංවීමේ ප්‍රතිඵල මෙම උද්ධමන වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. මෙම ඉහළ යාමේ ප්‍රවණතාවය 2026 වසරේ මැයි සහ ජුනි මාස පුරාම අඛණ්ඩව පැවතුණි. ජුනි මාසයේ සිදුවූ මෙම ඉහළ යාමට ප්‍රධාන වශයෙන් බලපෑවේ ආහාර කාණ්ඩය වන අතර, ප්‍රධාන වශයෙන් මාළු සහ එළවළු මිල ගණන් ඉහළ යාම හේතුවෙන්, කොා.පා.මි.ද. හි මාසිකව වාර්තා වූ සියයට 2.1 ක ඉහළ යාම සඳහා මෙම කාණ්ඩයෙන් ප්‍රතිශතාංක 1.4 ක දායකත්වයක් ලැබුණි.

1.1 වගුව | උද්ධමනයේ විචලනය (%)

වසර	මාසය	කොළඹ පාරිභෝගික මිල දර්ශකය				ජාතික පාරිභෝගික මිල දර්ශකය			
		මතුපිට උද්ධමනය		මූලික උද්ධමනය*		මතුපිට උද්ධමනය		මූලික උද්ධමනය*	
		ලක්ෂ්‍යමය	වාර්ෂික සාමාන්‍යය	ලක්ෂ්‍යමය	වාර්ෂික සාමාන්‍යය	ලක්ෂ්‍යමය	වාර්ෂික සාමාන්‍යය	ලක්ෂ්‍යමය	වාර්ෂික සාමාන්‍යය
2025	ජනවාරි	-4.0	0.4	1.2	3.2	-4.0	0.7	-0.2	2.3
	පෙබරවාරි	-4.2	-0.5	0.7	3.0	-3.9	0.0	-0.6	2.0
	මාර්තු	-2.6	-0.8	0.7	2.8	-1.9	-0.4	-0.6	1.7
	අප්‍රේල්	-2.0	-1.1	0.8	2.6	-0.8	-0.7	-0.1	1.4
	මැයි	-0.7	-1.2	1.2	2.4	0.6	-0.8	0.3	1.2
	ජුනි	-0.6	-1.4	1.5	2.1	0.3	-0.9	0.6	0.9
	ජූලි	-0.3	-1.6	1.6	1.9	0.7	-1.1	0.9	0.7
	අගෝස්තු	1.2	-1.5	2.0	1.8	1.5	-1.0	1.5	0.7
	සැප්තැම්බර්	1.5	-1.4	2.0	1.7	2.1	-0.9	1.9	0.7
	ඔක්තෝබර්	2.1	-1.2	2.2	1.6	2.7	-0.6	2.1	0.7
	නොවැම්බර්	2.1	-0.8	2.4	1.6	2.4	-0.2	2.2	0.8
	දෙසැම්බර්	2.1	-0.5	2.7	1.6	2.9	0.2	2.6	0.9
2026	ජනවාරි	2.3	0.0	2.3	1.7	2.4	0.7	2.2	1.1
	පෙබරවාරි	1.6	0.5	2.1	1.8	1.6	1.2	2.2	1.3
	මාර්තු	2.2	0.9	2.5	2.0	2.4	1.5	2.7	1.6
	අප්‍රේල්	5.4	1.6	3.8	2.2	4.7	2.0	4.4	2.0
	මැයි	5.5	2.1	3.9	2.4	5.4	2.4	4.5	2.3
	ජුනි	6.8	2.7	4.0	2.6	6.5	2.9	5.0	2.7
	ජූලි	7.3	3.3	4.4	2.9	7.2	3.5	6.0	3.1
	අගෝස්තු	8.0	3.9	5.1	3.1	8.1	4.1	6.3	3.5
	සැප්තැම්බර්	8.0	4.5	5.4	3.4	8.1	4.5	6.4	3.9

මූලාශ්‍රය : ජනලේඛණ හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව

**කොළඹ පාරිභෝගික මිල දර්ශකය (ලක්ෂ්‍යමය), ජාතික පාරිභෝගික මිල දර්ශකය (ලක්ෂ්‍යමය) (පදනම් වර්ෂය 2021 = 100) ආහාර බලශක්ති සහ ප්‍රවාහනය යන නිතර වෙනස් වන අයිතම හැර*

මේ අතර, නිතර මිල උච්ඡාවචනය වන අයිතම වන ආහාර, බලශක්ති සහ ප්‍රවාහනය වැනි කාණ්ඩ බැහැර කිරීම මඟින් ආර්ථිකයේ යටිදැරි උද්ධමන ප්‍රවණතා පිළිබිඹු කරනු ලබන මූලික උද්ධමනය සැලකුවිට, කොෂා.මි.ද. (2021=100) යෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මූලික උද්ධමනය ද 2026 වසරේ පළමු භාගය පුරාම ඉහළ යන ප්‍රවණතාවයක් පෙන්නුම් කරන ලදී. එය 2026 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා වූ සියයට 2.3 සිට 2026 වසරේ ජූනි මාසයේ දී සියයට 4.0 දක්වා වැඩි විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2026 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා වූ සියයට 2.4 සිට 2026 වසරේ ජූනි මාසයේ දී සියයට 6.5 දක්වා ඉහළ ගිය අතර, එය පෙබරවාරි මාසයේ දී සියයට 1.6 දක්වා ලිහිල් වී මාර්තු මාසයේ සිට ඉහළ යෑම ආරම්භ වන ලදී. ආහාර නොවන උද්ධමනය 2026 වසරේ ජනවාරි මාසයේ පැවති සියයට 1.6 සිට 2026 වසරේ ජූනි මාසයේ දී සියයට 9.3 දක්වා තියුණු ලෙස ඉහළ ගිය අතර, එම කාලය තුළ ආහාර උද්ධමනය සියයට 3.4 සිට සියයට 3.3 දක්වා සුළු වශයෙන් පහත වැටුණි. ජා.පා.මි.ද. (2021=100) මත පදනම් වූ මූලික උද්ධමනය ද 2026 වසරේ ජනවාරි මාසයේ දී සියයට 2.2 ක අගයක සිට 2026 වසරේ ජූනි මාසයේ දී සියයට 5.0 දක්වා වර්ධනය විය.

2026 වසරේ මැයි මාසයේ ක්‍රියාත්මක කරන ලද මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමේ ක්‍රියාමාර්ග සහ රජය හා මහ බැංකුව විසින් ගන්නා ලද අනෙකුත් ප්‍රතිපත්තිමය පියවරයන්ගේ ප්‍රතිඵලයක් ලෙස, මතුපිට උද්ධමනය නුදුරු කාලීනව සියයට 5.0 ක ඉලක්කයට වඩා ඉහළ මට්ටමක පවතිනු ඇතැයි ද, ඉන්පසු ක්‍රමයෙන් අඩු වී මධ්‍ය කාලීනව එම ඉලක්කය වටා ස්ථාවර වනු ඇතැයි ද ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි. එසේ වුවද, මැදපෙරදිග පවතින අස්ථාවර තත්ත්වය සහ එය ගෝලීය හා දේශීය ආර්ථික ක්‍රියාකාරකම් වෙත ඇති කරන දීර්ඝ කාලීන බලපෑම් හමුවේ, දේශීය උද්ධමනයේ අපේක්ෂාවන් අතිශයින්ම අවිනිශ්චිතව පවතී.

1.3 මුදල් සහ ණය

ඉහළ යන උද්ධමන අපේක්ෂාවන් සහ උද්ධමනය පිළිබඳ අපේක්ෂාවන් පාලනයෙන් ගිලිහී යාමේ අවදානම සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව, 2026 වසර ආරම්භයේ දී සියයට 7.75 ක් වූ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (OPR), මැයි මාසයේ දී පදනම් අංක 100 කින් ඉහළ නංවමින් සියයට 8.75 දක්වා ඉහළ නංවන ලද අතර, ඒ හරහා මුදල් ප්‍රතිපත්තිය දැඩි කරන ලදී. ඒ අනුව, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට පදනම් අංක ± 50 ක ආන්තිකයක් මඟින් සම්බන්ධ කර ඇති නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පිළිවෙළින් සියයට 8.25 සහ සියයට 9.25 දක්වා වැඩි විය. එහි ප්‍රතිඵලයක් ලෙස, කෙටිකාලීන පොලී අනුපාත, 2026 වසරේ ජූනි වන විට සියයට 10.34 දක්වා ඉහළ ගිය බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR) වැනි ණය පොලී අනුපාත සහ අනෙකුත් ප්‍රධාන තැන්පතු හා ණය පොලී අනුපාත ඇතුළුව බොහෝ වෙළෙඳපොළ පොලී අනුපාත ඉහළ ගියේය.

2026 වසරේ ජනවාරි මස සිට ජූනි මස දක්වා කාල සීමාව තුළ ප්‍රාථමික වෙන්දේසිවල සියලුම කල්පිරීම්වලට අදාළ භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික ඉහළ ගිය අතර, ප්‍රාථමික සහ ද්විතීයික වෙළෙඳපොළ යන දෙකෙහිම දිගුකාලීන භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාතික ද ඉහළ ගියේය. දින 91 ක භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතිකය 2025 වසරේ අවසානයට සාපේක්ෂව පදනම් අංක 240 ක පමණ වැඩිවීමක් පෙන්නුම් කරමින් 2026 වසරේ ජූනි 24 වන විට සියයට 10.1 දක්වා ඉහළ ගියේය. 2026 වසරේ පළමු භාගය තුළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය (SRR) සියයට 2.0 ක් ලෙස නොවෙනස්ව පැවතුනි. කෙසේ වෙතත්, සංචිත කළමනාකරණය ශක්තිමත් කිරීම සහ මුදල් මෙහෙයුම්වල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා මහ බැංකුව විසින් 2026 අප්‍රේල් 01 වන දින සිට ව්‍යවස්ථාපිත සංචිත අනුපාතික රාමුව සඳහා නව සංශෝධන හඳුන්වා දෙන ලදී. මේ සඳහා සංචිත වත්කමක් ලෙස කැට මුදල් හෙවත් කාසි හා නෝට්ටු පිළිගැනීම අදියර වශයෙන් අඩු කිරීම, සති දෙකක සංචිත පවත්වාගෙන යාමේ කාල සීමාවක්, සියයට 75 ක අවම දෛනික සංචිත පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් සහ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමඟ සම්බන්ධ කරන ලද සංශෝධිත දඩ ක්‍රමවේදයක් ඇතුළත් වේ.

1.2 වගුව | සංචිත මුදල්, පුළුල් මුදල් හා වාණිජ බැංකු විසින් පුද්ගලික අංශයට ලබා දුන් ණය

රු. බිලියන

අයිතමය	2025						2026						
	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	2026 ජූනි/2025 ජූනි වර්ධනය (%)
සංචිත මුදල්	1,567.0	1,589.6	1,668.6	1,677.7	1,651.1	1,660.1	1,789.7	1,848.8	1,970.0	1,939.2	1,917.6	1,889.1	13.8
පුළුල් මුදල්	14,439.1	14,543.8	14,777.7	14,931.9	14,965.5	15,175.8	16,069.0	16,276.3	16,585.7	16,660.4	16,761.4	16,918.0	11.5
පුද්ගලික අංශයට ලබා දුන් ණය	8,151.4	8,256.9	8,414.6	8,501.6	8,634.6	8,856.1	10,294.8	10,439.1	10,697.5	10,798.1	11,036.0	11,281.5	27.4

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

පෞද්ගලික අංශයේ ණයෙහි ප්‍රසාරණය හේතුවෙන්, පුළුල් මුදල් සැපයුම (M2b) 2026 වසරේ ජනවාරි මස අවසානයේ දී පැවති රු. බිලියන 16,069.0 ක සිට 2026 වසරේ ජූනි මස අවසානය වන විට රු. බිලියන 16,918.0 ක් දක්වා සියයට 5.3 කින් වර්ධනය විය. පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2026 වසරේ ජනවාරි මස අවසානයේ දී පැවති රු. බිලියන 10,294.8 ක සිට 2026 වසරේ ජූනි මස අවසානය වන විට රු. බිලියන 11,281.5 ක් දක්වා වර්ධනය විය. බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2026 වසරේ ජූනි මස අවසානය වන විට පෙර වසරට සාපේක්ෂව ආසන්න වශයෙන් සියයට 27.4 ක වර්ධනයක් වාර්තා කරන ලදී. ශුද්ධ විදේශීය වත්කම් 2026 වසරේ ජනවාරි මස ආරම්භයේ දී පැවති රු. බිලියන 1,066.8 ක සිට 2026 වසරේ ජූනි මස අවසානය වන විට රු. බිලියන 1,264.9 ක් දක්වා වර්ධනය වූ අතර, මේ සඳහා දේශීය වෙළෙඳපොළෙන් මහ බැංකුව විසින් විදේශ විනිමය මිලදී ගැනීම හේතු විය.

1.4 කොටස් වෙළෙඳපොළ

2026 වසරේ පළමු භාගය තුළ ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳපොළ සැලකිය යුතු විචල්‍යතාවයක් පෙන්නුම් කරන ලදී. සමස්ත වෙළෙඳපොළ කාර්යසාධනය පිළිබිඹු කරන සමස්ත කොටස් මිල දර්ශකය (ASPI, 1985=100), 2025 වසරේ ජූනි මස අවසානයේ දී වාර්තා වූ ඒකක 18,026.7 ට සාපේක්ෂව 2026 වසරේ ජූනි මස අවසානයේ දී සියයට 23.5 කින් වර්ධනය වෙමින් ඒකක 22,263.3 ක් දක්වා ඉහළ ගියේය. වඩාත්ම ද්‍රවශීල කොටස් නියෝජනය කරනු ලබන ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් ශ්‍රී ලංකා 20 දර්ශකය (S&P SL20, 2004=1,000) ද, 2025 වසරේ ජූනි මස අවසානයේ දී වාර්තා වූ ඒකක 5,352.5 ක සිට 2026 වසරේ ජූනි මස අවසානයේ දී සියයට 15.9 කින් වර්ධනය වෙමින් ඒකක 6,205.1 ක් දක්වා වර්ධනය විය. 2026 වසරේ පළමු භාගය තුළ අඛණ්ඩ වෙළෙඳපොළ අස්ථාවරත්වයන් සහ ශුද්ධ විදේශීය ආයෝජන ගලායාම් පැවතුණද, ආයෝජක විශ්වාසය වැඩිදියුණු වීම සහ තෝරාගත් ලැයිස්තුගත කොටස් කෙරෙහි යොමු වූ ආයෝජකයන්ගේ උනන්දුව මෙම වර්ධනයට හේතු විය.

කොළඹ කොටස් හුවමාරුවෙහි වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය 2025 වසරේ ජූනි මස අග දී වාර්තා වූ රු. බිලියන 6,438.0 ට සාපේක්ෂව 2026 වසරේ ජූනි මස අග දී සියයට 25.3 කින් වර්ධනය වෙමින් රු. බිලියන 8,063.7 ක් දක්වා ඉහළ ගියේය. කොළඹ කොටස් හුවමාරුවෙහි සාමාන්‍ය දෛනික පිරිවැටුම, 2025 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ රු. මිලියන 4,085.5 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. මිලියන 4,468.2 ක් දක්වා සියයට 9.4 කින් වර්ධනය විය.

1.3 වගුව | ප්‍රාග්ධන වෙළඳපොළ සංචලනයන්

දර්ශකය	2022	2023	2024	2025	ජූනි අග වන විට	
					2025	2026
සමස්ත කොටස් මිල දර්ශකය (1985=100)	8,490	10,594	15,945	22,624	18,027	22,263
එස් ඇන්ඩ් පී. එස්. එල්. 20 දර්ශකය	2,636	3,010	4,862	6,157	5,353	6,205
වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන)	3,847	4,261	5,696	8,069	6,438	8,064
වෙළඳපොළ කටයුතු සිදු කරනු ලබන ලැයිස්තුගත සමාගම් ගණන	290	290	284	288	286	290
සාමාන්‍ය දෛනික පිරිවැටුම (රු. මිලියන)	2,972	1,697	2,240	7,844	4,085	4,468
විදේශ විකුණුම් (රු. මිලියන)	36,863	37,088	58,492	95,559	37,999	56,429
විදේශ මිලදී ගැනුම් (රු. මිලියන)	67,488	41,451	48,013	56,931	26,214	22,732
ශුද්ධ මිලදී ගැනුම් (රු. මිලියන)	30,625	4,363	-10,479	-38,628	-11,785	-33,697

මූලාශ්‍රය: කොළඹ කොටස් හුවමාරුව

1.5 විදේශ අංශයේ ප්‍රවණතා

2026 වසරේ පළමු භාගය තුළ ශ්‍රී ලංකාවේ විදේශ අංශය යළිත් වරක් පීඩනයකට ලක් විය. 2026 පෙබරවාරි මස අග සිට මැදපෙරදිග කලාපයේ ගැටුම් තියුණු ලෙස ඉහළ යාම ගෝලීය බොරතෙල් මිල ඉහළ යාමට හේතු වූ අතර, එය ක්‍රමයෙන් රටේ ආනයනික වියදම ඉහළ නංවන්නට හේතු විය. මීට අමතරව, මීට පෙර පනවන ලද ආනයනික සීමා ඉවත් කිරීමෙන් අනතුරුව වාහන ආනයන යළි ඉහළ යාමද මෙම තත්ත්වය තවත් තීව්‍ර කළේය. මෙම සාධකයන් ගේ එකතුව, විදෙස්ගත ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ ලැබීම්හි අඛණ්ඩ පැවැත්ම අභිබවා යමින්, වසර හතරකට පසු ප්‍රථම වතාවට ජංගම ගිණුම හිඟයක් කරා යොමු කර වීය.

1.4 වගුව | විදේශ වෙළඳාම: 2026 ජනවාරි - ජූනි

ඇ.ඩො. මිලියන

අයිතමය	2025	2026	වර්ධනය %
අපනයන	**6,492.1**	**6,903.2**	**6.3**
කෘෂිකාර්මික අපනයන	**1,427.5**	**1,450.4**	**1.6**
තේ	743.1	700.8	-5.7
රබර්	14.7	14.8	0.7
පොල්	248.7	288.2	15.9
අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන	421.0	446.6	6.1
කාර්මික අපනයන	**5,044.5**	**5,424.6**	**7.5**
ආහාරපාන සහ දුම්කොළ	407.6	461.0	13.1
රෙදිපිළි සහ ඇඟලුම්	2,605.8	2,451.0	-5.9
ඛනිජ තෙල් නිෂ්පාදන	465.3	720.8	54.9
රබර් නිෂ්පාදන	453.1	477.5	5.4
යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ	225.4	321.9	42.8
අනෙකුත් කාර්මික නිෂ්පාදන	887.3	992.4	11.8
ඛනිජ අපනයන	**10.1**	**18.2**	**79.5**
වර්ග නොකළ අපනයන	**9.9**	**10.1**	**1.4**
ආනයන	**9,762.2**	**12,392.3**	**26.9**
පාරිභෝගික භාණ්ඩ	**2,315.5**	**3,036.5**	**31.1**
අහාර හා පාන වර්ග	1,094.5	1,113.8	1.8
අනෙකුත් පාරිභෝගික භාණ්ඩ	1,221.0	1,922.7	57.5
අන්තර් භාණ්ඩ	**5,575.6**	**7,058.7**	**26.6**
ඛනිජ තෙල් නිෂ්පාදන	1,995.7	3,168.4	58.8
පොහොර	94.1	109.5	16.4
රෙදිපිළි සහ ඇඟලුම්	1,336.4	1,303.3	-2.5
රසායනික නිෂ්පාදන	488.6	575.5	17.8
ප්ලාස්ටික් සහ ඒ ආශ්‍රිත ද්‍රව්‍ය	298.3	340.6	14.2
අනෙතුත් අන්තර් භාණ්ඩ	1,364.5	1,561.4	14.4
ආයෝජන භාණ්ඩ	**1,862.6**	**2,284.0**	**22.6**
යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	1,208.0	1,422.8	17.8
ප්‍රවාහන උපකරණ	173.7	364.7	110.0
ගොඩනැගිලි ද්‍රව්‍ය	479.1	493.9	3.1
අනෙකුත් ආයෝජන භාණ්ඩ	1.9	2.6	38.1
වර්ග නොකළ ආනයන	**8.5**	**13.1**	**54.3**
වෙළඳ ශේෂය	**-3,270.1**	**-5,489.1**	

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

2026 වසරේ පළමු භාගය තුළ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ඇ. ඩො. මිලියන 4,604.8 ක් දක්වා සියයට 23.2 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, සංචාරක පැමිණීම් අඩු වී ඇත්තේ සියයට 1.8 කින් පමණක් වුවද, සංචාරක ඉපැයීම් සියයට 11.8 කින් ඇ. ඩො. මිලියන 1,511.1 ක් දක්වා පහත වැටුණි. සංචාරක පැමිණීම්වල අඩුවීමට සාපේක්ෂව ඉපැයීම් තියුණු ලෙස පහත වැටීම, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරක ඉපැයීම් ඇස්තමේන්තුගත කිරීම සඳහා හඳුන්වා දෙන ලද සංශෝධිත ක්‍රමවේදයේ බලපෑම අර්ධ වශයෙන් පිළිබිඹු කරන අතර, එයට සාමාන්‍ය දෛනික සංචාරක වියදම පහළ දැමීමක් ද ඇතුළත් වන බැවින් එය මෙම වසරේ සංචාරක ඉපැයීම් අගය 2025 වසරේ දත්ත සමඟ සංසන්දනය කිරීම සීමා කරයි. මැදපෙරදිග කලාපයේ ගැටුම නිසා ඇති වූ බාධා වීම් මධ්‍යයේ, දිගු කලක් සංචාරකයින් රට තුළ රැඳී සිටින යුරෝපා වෙළඳපළවලින් සංචාරක පැමිණීම් අඩුවීමද අඩු ඉපැයීම් සඳහා බලපෑවේය.

අපනයන ඉපැයීම් ඇ. ඩො. මිලියන 6,903.2 ක් දක්වා සියයට 6.3 කින් ඉහළ යාමත්, ආනයන වියදම ඇ. ඩො. මිලියන 12,392.3 ක් දක්වා සියයට 26.9 කින් ඉහළ යාමත් හේතුවෙන් වෙළඳ හිඟය ඇ. ඩො. මිලියන 5,489.1 ක් දක්වා පුළුල් විය. 2025 වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව අපනයන මිල ගණන් වලට වඩා ආනයන මිල ගණන් වේගයෙන් ඉහළ යාම නිසා වෙළඳ මිල අනුපාතය පහළ වැටුනි. 2026 වසරේ ජූනි මස අවසන් වන විට දළ නිල සංචිත ඇ. ඩො. බිලියන 6.5 ක් ලෙස පැවති අතර, එය මාස 3.2 ක ආනයන ආවරණයක් සැපයීය.

ජංගම ගිණුම 2025 වසරේ පළමු භාගය තුළ වාර්තා කළ ඇ. ඩො. මිලියන 1,444.4 ක අතිරික්තයට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ. ඩො. මිලියන 245.4 ක හිඟයක් වාර්තා කළේය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පුළුල් වූ වෙළඳ හිඟය සහ ඇ. ඩො. මිලියන 1,598.7 ක් දක්වා සියයට

22.4 කින් අඩුවෙමින් සේවා ගිණුමේ අතිරික්තයේ සිදු වූ මධ්‍යස්ථ වීමයි.

කොළඹ කොටස් හුවමාරුවෙහි 2025 වසරේ පළමු භාගය තුළ වාර්තා වූ ඇ. ඩො. මිලියන 39.2 ක ශුද්ධ ගලා යාමට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ශුද්ධ ගලා යාම ඇ. ඩො. මිලියන 101.1 ක් විය. රජයේ සුරැකුම්පත් වෙළඳපොළහි 2025 වසරේ පළමු භාගය තුළ ඇ. ඩො. මිලියන 90.1 ක ශුද්ධ ගලා ඒමක් වාර්තා කළ අතර, 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ. ඩො. මිලියන 21.8 ක ශුද්ධ ගලා යාමක් වාර්තා කළේය. මෙම තත්වයන් මධ්‍යයේ වුවද, සමස්ත ගෙවුම් ශේෂය 2025 වසරේ පළමු භාගය තුළ වාර්තා කළ ඇ. ඩො. මිලියන 522 ක අතිරික්තයට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ. ඩො. මිලියන 136 ක අතිරික්තයක් වාර්තා කළේය. 2026 වසරේ ජූනි මස අවසන් වන විට වසරේ මුල සිට මේ දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව සියයට 7.9 කින් අවප්‍රමාණය විය.

අපනයන

අපනයන ආදායම 2025 වසරේ පළමු භාගයේ දී වූ ඇ.ඩො මිලියන 6,492.1 ට සාපේක්ෂව 2026 වසරේ දී ඇ. ඩො. මිලියන 6,903.2 දක්වා සියයට 6.3 කින් වැඩි විය. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ, ගෝලීය ඉන්ධන මිල ඉහළ යාම හමුවේ පෙට්‍රෝලියම් නිෂ්පාදන අපනයන ආදායම ඉහළ යාම වන අතර, යන්ත්‍ර සූත්‍ර, ආහාර හා පාන වර්ග සහ කෘෂිකාර්මික ද්‍රව්‍ය අපනයනයෙන් ලැබෙන ආදායමේ වර්ධනය ද ඊට දායක වීමෙන්, රෙදිපිළි හා ඇඟලුම් සහ තේ අපනයන ඉපයීම්හි පහත වැටීම අභිබවා යමින් සමස්ත ආදායම ඉහළ නංවා ගැනීමට හැකි විය. කාර්මික අපනයන මුළු අපනයන ඉපැයීම් වලින් සියයට 78.6 ක් වූ අතර, කෘෂිකාර්මික සහ ඛනිජ අපනයන පිළිවෙළින් සියයට 21.0 ක් සහ සියයට 0.2 ක් විය.

කාර්මික අපනයන වලින් ලැබුණු ආදායම 2025 වසරේ පළමු භාගයේ දී වූ ඇ. ඩො. මිලියන 5,044.5 සිට 2026 වසරේ සමාන කාලපරිඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 5,424.6 ක් දක්වා සියයට 7.5 කින් ඉහළ ගොස් ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, පෙට්‍රෝලියම් නිෂ්පාදන ඇ. ඩො. මිලියන 720.8 ක් දක්වා සියයට 54.9 කින් වැඩි වීමත් ; යන්ත්‍ර සූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ ඇ. ඩො. මිලියන 321.9 ක් දක්වා සියයට 42.8 කින් වැඩි වීමත්; සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ ඇ. ඩො. මිලියන 461.0 ක් දක්වා සියයට 13.1 කින් වර්ධනය වීමත් ය. කෙසේ වෙතත්, විශාලතම කාර්මික අපනයන කාණ්ඩය වන රෙදිපිළි සහ ඇඟලුම්වලින් ලද ඉපැයීම් විදේශ ඉල්ලුම අඩුවීම හේතුවෙන්, 2025 වසරේ පළමු භාගයේ දී වූ ඇ. ඩො. මිලියන 2,605.8 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ඇ. ඩො. මිලියන 2,451.0 දක්වා සියයට 5.9 කින් පහත වැටුණි. පොල් සහ මුහුදු ආහාරවල ඉපැයීම් වැඩිවීම තේ අපනයන ඉපයීම් අඩු වීම අභිබවා යෑමත් සමඟ කෘෂිකාර්මික අපනයනවලින් ලැබුණු ඉපැයීම් 2025 වසරේ පළමු භාගයේ දී වූ ඇ. ඩො. මිලියන 1,427.5 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ඇ. ඩො. මිලියන 1,450.4 දක්වා සියයට 1.6 කින් වැඩි විය. පොල් අපනයන ඉපැයීම් ඇ. ඩො. මිලියන 288.2 දක්වා සියයට 15.9 කින් සැලකිය යුතු ලෙස ලෙස වැඩි වූ අතර, මුහුදු ආහාර ඉපැයීම් ඇ. ඩො. මිලියන 122.5 දක්වා සියයට 17.6 කින් වර්ධනය විය. කෙසේ වෙතත්, විශාලතම කෘෂිකාර්මික අපනයන කාණ්ඩය වන තේ අපනයනවලින් ලැබුණු ඉපැයීම්, අපනයන ප්‍රමාණය අඩුවීම සහ වෙන්දේසි මිල ගණන් මධ්‍යස්ථ වීම හේතුවෙන්, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වූ ඇ. ඩො. මිලියන 743.1 සිට ඇ. ඩො. මිලියන 700.8 දක්වා සියයට 5.7 කින් පහත වැටුණි. මේ අතර, ඛනිජ අපනයන ඉපැයීම් ඇ. ඩො මිලියන 18.2 දක්වා සියයට 79.5 කින් සැලකිය යුතු ලෙස වැඩි වූ අතර, වර්ගීකරණය නොකළ අපනයන ඉපැයීම් ඇ. ඩො. මිලියන 10.1 දක්වා සියයට 1.4 කින් වැඩි විය.

ආනයන

ආනයන වියදම 2025 වසරේ පළමු භාගයේ දී වූ ඇ.ඩො මිලියන 9,762.2 සිට 2026 වසරේ සමාන කාලපරිඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 12,392.3 ක් දක්වා සියයට 26.9 කින් වර්ධනය විය. මෙම වැඩිවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ, මැදපෙරදිග ගැටුම් මධ්‍යයේ ගෝලීය ඉන්ධන මිල ඉහළ යාම සහ පෞද්ගලික වාහන ආනයනවල සැලකිය යුතු වර්ධනයක් නැවත ඇති වීමත් හේතුවෙන් සියලුම ප්‍රධාන කාණ්ඩයන්හි ආනයන වියදම ඉහළ යාමයි. මුළු ආනයන වියදමෙන් අතරමැදි භාණ්ඩ, පාරිභෝගික භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ පිළිවෙලින් සියයට 57.0 ක්, සියයට 24.5 ක් සහ සියයට 18.4 ක් විය.

ප්‍රධාන වශයෙන් ඉන්ධන ආනයන වියදමේ සිදු වූ සැලකිය යුතු ඉහළ යාම හේතුවෙන්, අතරමැදි භාණ්ඩ ආනයන වියදම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ පැවති ඇ. ඩො. මිලියන 5,575.6 සිට ඇ. ඩො. මිලියන 7,058.7 දක්වා සියයට 26.6 කින් ඉහළ ගියේය. පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයනය ඇ. ඩො. මිලියන 2,538.6 ක් දක්වා සියයට 78.7 කින් ඉහළ යාම ද, බොර තෙල් ආනයනය ඇ. ඩො. මිලියන 479.5 ක් දක්වා සියයට 7.5 කින් ඉහළ යාම ද, ගල් අඟුරු ආනයනය ඇ. ඩො. මිලියන 150.4 ක් දක්වා සියයට 16.1 කින් ඉහළ යාම ද හේතුවෙන්, ඉන්ධන ආනයනය ඇ. ඩො. මිලියන 3,168.4 ක් දක්වා සියයට 58.8 කින් වර්ධනය විය. කෙසේ වෙතත්, මාසික ඉන්ධන ආනයන වියදම 2026 වසරේ අප්‍රේල් මාසයේදී ඇ. ඩො. මිලියන 886 ක්ව පැවත 2026 මැයි මාසයේදී ඇ. ඩො. මිලියන 536 ක් දක්වා අඩු වූ අතර, 2026 ජූනි මාසයේදී තවදුරටත් ඇ. ඩො. මිලියන 465 ක් දක්වා අඩු විය. මේ අතර, රෙදිපිළි සහ රෙදිපිළි ආශ්‍රිත භාණ්ඩ ආනයනය සඳහා වූ වියදම

ඇ. ඩො. මිලියන 1,303.3 ක් දක්වා සියයට 2.5 කින් අඩු වූ අතර, රසායනික නිෂ්පාදන ආනයනය ඇ. ඩො. මිලියන 575.5 ක් දක්වා සියයට 17.8 කින් වැඩි විය.

පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ පැවති ඇ. ඩො. මිලියන 2,315.5 සිට ඇ. ඩො. මිලියන 3,036.5 දක්වා සියයට 31.1 කින් තියුණු ලෙස ඉහළ ගියේය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ සඳහා වන වියදම ඇ. ඩො. මිලියන 1,922.7 ක් දක්වා සියයට 57.5 කින් වර්ධනය වීමයි. පෞද්ගලික වාහන ආනයනයේ සැලකිය යුතු යළි ඉහළ යාම මෙයට හේතු වූ අතර, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ. ඩො. මිලියන 360.5 ක්ව පැවති මෙම අගය ඇ. ඩො. මිලියන 972.2 ක් දක්වා සියයට 169.7 කින් වර්ධනය විය. ආහාර සහ පාන වර්ග ආනයනය සඳහා වූ වියදම ඇ. ඩො. මිලියන 1,113.8 ක් දක්වා සියයට 1.8 කින් සුළු වශයෙන් වර්ධනය විය.

ආයෝජන භාණ්ඩ සඳහා වන ආනයන වියදම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ පැවති ඇ. ඩො. මිලියන 1,862.6 සිට ඇ. ඩො. මිලියන 2,284.0 දක්වා සියයට 22.6 කින් ඉහළ ගොස් ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ප්‍රවාහන උපකරණ ආනයනය ඇ. ඩො. මිලියන 364.7 ක් දක්වා සියයට 110.0 කින් වර්ධනය වීම වන අතර, එයින් වාණිජ කටයුතු සඳහා යොදා ගන්නා වාහන ආනයනය ඇ. ඩො. මිලියන 281.6 ක් දක්වා සියයට 146.0 කින් වැඩි විය. යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සඳහා වන ආනයන වියදම ඇ. ඩො. මිලියන 1,422.8 ක් දක්වා සියයට 17.8 කින් ඉහළ ගිය අතර, ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා වන වියදම ඇ. ඩො. මිලියන 493.9 ක් දක්වා සියයට 3.1 කින් වර්ධනය විය.

1.5 වගුව | ලෝක තත්ත්වය - 2025

රට	2025				
	ද.දේ.නි. වර්ධනය (වාර්ෂික ප්‍රතිශතික වෙනස)[අ]	උද්ධමනය (ප්‍රතිශතය)[අ]	සේවා වියුක්තිය (ප්‍රතිශතය)[ආ]	රාජ්‍ය මූල්‍ය ශේෂය (ද.දේ.නි ප්‍රතිශතයක් ලෙස) [ආ]	දළ ණය (ද.දේ.නි ප්‍රතිශතයක් ලෙස)[ආ]
ආර්ජන්ටිනාව	4.5	41.9	7.4	-1.1	80.3
ඔස්ට්‍රේලියාව	2.0	2.8	4.2	-2.6	51.0
බ්‍රසීලය	2.3	5.0	6.0	-3.0	93.3
කැනඩාව	1.9	2.1	6.9	-0.9	113.5
චිලී	2.5	4.2	8.5	-2.3	41.8
චීනය	5.0	0.0	5.1	3.7	99.2
ප්‍රංශය	0.9	0.9	7.6	-0.4	116.0
ජර්මනිය	0.2	2.3	3.8	4.4	62.9
ග්‍රීසිය	2.1	2.9	8.9	-5.7	145.7
ඉන්දියාව	7.8	2.0	4.9	-0.9	84.1
ඉන්දුනීසියාව	5.1	1.9	4.9	-0.1	41.0
ඉතාලිය	0.5	1.6	6.1	1.2	137.1
ජපානය	1.2	3.2	2.5	4.8	206.5
කොරියාව	1.1	2.1	2.8	6.6	52.3
මැලේසියාව	5.2	1.4	3.0	1.6	70.7
මෙක්සිකෝව	0.5	3.8	2.6	-0.4	61.8
රුසියාව	1.0	8.7	2.2	1.6	17.2
සිංගප්පූරුව	5.0	0.9	2.0	16.7	171.3
දකුණු අප්‍රිකාව	1.1	3.2	32.4	-0.5	78.6
ස්පාඤ්ඤය	2.6	2.7	10.5	2.9	100.4
ශ්‍රී ලංකාව	5.0	-0.5	3.9	-2.3	91.6
තායිලන්තය	2.4	-0.1	1.0	3.1	64.7
එක්සත් රාජධානිය	1.2	3.4	4.9	-3.1	102.3
එක්සත් ජනපදය	2.3	2.7	4.3	-3.6	123.9
වියට්නාමය	8.0	3.3	2.2	6.7	30.3
වෙනිසියුලාව	9.0	252.0	…	2.6	308.7

මූලාශ්‍ර : [අ]ලෝක ආර්ථික විශ්ලේෂණය, ජා.මු.අ. ඔක්තෝබර් 2026, [ආ]ලෝක ආර්ථික විශ්ලේෂණය, ජා.මු.අ. අප්‍රේල් 2026, Fiscal Monitor, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අප්‍රේල් 2026, වාර්ෂික වාර්තාව 2025 - මුදල් අමාත්‍යාංශය

… ලැ.නො.

සේවක ප්‍රේෂණ සහ සංචාරක අංශයේ ඉපැයීම්

සේවක ප්‍රේෂණ 2025 වසරේ පළමු භාගය තුළ වූ ඇ. ඩො. මිලියන 3,738.0 ක සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ඇ. ඩො. මිලියන 4,604.8 ක් දක්වා සියයට 23.2 කින් වර්ධනය වූ අතර, දිවිවා සුළි කුණාටුවෙන් පසුව ආපදා සහන සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා යොමු කෙරුණු ප්‍රේෂණ හා සම්බන්ධ අරමුදල් ලැබීම ද මෙම වර්ධනයට අර්ධ වශයෙන් හේතු වී ඇත. සංචාරක පැමිණීම් 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ පුද්ගලයින් 1,168,044 ට සාපේක්ෂව පුද්ගලයින් 1,146,573 ක් දක්වා සියයට 1.8 කින් සුළු වශයෙන් අඩු වූ අතර, සංචාරක කර්මාන්තයෙන් ලැබෙන ආදායම ද ඇ. ඩො. මිලියන 1,712.6 සිට ඇ. ඩො. මිලියන 1,511.1 ක් දක්වා සියයට 11.8 කින් අඩු විය. සංචාරකයින්ගේ පැමිණීමට සාපේක්ෂව ඉපැයීම්වල වඩාත් තියුණු පහත වැටීමක් දක්නට ලැබීමට සංචාරක ඉපැයීම් ඇස්තමේන්තු කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් අනුගමනය කරන ලද සංශෝධිත ක්‍රමවේදය අර්ධ වශයෙන් හේතු වූ අතර මැදපෙරදිග පවතින ගැටුම්කාරී තත්ත්වය මධ්‍යයේ, දිගු කාලයක් මෙරට රැඳී සිටින යුරෝපීය වෙළඳපොළවල් වලින් පැමිණෙන සංචාරකයින් සංඛ්‍යාවේ සිදුවූ අඩුවීම ද මෙයට හේතු විය. 2026 වසරේ පළමු භාගය තුළ සංචාරකයින් පැමිණි ප්‍රධාන මූලාශ්‍ර වෙළඳපොළවල් වූයේ ඉන්දියාව, එක්සත් රාජධානිය, රුසියානු සමූහාණ්ඩුව, චීනය, ජර්මනිය සහ ඕස්ට්‍රේලියාවයි.

1.6 ගෝලීය ආර්ථික ප්‍රවණතා[1]

මැදපෙරදිග අඛණ්ඩව පවතින ගැටුම් සහ පවතින වෙළෙඳ ආතතීන් මධ්‍යයේ වුවද, 2026 වසරේදී ගෝලීය ආර්ථික තත්ත්වයන් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කළේය. ඉහළ බලශක්ති මිල ගණන් සහ ගැටුම් හේතුවෙන් සැපයුම් දාම වෙත ඇති වූ බාධා ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි අහිතකරව බලපෑ නමුත්, කෘත්‍රිම බුද්ධිය සඳහා වූ ශක්තිමත් ආයෝජන සහ තාක්ෂණය සම්බන්ධ අපනයන මඟින් එම අහිතකර බලපෑම සැලකිය යුතු ලෙස සමනය කෙරිණි. එහි ප්‍රතිඵලයක් ලෙස, තාක්ෂණ අගය එකතු කිරීමේ දාමයට සම්බන්ධ ආර්ථිකයන් හෝ ඉහළ බලශක්ති මිල ගණන්වලින් ප්‍රතිලාභ ලබන ආර්ථිකයන්, බලශක්ති ආනයනය කරන ආර්ථිකයන්ට වඩා හොඳ ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කිරීමත් සමඟ, රටවල් අතර ආර්ථික වර්ධනය වඩාත් අසමාන බවට පත් විය.

මැදපෙරදිග ගැටුමේ තාවකාලික සටන් විරාමය අවසන් වීමෙන් පසු බලශක්ති මිල ගණන් ඉහළ යාමත් සමඟ, 2026 වසරේ අගෝස්තු මාසයේදී ගෝලීය මතුපිට උද්ධමනය නැවතත් ඉහළ ගියේය. ගැටුම පැවති මුල් මාසවලදී තෙල් මිල ගණන් ආසන්න වශයෙන් දෙගුණයක් දක්වා ඉහළ ගිය අතර, පසුව යුද්ධයට පෙර පැවති මට්ටම්වලට වඩා සියයට 20 ත් 40 ත් අතර ප්‍රමාණයකින් ඉහළ මට්ටමක තෙල් මිල ස්ථාවර විය. තාක්ෂණය හා සම්බන්ධ වෙළෙඳ ප්‍රවාහයන් අඛණ්ඩව ශක්තිමත්ව වර්ධනය වූවද, ප්‍රධාන වශයෙන් තීරුබදු සහ වෙළෙඳ සබඳතාවල ක්‍රමික වෙනස්වීම් හේතුවෙන්, ගෝලීය වෙළෙඳ වර්ධනය 2025 වසරේ වාර්තා වූ වේගයට වඩා මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පෙර පැවති මට්ටම්වලට අනුව මූල්‍ය තත්ත්වයන් පුළුල් ලෙස සහනශීලී මට්ටමක පැවතුණද, ප්‍රධාන වශයෙන් ශක්තිමත් කොටස් වෙළෙඳපොළ තක්සේරු අගයන් මඟින් එය පිළිබිඹු වූ අතර, උද්ධමනය නැවත ඉහළ යාම සහ රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය පිළිබඳ ගැටලු හේතුවෙන් බොහෝ ආර්ථිකයන්හි රජයේ බැඳුම්කර එලදා අනුපාත ඉහළ ගියේය.

ගෝලීය වර්ධනය

ගෝලීය වර්ධනය 2025 වසරේදී සියයට 3.5 ක් ලෙස ඇස්තමේන්තු කර තිබූ අතර 2026 වසරේදී එය සියයට 3.1 දක්වා මධ්‍යස්ථ වනු ඇතැයි පුරෝකථනය කෙරේ. තාක්ෂණය සම්බන්ධ ක්‍රියාකාරකම් මඟින් සහාය නොලැබුනහොත්, ඉහළ බලශක්ති මිල ගණන් ශුද්ධ බලශක්ති ආනයනකරුවන් කෙරෙහි පීඩනයක් ඇති කරන බැවින්, දියුණු ආර්ථිකයන්හි වර්ධනය 2026 වසරේදී සියයට 2.1 දක්වා සුළු වශයෙන් ඉහළ යනු ඇතැයි පුරෝකථනය කෙරේ. ශක්තිමත් පෞද්ගලික පරිභෝජනය, හිතකර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය, සහනශීලී මූල්‍ය තත්ත්වයන් සහ තාක්ෂණ අංශයට සිදු කරනු ලබන අඛණ්ඩ ආයෝජන හේතුවෙන් ඇමෙරිකා එක්සත් ජනපද ආර්ථිකය සියයට 2.3 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එරට ශුද්ධ බලශක්ති අපනයනකරුවෙකු වන බැවින් ගැටුම මඟින් එරටට ඇති වන සෘජු බලපෑම සීමිත වේ.

මේ අතර, ඉහළ බලශක්ති පිරිවැය සහ දුර්වල පාරිභෝගික විශ්වාසය අඛණ්ඩව ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි අහිතකර ලෙස බලපාන බැවින්, යුරෝ කලාපයේ වර්ධනය 2026 වසරේදී සියයට 1.1 ක් වනු ඇතැයි පුරෝකථනය කෙරේ. රාජ්‍ය මූල්‍ය සහය සලසන ක්‍රියාමාර්ග මඟින් යම් පමණකට පමණක් සමනය කෙරුණු ඉහළ බලශක්ති මිල ගණන් මඟින් ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි ඇති කරන අහිතකර බලපෑම හේතුවෙන් ජපානයේ ආර්ථික වර්ධනය 2026 වසරේදී සියයට 0.7 දක්වා මන්දගාමී වනු ඇතැයි පුරෝකථනය කෙරේ.

නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි වර්ධනය 2025 වසරේ පැවති සියයට 4.5 සිට 2026 වසරේදී සියයට 3.7 දක්වා මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉහළ බලශක්ති පිරිවැය මෙන්ම දුර්වල සංචාරක අංශය හා සේවක ප්‍රේෂණ හේතුවෙන් සංවර්ධනය වෙමින් පවතින කුඩා දූපත් රාජ්‍යයන් මන්දගාමී වර්ධනයක් අත්විඳිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉහළ ගෝලීය තෙල් මිල ගණන්,

[1] World Economic Outlook (2026 ඔක්තෝබර්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල) මත පදනම්ව ඇත.

දීර්ඝ කාලීන අවිනිශ්චිතතාවයන් සහ ව්‍යුහාත්මක අභියෝග ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි බලපාන බැවින්, චීනයේ වර්ධනය 2026 වසරේදී සියයට 4.5 දක්වා මන්දගාමී වනු ඇතැයි පුරෝකථනය කෙරේ. ශක්තිමත් දේශීය ඉල්ලුම සහ සේවා ක්‍රියාකාරකම් හේතුවෙන් ඉන්දියාව 2026 වසරේදී සියයට 7.0 කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කෙරෙන අතර, එය වේගයෙන්ම වර්ධනය වන ප්‍රධාන ආර්ථිකයන් අතර අඛණ්ඩව රැඳී පවතී. තාක්ෂණ අංශයේ ගෝලීය අගය එකතු කිරීමේ දාමයට මනාව බද්ධවීමෙන් ප්‍රතිලාභ ලබන මැලේසියාව, තායිලන්තය සහ වියට්නාමය 2026 වසරේදී පිළිවෙලින් සියයට 5.2 කින්, සියයට 2.1 කින් සහ සියයට 8.4 කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කෙරේ. හෝමුස් සමුද්‍ර සන්ධිය නැවත විවෘත කිරීම 2027 වසරේ මාර්තු මාසයේදී ආරම්භ වන අතර, 2027 වසරේ ඔක්තෝබර් මාසය වන විට තත්ත්වයන් ගැටුමට පෙර පැවති මට්ටම් කරා පුළුල් වශයෙන් නැවත පැමිණේ යන උපකල්පනය මත, ගෝලීය වර්ධනය 2027 වසරේදී සියයට 3.4 දක්වා යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

උද්ධමනය

ප්‍රධාන වශයෙන් මැද පෙරදිග ගැටුම හේතුවෙන් ඇති වූ සැපයුම් කම්පනය හේතුවෙන්, ගෝලීය උද්ධමනයේ පැවති අඛණ්ඩ පහත වැටීම නතර කරමින්, 2026 වසරේදී උද්ධමන පීඩනයන් නැවත ඉස්මතු විය. ප්‍රධාන වශයෙන් ඉහළ බලශක්ති සහ ආහාර මිල ගණන් හේතුවෙන්, ගෝලීය මතුපිට උද්ධමනය 2025 වසරේ පැවති සියයට 4.1 සිට 2026 වසරේදී සියයට 4.7 දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කෙරේ. බොහෝ රටවල මූලික උද්ධමනය මධ්‍යස්ථ මට්ටමක පැවතුණද,

1.6 වගුව | ජාත්‍යන්තර භාණ්ඩ මිල ගණන්

		සත්‍ය		පුරෝකථනය	
		2024	2025	2026	2027
බලශක්ති					
ගල් අඟුරු, ඔස්ට්‍රේලියාව	මෙ.ටො/ඩොලර්	136.1	108.4	130.0	115.0
බොරතෙල්, බ්‍රෙන්ට්	බැරලයට ඩොලර්	80.7	69.0	86.0	70.0
ස්වාභාවික වායු, එක්සත් ජනපදය	මෙට්‍රික් බ්‍රිතාන්‍යය තාප ඒකක මිලියනයට ඩොලර්	2.2	3.5	3.8	4.0
බලශක්ති නොවන					
කෘෂිකාර්මික					
පාන වර්ග					
කොකෝවා	කිලෝග්‍රෑමයට ඩොලර්	7.33	7.80	3.80	4.20
කෝපි, රොබොස්ටා	කිලෝග්‍රෑමයට ඩොලර්	4.41	4.86	4.00	3.90
තේ	කිලෝග්‍රෑමයට ඩොලර්	3.04	2.91	2.85	3.00
ආහාර					
මේද සහ තෙල්					
පාම් තෙල්	මෙ.ටො/ඩොලර්	963	1,007	1,089	1,096
සෝයා පිටි	මෙ.ටො/ඩොලර්	442	366	359	363
සෝයා බෝංචි	මෙ.ටො/ඩොලර්	462	414	441	446
ධාන්‍ය					
බඩඉරිඟු	මෙ.ටො/ඩොලර්	191	203	211	214
සහල්	මෙ.ටො/ඩොලර්	588	408	401	413
තිරිඟු	මෙ.ටො/ඩොලර්	269	243	253	260
අනෙකුත් ආහාර					
සීනි	කිලෝග්‍රෑමයට ඩොලර්	0.45	0.37	0.35	0.34
අමුද්‍රව්‍ය					
කපු	කිලෝග්‍රෑමයට ඩොලර්	1.91	1.71	1.65	1.75
රබර්	කිලෝග්‍රෑමයට ඩොලර්	1.75	1.77	1.90	1.95
ඉරූ දැව,අරටු සහිත ලී	ඝන මීටරයට ඩොලර්	697	718	725	730
ලෝහ සහ ඛනිජ වර්ග					
ඇලුමිනියම්	මෙ.ටො/ඩොලර්	2,419	2,632	3,200	3,000
තඹ	මෙ.ටො/ඩොලර්	9,142	9,947	12,000	11,000
නිකල්	මෙ.ටො/ඩොලර්	16,814	15,162	17,000	17,500

මූලාශ්‍රය : ලෝක බැංකු භාණ්ඩ මිල දත්ත (The Pink Sheet) - 2026 ජූනි

දියුණු ආර්ථිකයන්හි ඇතැම් මූලික භාණ්ඩවල මිල ගණන් මඟින් ශීඝ්‍රයෙන් ඉහළ යන දත්ත ගබඩා කිරීමේ උපාංගයන්හි (memory chips) පිරිවැය පිළිබිඹු කිරීමට පටන් ගත් අතර, සංචාරක සේවා මිල ගණන් යළි ඉහළ යාම හේතුවෙන් එක්සත් ජනපදයේ මූලික උද්ධමනය ඉහළ ගියේය. විනිමය අනුපාතික සම්ප්‍රේෂණයේ වෙනස්කම්, සේවා උද්ධමනය අඛණ්ඩව පැවතීම, ශ්‍රම වෙළෙඳපොළ තත්ත්වයන්, ප්‍රතිපත්ති විශ්වසනීයත්වය සහ පරිපාලනය කරන ලද මිලකරණ ක්‍රමවේද හේතුවෙන් රටවල් අතර උද්ධමනය අසමාන ලෙස පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රධාන ආර්ථිකයන්හි මූලික උද්ධමනය සියයට 2 ක මට්ටම කරා නැවත ළඟා වනු ඇත්තේ ක්‍රමිකව පමණක් බව පුරෝකථනය කෙරෙන අතර, ජපානය සහ එක්සත් රාජධානිය 2027 වසර අවසාන වන විටද, යුරෝ කලාපය සහ එක්සත් ජනපදය 2028 වසර මැද භාගය වන විටද එම මට්ටමට ළඟා වනු ඇත.

හෝර්මුස් සමුද්‍ර සන්ධිය නැවත විවෘත කිරීම උපකල්පනය කළ පරිදි සිදු වීම මත පදනම්ව, ගෝලීය මතුපිට උද්ධමනය 2026 වසරේ පවතින සියයට 4.7 සිට 2027 වසරේදී සියයට 4.1 දක්වා පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කෙරේ. 2026 වසරේදී දියුණු ආර්ථිකයන්හි උද්ධමනය සියයට 3.1 ක් ලෙසද, නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි උද්ධමනය සියයට 5.7 ක් ලෙසද පුරෝකථනය කෙරේ. පාරිභෝගික භාණ්ඩ මිල ගණන් දීර්ඝ කාලයක් පුරා ඉහළ සහ වඩාත් විචලනය වන මට්ටමක පැවතීමට හේතු විය හැකි, මැද පෙරදිග හෝ යුක්‍රේනයේ ගැටුම් දීර්ඝ කාලයක් පුරා නොවිසඳී පැවතීම හෝ තවදුරටත් උග්‍රවීම මෙන්ම, ආහාර මිල ගණන් ඉහළ නැංවිය හැකි, දැනට පවතින එල් නිනෝ තත්ත්වයට සම්බන්ධ අහිතකර කාලගුණ සිදුවීම් උද්ධමන ඉදිරිදැක්මට ඇති අවදානම් අතරට ඇතුළත් වේ.

පාරිභෝගික භාණ්ඩ වෙළෙඳපොළ

2025 වසරේදී වාර්තා වූ තෙල් මිල පහත වැටීමේ තත්වය ආපසු හරවමින්, 2026 වසරේදී පාරිභෝගික භාණ්ඩ මිල ගණන් ශීඝ්‍රයෙන් ඉහළ ගියේය. මෙම වසර සඳහා ඛනිජ තෙල්වල සාමාන්‍ය ලක්ෂමය මිල බැරලයකට ඇ.ඩො. 96 ක් පමණ ලෙස පුරෝකථනය කෙරෙන අතර, එය 2025 වසරට වඩා සියයට 41.3 ක ඉහළ යාමකි. හෝර්මුස් සමුද්‍ර සන්ධිය හරහා සිදු කෙරෙන ප්‍රවාහනයන්ට ඇති වූ බාධාවන් මෙයට හේතු වී ඇති අතර, ගල්ෆ් කලාපයෙන් පිටත ඉහළ ගිය නිෂ්පාදනය සහ ගෝලීය තොග භාවිතය මඟින් එම බාධාවන්ගේ බලපෑම යම් දුරකට පමණක් සමනය වී ඇත. 2026 වසරේ මාර්තු මස අගදී තෙල් මිල බැරලයකට ඇ.ඩො. 126 ක උපරිම මට්ටමකට ළඟා වූ අතර, ජූනි මස මැදදී ඉරානය සහ එක්සත් ජනපදය අතර ඇති කරගත් අවබෝධතා ගිවිසුමකට පසුව කෙටි කලකට තෙල් මිල බැරලයකට ඇ.ඩො. 68 දක්වා පහත වැටුණි. කෙසේ වෙතත්, පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදනවල මිල ගණන් ගැටුමට පෙර පැවති මට්ටම්වලට වඩා සියයට 70 ත් 95 ත් අතර ප්‍රමාණයකින් ඉහළ මට්ටමක පැවතුණි. කටාර් රාජ්‍යයේ බලශක්ති යටිතල පහසුකම්වලට සිදු වූ හානිය සහ යුරෝපයේ පවතින අඩු ගෑස් තොග පිළිබිඹු කරමින්, යුරෝපයේ ස්වාභාවික ගෑස් මිල 2026 වසරේදී බ්‍රිතාන්‍ය තාප ඒකක මිලියනයකට ඇ.ඩො. 20 ක් ලෙස පුරෝකථනය කෙරෙන අතර, එය 2025 වසරට වඩා සියයට 48 ක ඉහළ යාමක් ද වන අතර, එක්සත් ජනපදයේ මිල ගණන් ගැටුමෙන් බලපෑමට ලක් නොවී පැවතුණි.

ඉහළ ගිය බලශක්ති සහ පොහොර පිරිවැය මෙන්ම වඩාත් පිරිවැය අධික ප්‍රවාහන සහ රක්ෂණ ගාස්තූන්හි බලපෑම පිළිබිඹු කරමින්, ආහාර මිල ගණන් 2026 වසරේදී සියයට 5 කින් ඉහළ යනු ඇතැයි පුරෝකථනය කෙරේ. පොහොර මිල ගණන් 2026 වසරේදී සියයට 10 කින් ඉහළ යනු ඇතැයි පුරෝකථනය කෙරෙන අතර, කළු මුහුදු හරහා සිදු කෙරෙන ධාන්‍ය ප්‍රවාහනයට ඇති වූ බාධාවන් සහ යුරෝපයේ ඇති වූ තාප තරංග වල බලපෑම මධ්‍යයේ, 2026 වසරේ මාර්තු සිට අගෝස්තු දක්වා කාලය තුළදී තිරිඟු මිල සියයට 22.7 කින් ඉහළ ගියේය. බලශක්ති සහ ආහාර මිල ගණන් තවදුරටත් ඉහළ යාම මඟින්, විශේෂයෙන්ම වඩාත් අවදානමට ලක්විය හැකි අඩු ආදායම්ලාභී ආර්ථිකයන්හි දරිද්‍රතාවය සහ ආහාර සුරක්ෂිතතාවය කෙරෙහි දැඩි බලපෑම් ඇති විය හැකිය.

1.7 ගෝලීය වෙළෙඳාම

ගෝලීය වෙළෙඳ වර්ධනය 2025 වසරේ දී වූ සියයට 5.0 සිට 2026 වසරේ දී සියයට 4.6 දක්වා මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තාක්ෂණ අංශයට සම්බන්ධ වෙළෙඳාම අඛණ්ඩව ශක්තිමත්ව පවතිනු ඇතැයි අපේක්ෂා කළ ද, තීරුබදුවල බලපෑම මෙන්ම වෙළෙඳ ප්‍රතිසංවිධානය සහ සැපයුම්කරුවන් ආදේශ කිරීම හරහා වෙළෙඳ සබඳතා සහ නිෂ්පාදන දාමයන්හි සිදුවන ක්‍රමික ගැළපීම් මෙම මන්දගාමී වීම මඟින් පිළිබිඹු කරයි. දියුණු ආර්ථිකයන්හි අපනයන වර්ධනය 2025 වසරේ දී වූ සියයට 3.6 සිට 2026 වසරේදී සියයට 5.1 දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කෙරෙන අතර, මැද පෙරදිග බලශක්ති නිෂ්පාදනයට සහ ප්‍රවාහනයට ඇති වූ බාධාවන් මධ්‍යයේ, නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි අපනයන වර්ධනය සියයට 7.1 සිට සියයට 3.6 දක්වා ශීඝ්‍රයෙන් මන්දගාමී වනු ඇතැයි පුරෝකථනය කෙරේ.

තාක්ෂණ අංශය සම්බන්ධ වෙළෙඳාම අඛණ්ඩව ශීඝ්‍රයෙන් ප්‍රසාරණය විය. ප්‍රධාන වශයෙන් ඉහළ පරිමාවන්ට වඩා ඉහළ මිල ගණන් හේතුවෙන්, කෘත්‍රිම බුද්ධියට සම්බන්ධ දෘඩාංගවල ශුද්ධ වෙළෙඳාම ලෝක ද. දේ. නි. යේ ප්‍රතිශතයක් ලෙස තියුණු ලෙස ඉහළ ගියේය. කෘත්‍රිම බුද්ධියට සම්බන්ධ දෘඩාංගවල ප්‍රධාන ශුද්ධ අපනයනකරුවන් හතරදෙනා වන කොරියාව, මැලේසියාව, තායිලන්තය සහ චීනයේ

තායිවාන ප්‍රදේශයේ වර්ධන අපේක්ෂාවන් ඉහළ නැංවුණු අතර, අර්ධ සන්නායක සඳහා වූ ශක්තිමත් ජාත්‍යන්තර ඉල්ලුමේ සහාය ඇතිව කොරියාවේ වර්ධනය 2026 වසරේ දී සියයට 3.3 දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කෙරේ. කෙසේ වෙතත්, එක්සත් ජනපදයේ ඵලදායී තීරුබදු අනුපාතය මෙන්ම එක්සත් ජනපද ආනයන මත අනෙකුත් රටවල් විසින් පනවන ලද තීරුබදු යන කරුණු දෙකම 2026 වසරේ අප්‍රේල් මාසයේ දී උපකල්පනය කළ මට්ටමට වඩා තරමක් ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන්, දේශසීමා හරහා සිදු කෙරෙන වෙළෙඳාම අඛණ්ඩව අභියෝගවලට මුහුණ දුන්නේය. සමාගම් විසින් තම වෙළඳාමෙන් විශාල කොටසක් විකල්ප ගමනාන්ත වෙත යොමු කර ඇති අතර, එමඟින් ඉහළ වෙළෙඳ බාධක නිසා සිදුවන කෙටි කාලීන හානිය අවම වී ඇත. කෙසේ වෙතත්, මෙහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රියාකාරකම් අලුතින් නැවත සිදු කිරීමට සිදුවීම සහ අධික පිරිවැය හේතුවෙන් දිගුකාලීනව කාර්යක්ෂමතාව අඩු විය හැක.

ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී, හෝර්මුස් සමුද්‍ර සන්ධියේ තත්ත්වයන් ක්‍රමයෙන් සාමාන්‍ය තත්ත්වයට වෙතැයි උපකල්පනය කිරීමත් සමඟ සහ වෙළෙඳ සබඳතා හා නිෂ්පාදන දාමයන් තවදුරටත් හැඩගැසීමත් සමඟ, ලෝක වෙළෙඳ පරිමා වර්ධනය 2027 වසරේ දී සියයට 4.7 ක මට්ටමක ස්ථාවර වනු ඇතැයි පුරෝකථනය කෙරේ. කෙසේ වෙතත්, විශේෂයෙන්ම වෙළෙඳ ආතතීන් පවතින ගැටුම්වලට සම්බන්ධ වුවහොත් හෝ වෙළෙඳ ගමන්මඟ වෙනස් කිරීම් වඩාත් බාධාකාරී වුවහොත්, වෙළෙඳ ආතතීන් නැවත ඉහළ යා හැකිය. බලශක්ති වෙළෙඳපොළවලට සහ උපායමාර්ගික සැපයුම් දාමයන්ට දිගුකාලීනව සිදුවන බාධාවන් හෝ අසමතුලිත වෙළෙඳාම, වැඩි රටවල් සංඛ්‍යාවක් තීරුබදු ඉහළ නැංවීමට හෝ වෙනත් වෙළෙඳ සීමා කිරීම් පැනවීමට යොමු කළ හැකිය. බලශක්තිය, තීරණාත්මක ඛනිජ සහ අනෙකුත් ප්‍රධාන නිෂ්පාදන යෙදවුම් මත පනවන සීමා කිරීම් මඟින් සැපයුම් බාධක සහ ඉහළ මිල ගණන් ඇති කළ හැකිය. රටවල් ඊට ප්‍රතිප්‍රහාරාත්මක ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන්නේ නම්, මෙම පිරිවැය තවදුරටත් වර්ධනය විය හැකිය. අනෙක් අතට, නව කලාපීය සහ ද්විපාර්ශ්වික වෙළෙඳ ගිවිසුම් මඟින් වෙළෙඳ බාධක අඩු කිරීමටත්, ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම්වලට සහාය වීමටත් හැකිවේ.

1.8 මුදල් හා මූල්‍ය අංශය

දේශීය වර්ධන ප්‍රවණතාව සහ ගැටුම මඟින් උද්ධමනය කෙරෙහි ඇති විය හැකි කල්පවත්නා බලපෑම අතර තුලනයක් පවත්වා ගැනීමට මහ බැංකු කටයුතු කළ බැවින්, 2026 වසර පුරා මුදල් ප්‍රතිපත්තිය සුපරීක්ෂාකාරී මට්ටමක පැවතුණි. උද්ධමන පීඩන වඩාත් පැහැදිලි වී ඇති අතර ආර්ථික ක්‍රියාකාරකම් සුළු වශයෙන් පමණක් මන්දගාමී වී ඇති බැවින්, අප්‍රේල් මාසයේදී උපකල්පනය කළ ප්‍රමාණයට වඩා මුදල් ප්‍රතිපත්තියෙන් ලැබෙන සහාය අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. යුරෝ කලාපයේ සහ එක්සත් ජනපදයේ ප්‍රතිපත්ති අනුපාතික මූර්ත අගයෙන් ඉහළ යනු ඇතැයි පුරෝකථනය කෙරෙන අතර, ජපානයේ ප්‍රතිපත්ති අනුපාතිකය ක්‍රමිකව මධ්‍යස්ථ මට්ටමක් කරා ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මැද පෙරදිග ඇති වූ කෙටිකාලීන සටන් විරාමය, රතු මුහුද දක්වා ව්‍යාප්ත වූ අඩු තීව්‍රතාවයකින් යුත් ගැටුමක් මඟින් ප්‍රතිස්ථාපනය වී ඇති අතර, එමඟින් බලශක්ති මිල ගණන් අස්ථාවර මට්ටමක පැවතීමට හේතු වේ. මෙම පසුබිම තුළ, බලශක්ති මිල ගණන් මඟින් ඇති කෙරෙන මතුපිට උද්ධමනයේ කෙටිකාලීන වෙනස්වීම්වලට අධික ලෙස ප්‍රතිචාර දැක්වීමෙන් වැළකී සිටින ලෙසත්, ඉහළ උද්ධමනය උද්ධමන අපේක්ෂාවන් හෝ වැටුප් තීරණය කිරීම කෙරෙහි බලපෑම් ඇති කිරීමට පටන් ගන්නේ නම් ඊට ප්‍රතිචාර දක්වන ලෙසත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මහ බැංකුවලට අවධාරණය කරයි.

ගැටුම සහ කෘත්‍රිම බුද්ධියට අදාළ වර්ධනයන් හේතුවෙන් ඇති වූ අස්ථාවරතාවයන් මධ්‍යයේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළදී මූල්‍ය වෙළෙඳපොළවල් බොහෝ දුරට ස්ථාවරව පැවතුණි. ශක්තිමත් සංස්ථාපිත ඉපැයීම් සහ විශේෂයෙන්ම තාක්ෂණ කොටස්වල ඉහළ කොටස් තක්සේරු කිරීම්හි සහාය ඇතිව, පෙර පැවති තත්වයන්ට අනුව ගෝලීය මූල්‍ය තත්ත්වයන් සාපේක්ෂව සහනශීලී මට්ටමක පැවතුණ අතර, එමඟින් වෙනත් අංශවල පැවති දැඩි තත්ත්වයන් සමනය කෙරිණි. උද්ධමනය නැවත ඉස්මතු වීම, කෙටිකාලීන ප්‍රතිපත්ති අනුපාතික ඉහළ යනු ඇතැයි යන අපේක්ෂාවන් සහ රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය පිළිබඳ ගැටලු හේතුවෙන් බොහෝ ආර්ථිකයන්හි රජයේ බැඳුම්කර ඵලදා ඉහළ ගිය අතර, දියුණු ආර්ථිකයන්හි මිණුම් පොළී අනුපාතික දශක කිහිපයක ඉහළම මට්ටම් කරා ළඟා වෙමින් නැගී එන වෙළෙඳපොළවල ණය ගැනීමේ පිරිවැය ඉහළ නැංවීය. විශේෂයෙන්ම ආසියාවේ විනිමය අනුපාතික ඉහළ විචලනයක් පෙන්නුම් කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ජපානය සහ එක්සත් ජනපදය ඒකාබද්ධව සිදු කළ මෙහෙයුමක් ද ඇතුළුව බලධාරීන්ගේ මැදිහත්වීම් සඳහා එය හේතු විය. මේ අතර, ඉහළ පොළී අනුපාතික මඟින් ප්‍රතිලාභ ලබා නොදෙන වත්කම් රඳවා තබා ගැනීමේ පිරිවැය ඉහළ නැංවූ බැවින්, 2026 වසරේ මාර්තු සිට අගෝස්තු දක්වා කාලය තුළදී රත්රන් මිල සියයට 9.1 කින් පහත වැටුණි.

පෙර පැවති තත්ත්වයන්ට අනුව මූල්‍ය තත්ත්වයන් සහනශීලීව පැවතියද, මූල්‍ය ස්ථාවරත්ව අවදානම් තවදුරටත් පැවතුණි. මෑතකදී කොරියාවේ සහ එක්සත් ජනපදයේ තාක්ෂණ කොටස්වල ඇති වූ අස්ථාවර අවස්ථාවලින් පෙන්නුම් කෙරෙන පරිදි, අධි-තක්සේරු කොටස් අගයන්, කෘත්‍රිම බුද්ධියට සම්බන්ධ සමාගම්වල කොටස් වෙළෙඳපොළ කේන්ද්‍රගතවීම ඉහළ යාම සහ කෘත්‍රිම බුද්ධියට සම්බන්ධ ලාභදායීතාවය හා ඵලදායිතා වර්ධනය පිළිබඳ අපේක්ෂාවන් පහළට සංශෝධනය වුවහොත් සිදුවිය හැකි ශීඝ්‍ර වෙළෙඳපොළ නිවැරදි වීම කෙරෙහි මෙම අවදානම් කේන්ද්‍රගත විය.

එසේම, ප්‍රධාන ආර්ථිකයන් කිහිපයක පවතින ඉහළ රාජ්‍ය ණය මට්ටම් සහ විශාල ණය ප්‍රතිමූල්‍යකරණ අවශ්‍යතා කෙරෙහිද මෙම අවදානම් කේන්ද්‍රගත වූ අතර, එම තත්ත්වය හේතුවෙන් මූල්‍ය තත්ත්වයන්හි හදිසි වෙනස්වීම්වලට ස්වෛරී වෙළෙඳපොළවල් නිරාවරණය වී ඇත. දියුණු ආර්ථිකයන්හි රාජ්‍ය ණය 2025 වසරේ දී වූ ද.දේ.නි.යෙන් සියයට 108 සිට 2031 වසර වන විට ද.දේ.නි.යෙන් සියයට 115 දක්වාද, නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි රාජ්‍ය ණය ද. දේ. නි. යෙන් සියයට 74 සිට සියයට 84 දක්වා ද ඉහළ යනු ඇතැයි පුරෝකථනය කෙරේ. මෙම අවදානම් කළමනාකරණය කිරීම, විශ්වසනීය රාජ්‍ය මූල්‍ය ගැළපුම් සැලසුම්, විවක්ෂණශීලී ණය කළමනාකරණය සහ මූල්‍ය නියාමනය හරහා රාජ්‍ය මූල්‍ය අවකාශය යළි ගොඩනැංවීම මත මෙන්ම, තීරණාත්මක යටිතල පහසුකම් සහ මූල්‍ය සේවා ඉලක්ක කරගනිමින් කෘත්‍රිම බුද්ධිය මඟින් ඇති කරනු ලබන සයිබර් ප්‍රහාර ඇතුළු සයිබර් ප්‍රහාරවලට එරෙහි ශක්තිමත් ආරක්ෂණ ක්‍රියාමාර්ග මතද රඳා පවතී.

2 වන පරිච්ඡේදය

රාජ්‍ය මූල්‍ය ප්‍රවණතා

2.1 සමාලෝචනය

අඛණ්ඩ ආදායම් රැස්කිරීම, ආදායම් පාදක රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය, ශක්තිමත් දූෂණ විරෝධී ක්‍රියාමාර්ග සහ ඉහළ සාර්ව ආර්ථික ස්ථාවරත්වය යන කරුණු හේතුවෙන් 2026 වසරේ පළමු භාගය තුළ රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය තවදුරටත් ශක්තිමත් විය. 2022 වසරේ සිට ක්‍රියාත්මක කරන ලද ආදායම් පාදක රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය හේතුවෙන් රාජ්‍ය ආදායම තිරසර ලෙස යථා තත්ත්වයට පත්ව ඇති අතර, ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස බදු ආදායම 2022 වසරේ දී වූ සියයට 7.3 සිට 2025 වසරේ දී සියයට 15.4 දක්වා ඉහළ ගියේය. මෙම ජයග්‍රහණ මත පදනම් වෙමින් රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය, සාධාරණ ආර්ථික වර්ධනය සහ පශ්චාත් ආපදා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට සහාය වීම සඳහා ආදායම් රැස් කිරීම අඛණ්ඩව පවත්වාගෙන යාමටත්, වියදම් කළමනාකරණය වැඩිදියුණු කිරීමටත් රජය කැපවී සිටී. මේ සඳහා වියදම් දැරීමේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, ප්‍රමුඛතා ව්‍යාපෘති වල මූලධන වියදම් දැරීම වේගවත් කිරීම, දිට්වා සුළි කුණාටුවෙන් පසු යථා තත්ත්වයට පත්වීමට සහාය වීම, සෘජු බදුවල දායකත්වය ඉහළ නැංවීම, බදු පරිපාලනය ඩිජිටල්කරණය කිරීම තවදුරටත් වැඩිදියුණු කිරීම සහ සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් ඉලක්කගතකිරීම ශක්තිමත් කිරීම කෙරෙහි අඛණ්ඩව උත්සාහයන් දරනු ලැබේ.

අඛණ්ඩව රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය තහවුරු කිරීමේ ප්‍රයත්නයන් පිළිබිඹු කරමින්, 2025 වසරේ පළමු භාගය තුළ වාර්තා වූ රු. බිලියන 859.0 ක ප්‍රාථමික අතිරික්තයට සාපේක්ෂව 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී ප්‍රාථමික අතිරික්තය රු.බිලියන 1,244.1 ක් දක්වා වර්ධනය වූ අතර මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආදායම් එකතුකිරීම ඉහළයාම සහ මූලධන වියදම් අඩුවීමයි. ප්‍රාථමික අතිරික්තය 2026 ජූනි මස අවසානය වන විට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ 2026 වසරේ පළමු භාගය සඳහා නියම කර තිබූ රු.බිලියන 72 ක ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායකය සැලකිය යුතු ලෙස ඉක්මවා යන ලදී. 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 405.6 ක හිඟයක් ලෙස පැවති සමස්ත අයවැය ශේෂය, 2026 වසරේ පළමු භාගය වන විට රු. බිලියන 9.5 ක අතිරික්තයක් බවට පත් විය.

2.1 වගුව | අයවැය සාරාංශය: 2026 ජනවාරි - ජූනි

රු. මිලියන

අයිතමය	2025	2026 (තාවකාලික)
ආදායම් හා ප්‍රදාන	**2,325,104**	**2,956,003**
ආදායම්	**2,321,719**	**2,954,189**
බදු ආදායම	2,152,087	2,710,552
බදු නොවන ආදායම	169,632	243,637
ප්‍රදාන	3,385	1,813
වියදම්	**2,730,707**	**2,946,494**
පුනරාවර්තන	2,506,828	2,669,889
පොළී ගෙවීම්	1,264,591	1,234,580
අනෙකුත්	1,242,237	1,435,309
රාජ්‍ය ආයෝජන	228,064	280,071
අනෙකුත්	-4,185	-3,467
ජංගම ගිණුමේ අතිරික්තය (+) /හිඟය (-)	**-185,109**	**284,301**
සමස්ත අයවැය අතිරික්තය (+) /හිඟය (-)	**-405,603**	**9,509**
මූල්‍යයනය	**405,603**	**-9,509**
විදේශීය මූල්‍යයනය	**-120,042**	**32,559**
ණය ගැනීම්	137,715	304,535
ණය ආපසු ගෙවීම්	-257,757	-271,976
දේශීය මූල්‍යයනය	525,645	-42,068
ණය ගැනීම්	1,312,750	835,707
ණය ආපසු ගෙවීම්	-787,104	-877,774

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

මුළු රාජ්‍ය ආදායම සහ ප්‍රදාන රු.බිලියන 2,956.0 ක් දක්වා සියයට 27.1 කින් වර්ධනය වී ඇති අතර ප්‍රදාන හැර මුළු රාජ්‍ය ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 56.1 ක් ළඟා කරගනිමින් රු.බිලියන 2,954.2 ක් දක්වා සියයට 27.2 කින් වර්ධනය වී ඇත. මෙම ශක්තිමත් ආදායම් කාර්යසාධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ බදු ආදායම ඉහළ යාම වන අතර ආදායම් බදු, භාණ්ඩ හා සේවා මත පනවන බදු සහ විදේශ වෙළඳාම මත පනවන බදු මගින් ලැබුණු ආදායම් ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස, සමස්ත බදු ආදායම රුපියල් බිලියන 2,710.6 ක් දක්වා සියයට 25.9 කින් වර්ධනය වී ඇත. ආනයන ආශ්‍රිත බදු සහ දේශීය බදු යන දෙඅංශයෙන්ම බදු එකතු කිරීම් ඉහළ යාම පෙන්නුම් කරමින්, බදු ආදායම ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා රේගුව සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ප්‍රධාන දායකත්වයක් ලබා දී ඇත. බදු නොවන ආදායම ද රු.බිලියන 243.6 ක් දක්වා සියයට 43.6 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇති අතර, ප්‍රදාන රු.බිලියන 1.8 ක් දක්වා සියයට 46.4 කින් අඩු වී ඇත.

සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු මෙන්ම රඳවා ගැනීමේ බදු මගින් ලැබුණු ආදායම් ඉහළ යාම හේතුවෙන් ආදායම් බද්දෙන් ලද ආදායම රු.බිලියන 568.4 ක් දක්වා සියයට 16.3 කින් වර්ධනය වී ඇත. භාණ්ඩ හා සේවා මත පනවන බදු රු. බිලියන 1,769.0 ක් දක්වා සියයට 29.6 කින් වර්ධනය වී ඇති අතර මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ එකතු කළ අගය මත බද්ද, නිෂ්පාදන/සුරා බදු සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද මගින් ලැබුණු ආදායම් ඉහළයාමයි. එකතු කළ අගය මත බදු ආදායම රු.බිලියන 987.6 ක් දක්වා සියයට 25.4 කින් වර්ධනය වී ඇති අතර මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ දේශීය සහ ආනයන සම්බන්ධ බදු එකතු කිරීම ඉහළයාම මෙන්ම බදු අනුකූලතාව සහ බදු එකතු කිරීමේ කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම අරමුණු කරගත් බදු පරිපාලනයේ දියුණුව සහ බදු පරිපාලනයේ අඛණ්ඩ ඩිජිටල්කරණයයි. විදේශ වෙළඳාම මත බදු ආදායම රු.බිලියන 373.2 ක් දක්වා සියයට 25.1 කින් වර්ධනය වී ඇති අතර මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආනයන වටිනාකම් ඉහළයාම සහ මෝටර් වාහන මත පනවන ලද ඉහළ ආනයන තීරු බදු වේ.

2026 වසරේ පළමු මාස හය තුළ රජයේ මුළු වියදම රු. බිලියන 2,946.5 ක් දක්වා සියයට 7.9 කින් වර්ධනය වී ඇති අතර, පුනරාවර්තන වියදම් රු. බිලියන 2,669.9 ක් දක්වා සියයට 6.5 කින් වර්ධනය වී ඇත. පුනරාවර්තන වියදම් ඉහළ යාමට ප්‍රධාන හේතුව වූයේ රාජ්‍ය අංශයේ වැටුප් සංශෝධනවල බලපෑම මෙන්ම සුබසාධන වැඩසටහන්, විශ්‍රාම ප්‍රතිලාභ සහ මාරු ගෙවීම් සඳහා දැරීමට සිදුවූ ඉහළ වියදම් ය. මෙහෙයුම් වියදම් සම්බන්ධයෙන් දැඩි පාලනයක් ක්‍රියාත්මක වූ බව පෙන්නුම් කරමින් භාණ්ඩ හා සේවා සඳහා වන වියදම සියයට 5.8 කින් පහත වැටුණු අතර පොලී ගෙවීම් ද සියයට 2.4 කින් අඩු විය. වැටුප් සහ වේතන රු. බිලියන 621.7 ක් දක්වා සියයට 12.0 කින් වර්ධනය වී ඇති අතර සහනාධාර සහ මාරු ගෙවීම් රු. බිලියන 666.3 ක් දක්වා සියයට 25.6 කින් වර්ධනය වී ඇත.

මූලධන වියදම් සහ ශුද්ධ ණය දීම් රු.බිලියන 276.6 ක් දක්වා සියයට 23.6 කින් වර්ධනය වී ඇති අතර, සංවර්ධන ක්‍රියාකාරකම්වල අඛණ්ඩ ප්‍රගතිය පිළිබිඹු කරමින් රාජ්‍ය ආයෝජන 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ රු.බිලියන 228.1 සිට රු.බිලියන 280.1 දක්වා සියයට 22.8 කින් වර්ධනය වී ඇත.

2.2 වගුව | ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම සහ වියදම: 2026 ජනවාරි - ජුනි

රු. බිලියන

අයිතමය	ඇස්තමේන්තුගත (වාර්ෂික)	තත්‍ය (තාවකාලික)	ළඟාකරගැනීම (%)
මුළු ආදායම	**5,270**	**2,954**	**56.1**
බදු ආදායම	4,910	2,711	55.2
බදු නොවන ආදායම	360	244	67.7
මුළු වියදම	**7,557**	**2,946**	**39.0**
වර්තන වියදම	5,838	2,670	45.7
ප්‍රාග්ධන වියදම සහ ශුද්ධ ණයදීම්	1,719	277	16.1

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වැඩිදියුණු වූ රාජ්‍ය මූල්‍ය තත්ත්වය රජයේ මූල්‍යකරණ තත්ත්වයෙන් ද පිළිබිඹු විය. සමස්ත අයවැය අතිරික්තයට අනුකූලව, 2026 වසරේ පළමු භාගයේ මුළු මූල්‍යකරණය රු.බිලියන 9.5 ක ඍණ අගයක් වාර්තා කරන ලදී. ශුද්ධ විදේශීය මූල්‍යකරණය රු.බිලියන 32.6 ක් වූ අතර, එය දළ විදේශීය ණය ගැනීම් රු.බිලියන 304.5 කින් සහ ආපසු ගෙවීම් රු.බිලියන 272.0 කින් සමන්විත විය. මේ අතර, ශුද්ධ දේශීය මූල්‍යකරණය 2025 වසරේ සමාන කාල පරිච්ඡේදයේ වූ රු.බිලියන 525.6 ක ධන අගයට සාපේක්ෂව රු.බිලියන 42.1

ක සෘණ අගයක් වාර්තා කර ඇත. වැඩිදියුණු වූ රාජ්‍ය මූල්‍ය තත්ත්වයට අනුකූලව මෙම කාලපරිච්ඡේදය තුළ දේශීය මූල්‍යකරණය මත යැපීම අඩු වී ඇති බව මෙම වර්ධනයන්ගෙන් පෙන්නුම් කරයි.

සමස්තයක් වශයෙන්, 2026 වසරේ පළමු භාගයේ රාජ්‍ය මූල්‍ය වර්ධනයන් මගින් ප්‍රමුඛතා රාජ්‍ය ආයෝජන සහ ඉලක්කගත සමාජ ආරක්ෂණය සඳහා වන සහාය ද පවත්වාගෙන යමින්, ශක්තිමත් ආදායම් කාර්යසාධනය, වියදම් කළමනාකරණය සහ වැඩිදියුණු කළ මූල්‍ය තත්ත්වයන් හේතුවෙන් අත්කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයෙහි අඛණ්ඩ ප්‍රගතිය පිළිබිඹු කරයි.

2.2 රාජ්‍ය ආදායම

2026 වසරේ පළමු භාගයේ දී ප්‍රදාන හැර රජයේ සමස්ත ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ රු. බිලියන 2,325.1 ට සාපේක්ෂව රු. බිලියන 2,956.0 ක් දක්වා සියයට 27.1 කින් වර්ධනය වී ඇත. 2026 වසරේ පළමු භාගයේ දී බදු ආදායම 2025 වසරේ එම කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 2,152.1 ට සාපේක්ෂව රු. බිලියන 2,710.6 ක් දක්වා සියයට 25.9 කින් ඉහළ යාම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

බදු ආදායමේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපෑ හේතු වූයේ;

1. 2025 වසරේ පෙබරවාරි මාසයේ සිට සියලුම වර්ගයේ මෝටර් රථ ආනයනය සඳහා පනවා තිබූ සීමාවන් ලිහිල් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, 2026 වසරේ ජනවාරි සිට ජූනි දක්වා කාලය තුළ මෝටර් රථ ආනයන සංඛ්‍යාව ඒකක 313,480 ක් දක්වා සියයට 256 කින් වර්ධනය වීම හේතුවෙන් මෝටර් රථ මත පනවන ලද නිෂ්පාදන බදු ආදායම සියයට 106.2 කින් හෙවත් රු. බිලියන 137.2 කින් වර්ධනය වීම;

2. 2025 වසරේ පෙබරවාරි මාසයේ සිට සියලු වර්ගයේ මෝටර් රථ ආනයනය සඳහා පනවා තිබූ සීමා ලිහිල් කිරීමත්, 2026 වසරේ අප්‍රේල් 01 දින සිට ආනයනික රෙදිපිළි සඳහා එකතු කළ අගය මත බද්ද පැනවීමත් යන බලපෑමෙන් ආනයන මත වූ එකතු කළ අගය මත බද්ද රු. බිලියන 443.7ක් දක්වා සියයට 25.3 කින් වර්ධනය වීම හා දේශීය ආර්ථික ක්‍රියාකාරකම්වල වර්ධනය මෙන්ම 2025 වසරේ පළමු භාගය සමඟ සැසඳීමේදී 2026 වසරේ පළමු භාගයේ මූල්‍ය සේවා ඇතුළුව එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි සංඛ්‍යාව 37,027ක් දක්වා සියයට 34.2 කින් පුළුල් වීම තුළින් පිළිඹිබු වන ආදායම් පරිපාලන ක්‍රියාමාර්ගවල දියුණුවෙහි ප්‍රතිඵලයක් වශයෙන් දේශීය එකතු කළ අගය මත බදු ආදායම රු. බිලියන 543.9 ක් දක්වා සියයට 25.5 කින් වර්ධනය වීම හේතුවෙන් සමස්ත එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම සියයට 25.4 කින් හෙවත් රු. බිලියන 200.3 කින් වර්ධනය වීම;

3. මෝටර් රථ ආනයනය සඳහා රේගු ආනයන බදු අය කිරීම, එම මෝටර් රථ සඳහා අදාළ වන රේගු ආනයන බදු මත සියයට 50 ක අධිභාරයක් පැනවීම සහ අදාල කාලපරිච්ඡේදය තුළ භාණ්ඩ ආනයන වටිනාකම ඇ.ඩො. මිලියන 12,392.3 ක් දක්වා සියයට 26.9 කින් ඉහළයාම යන ප්‍රධාන සාධක හේතුවෙන් රේගු ආනයන බද්දෙන් ලද ආදායම සියයට 63.6 කින් හෙවත් රු. බිලියන 59.8 කින් වර්ධනය වීම;

4. මත්පැන්, දුම්කොළ සහ ඔට්ටු ඇල්ලීම හා සූදු කර්මාන්ත සඳහා වන බදු අනුපාතය සියයට 40 සිට සියයට 45 දක්වා ඉහළ නැංවීමත් 2025 වසරේ අප්‍රේල් 01 වන දින සිට විදේශීය මූලාශ්‍රයකින් උපයාගත් හෝ ලබාගත් ලාභ හා ආදායම් මත සියයට 15ක බද්දක් හඳුන්වා දීමත් පිළිඹිබු කරමින් සංස්ථාපිත ආදායම් බදු ආදායම රු. බිලියන 314.5 දක්වා සියයට 21.7කින් වර්ධනය වීම, පොළී ආදායම් මත අයකරනු ලබන රඳවා ගැනීමේ බද්ද 2025 වසරේ අප්‍රේල් 01 වන දින සිට සියයට 5 සිට සියයට 10 දක්වා ඉහළ නැංවීම පෙන්නුම් කරමින් රඳවා ගැනීමේ බදු ආදායම රු. බිලියන 104.2 ක් දක්වා සියයට 21.0 කින් වර්ධනය වීම මෙන්ම 2026 වසරේ ජූනි මස අවසානය වන විට සමස්ත ලියාපදිංචි ආදායම් බදු ලිපිගොනු සංඛ්‍යාව 2025 වසරේ ජූනි මස අවසානයට සාපේක්ෂව 1,406,497 දක්වා සියයට 12 කින් ඉහළ නංවමින් බදු පරිපාලනයේ සිදු වූ වැඩිදියුණු කිරීම් තුළින් ආදායම් ඉහළ නැංවීමට වූ දායකත්වය යන ප්‍රධාන සාධක හේතුවෙන් ආදායම් බද්දෙන් ලද ආදායම සියයට 16.3 කින් හෙවත් රු. බිලියන 79.9 කින් වර්ධනය වීම;

5. අර්තාපල් සහ එෑණු ආනයනය සඳහා අදාළ බදු අනුපාත ඉහළ දැමීම සහ සහල් ආනයනය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම සියයට 7.2 කින් හෙවත් රු. බිලියන 5.6 කින් වර්ධනය වීම;

6. 2025 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගයේ දී සමාජ ආරක්ෂණ දායකත්ව බද්දට අදාළව ලියාපදිංචි බදු ගොනු සංඛ්‍යාව 18,332 ක් දක්වා සියයට 31.2 කින් ඉහළ යාම තුළින් පිළිඹිබු වන බදු පරිපාලන ක්‍රියාමාර්ගයන්හි වර්ධනය සහ දේශීය හා විදේශීය ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් වීම හේතුවෙන් සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම සියයට 21.5 කින් හෙවත් රු. බිලියන 30.5 කින් වර්ධනය වීම;

7. 2026 වසරේ පළමු භාගය තුළ මත්පැන් නිෂ්පාදනය නිරපේක්ෂ ලීටර් මිලියන 19.7ක් දක්වා සියයට 13.3 කින් වර්ධනය වීම හේතුවෙන් මත්පැන් මත අය කරනු ලබන සුරා බදු වලින් ලද ආදායම රු. බිලියන 29.3 ක් දක්වා සියයට 27.1 කින් වර්ධනය වීම; සහ

8. ආනයන ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් ලද ආදායම සියයට 10.6 කින් හෙවත් රු. බිලියන 9.0 කින් වර්ධනය වීම.

2026 වසරේ පළමු භාගය තුළ බදු නොවන ආදායම සියයට 43.6 කින් හෙවත් රු. බිලියන 74.0 කින් වර්ධනය වීම ද සමස්ත ආදායම් ඉහළ යාම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ රු. බිලියන 42.1 ක ලාභ පැවරුම් සහ දඩ, ගාස්තු හා අය කිරීම්වලින් ලැබුණු ආදායම රු. බිලියන 20.3 කින් ඉහළ යාම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. මේ අතර, පොලී ආදායමෙන් සහ සමාජ ආරක්ෂණ දායක මුදල් තුළින් ලද ආදායම ද බදු නොවන ආදායමේ මෙම වර්ධනය සඳහා ධනාත්මක දායකත්වයක් ලබා දී ඇත.

බදු ආදායම

2026 වසරේ පළමු භාගය තුළ රජයේ බදු ආදායම රු. බිලියන 2,710.6 දක්වා වර්ධනය වූ අතර, එය රජයේ මුළු ආදායමෙන් සියයට 91.8 ක් විය.

2.3 වගුව | ඇස්තමේන්තුගත සහ තත්‍ය බදු ආදායම: 2026 ජනවාරි - ජූනි

රු. බිලියන


අයිතමය	වාර්ෂික ඇස්තමේන්තුව	තත්‍ය (තාවකාලික)
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		
ආදායම් සහ ලාභ මත බදු	1,210	568
එකතු කළ අගය මත බදු - දේශීය	937	544
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද- දේශීය	236	125
වෙනත්	18	10
උප එකතුව	**2,401**	**1,248**
ශ්‍රී ලංකා රේගුව		
ආනයන බදු	235	154
එකතු කළ අගය මත බදු - ආනයන	875	444
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද- ආනයන	97	47
වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු	190	94
සෙස් ආනයන / අපනයන	90	42
විශේෂ වෙළඳ භාණ්ඩ බදු	129	83
නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු	589	424
දුම්වැටි	105	57
ඛනිජ තෙල්	205	96
මෝටර් වාහන සහ අනෙකුත්	279	272
වෙනත්	1	2
උප එකතුව	**2,206**	**1,290**
සුරාබදු දෙපාර්තමේන්තුව		
මත්පැන්/දුම්කොළ	245	138
උප එකතුව	**245**	**138**
අනෙකුත්		
විදුලි සංදේශ බද්ද	17	7
වෙනත්	41	28
උප එකතුව	**58**	**35**
මුළු බදු ආදායම	**4,910**	**2,711**

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

එකතු කළ අගය මත බද්ද, සුරා බද්ද /නිෂ්පාදන බද්ද සහ විදේශ වෙළඳාම මත අය කරන බදු ආදායම් ඉහළ යාම හේතුවෙන්, 2025 වසරේ අදාළ කාලසීමාව තුළ 23:77 ක්ව පැවති සෘජු බදු සහ වක්‍ර බදු අනුපාතය, 2026 වසරේ පළමු මාස හය තුළ 21:79 දක්වා පහත වැටුණි. 2026 වසරේ මැද භාගය වන විට රජයේ බදු ආදායම, රු. බිලියන 4,910.0 ක් වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 55.2 ක් ළඟා කරගැනීමට හැකි විය.

2026 වසරේ පළමු මාස හය තුළ දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ රු. බිලියන 700.0 ට සාපේක්ෂව රු. බිලියන 869.6 ක් දක්වා සියයට 24.2 කින් වර්ධනය වී ඇත. මේ අතර, ආනයන මත පදනම් වූ බදු ආදායම 2025 වසරේ පළමු මාස හය තුළ වාර්තා වූ රු. බිලියන 927.0 ට සාපේක්ෂව රු. බිලියන 1,226.0 ක් දක්වා සියයට 32.3 කින් වර්ධනය වී ඇත.

2.1 රූප සටහන | රජයේ ආදායම් සංයුතිය: 2026 ජනවාරි - ජූනි



මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

2.4 වගුව | රාජ්‍ය ආදායම් කාර්යසාධනයේ සාරාංශය: 2026 ජනවාරි - ජූනි

රු. මිලියන

අයිතමය	2025	2026 (තාවකාලික)	වර්ධනය %
බදු ආදායම	**2,152,087**	**2,710,552**	**25.9**
ආදායම් බදු	488,506	568,356	16.3
දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු	699,990	869,643	24.2
එකතු කළ අගය මත බදු	433,364	543,931	25.5
සමාජ ආරක්ෂණ දායකත්ව බදු	108,561	125,058	15.2
නිෂ්පාදන බදු	158,023	200,627	27.0
ජාතිය ගොඩනැගීමේ බදු	43	27	-36.1
ආනයන මත පදනම් වූ බදු	926,988	1,226,015	32.3
රේගු බදු	93,952	153,712	63.6
එකතු කළ අගය මත බදු	353,967	443,690	25.3
ජාතිය ගොඩනැගීමේ බදු	405	2	-99.6
වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු	85,431	94,455	10.6
විශේෂ වෙළඳ භාණ්ඩ බදු	77,579	83,163	7.2
සමාජ ආරක්ෂණ දායකත්ව බදු	33,061	47,046	42.3
නිෂ්පාදන බදු	241,136	362,057	50.1
සෙස්	41,456	41,890	1.0
වෙනත්	36,604	46,537	27.1
බදු නොවන ආදායම	**169,632**	**243,637**	**43.6**
මුළු ආදායම	**2,321,719**	**2,954,189**	**27.2**

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ආදායම් බදු

2026 වසරේ මුල් මාස හය තුළ ආදායම් බද්දෙන් ලද ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළදී වූ රු. බිලියන 488.5 සිට රු. බිලියන 568.4 ක් දක්වා සියයට 16.3 කින් වර්ධනය වී ඇත. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් සංස්ථාපිත ආදායම් බදු සහ රඳවා ගැනීමේ බදු එකතු කිරීම් ඉහළ යාම හේතු විය. 2026 වසරේ පළමු මාස හය තුළ සංස්ථාපිත ආදායම් බද්දෙන් ලද ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වූ රු. බිලියන 258.3 ට සාපේක්ෂව 2026 වසරේ පළමු මාස හය තුළ දී සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරමින් රු. බිලියන 314.5 දක්වා සියයට 21.7 කින් වර්ධනය වී ඇත. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දේශීය ආර්ථික කටයුතු ප්‍රසාරණය වීම, 2025 වසරේ අප්‍රේල් 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි මද්‍යසාර, දුම්කොළ සහ ඔට්ටු ඇල්ලීම් හා සූදු කර්මාන්ත සඳහා අදාළ සංස්ථාපිත

ආදායම් බදු අනුපාතය සියයට 40 සිට සියයට 45 දක්වා ඉහළ නැංවීම සහ විදේශීය මූලාශ්‍රවලින් උපයන හෝ ලැබෙන ලාභ මත සියයට 15 ක බද්දක් හඳුන්වා දීම හේතු විය. මීට අමතරව, බදු පරිපාලනය වැඩිදියුණු කිරීම සඳහා දරන ලද උත්සාහයන් තුළින් බදු පදනම පුළුල් වීම ද සංස්ථාපිත ආදායම් බදු ආදායමේ වර්ධනයට දායක විය.

උපයන විට ගෙවීම් / අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දෙන් ලද ආදායම 2026 වසරේ පළමු මාස හය තුළ රු. බිලියන 118.4 ක් දක්වා සියයට 4.5 කින් වර්ධනය වී ඇත. 2025 වසරේ අප්‍රේල් 01 වැනිදා සිට ක්‍රියාත්මක වන වාර්ෂික බදු නිදහස් සීමාව රු. මිලියන 1.2 සිට රු. මිලියන 1.8 දක්වා ඉහළ නැංවීම, බදු අනුපාත ව්‍යුහයේ සංශෝධන සහ එම කාලය තුළ වැටුප් හා වේතන ඉහළ යාම යන සාධකවල සංයුක්ත බලපෑම මෙම වර්ධනයට හේතු විය.

2026 වසරේ පළමු මාස හය තුළ පුද්ගල ආදායම් බද්දෙන් ලද ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේදී වූ රු. බිලියන 30.8 ට සාපේක්ෂව රු. බිලියන 31.3 ක් දක්වා සියයට 1.7 කින් සුළු වශයෙන් වර්ධනය විය. බදු නිදහස් සීමාව ඉහළ නැංවීමේ බලපෑම පැවතිය ද, බදු පරිපාලනයේ වැඩිදියුණු කිරීම් බදු එකතු කිරීම් කෙරෙහි ධනාත්මක දායකත්වයක් ලබා දෙන ලද අතර එය 2025 වසරේ ජූනි මස අවසානයට සාපේක්ෂව 2026 වසරේ ජූනි මස අවසන් වන විට පුද්ගල ආදායම් බදු ලිපිගොනු සංඛ්‍යාව 1,266,976 ක් දක්වා සියයට 10.8 කින් වර්ධනය වී තිබීමෙන් තහවුරු වේ.

2.5 වගුව | ආදායම් බදු කාර්යසාධනය: 2026 ජනවාරි - ජූනි

රු. මිලියන

බදු පදනම	2025	2026 (තාවකාලික)	වර්ධනය %
සංස්ථාපිත හා සංස්ථාපිත නොවන	289,055	345,751	19.6
උපයන විට ගෙවීම්/ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු	113,364	118,448	4.5
ආර්ථික සේවා ගාස්තු	17	8	-53.7
රඳවා ගැනීමේ බද්දි	86,070	104,150	21.0
එකතුව	**488,506**	**568,356**	**16.3**

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

2026 වසරේ පළමු මාස හය තුළ රඳවා ගැනීමේ බද්දෙන් ලද ආදායම 2025 වසරේ වූ රු. බිලියන 86.1 ට සාපේක්ෂව රු. බිලියන 104.2 ක් දක්වා සියයට 21.0 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. මෙම වර්ධනය ප්‍රධාන වශයෙන් 2025 වසරේ අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි පොලී ආදායම මත පනවන රඳවා ගැනීමේ බදු අනුපාතිකය සියයට 5 සිට සියයට 10 දක්වා ඉහළ නැංවීම සහ පොලී අනුපාතික ඉහළ මට්ටමක පැවතීමේ ඒකාබද්ධ බලපෑම පිළිබිඹු කරයි.

එකතු කළ අගය මත බද්ද

එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම නාමික වශයෙන්, 2025 වසරේ පළමු භාගයේ දී වූ රු. බිලියන 787.3 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 987.6 ක් දක්වා සියයට 25.4 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇති අතර, එය 2026 වසරේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 54.5 ක ළඟාකර ගැනීමක් වේ. දේශීය ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රසාරණය වීම සහ බදු පරිපාලන ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීම හේතුවෙන් දේශීය ක්‍රියාකාරකම් මත එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම රු. බිලියන 543.9 ක් දක්වා සියයට 25.5 කින් වර්ධනය විය. ප්‍රධාන වශයෙන් සියලුම කාණ්ඩවල වාහන ආනයන පරිමාවන් ඉහළ යාම හේතුවෙන්, ආනයන මත එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම රු. බිලියන 443.7 ක් දක්වා සියයට 25.3 කින් වර්ධනය විය.

2.6 වගුව | එකතු කළ අගය මත බදු කාර්යසාධනය: 2026 ජනවාරි - ජූනි

රු. මිලියන

බදු පදනම	2025	2026 (තාවකාලික)	වර්ධනය %
දේශීය	433,364	543,931	25.5
ආනයන	353,967	443,690	25.3
මුළු ආදායම	**787,331**	**987,622**	**25.4**

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

නිෂ්පාදන/ සුරා බද්ද

නිෂ්පාදන/ සුරා බද්දෙන් ලද ආදායම 2025 වසරේ පළමු භාගයේ දී ලද රු. බිලියන 399.2 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 562.7 දක්වා සියයට 41.0 කින් වර්ධනය විය. මෝටර් රථ, සිගරට් සහ මත්පැන් වලින් ලද ඉහළ බදු ආදායම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, බනිජ තෙල් සහ අනෙකුත් නිෂ්පාදන බදු අයකළ හැකි අයිතමයන්ගෙන් ලැබුණු ආදායමේ අඩුවීම මඟින් ඉන් කොටසක් පියවෙන ලදි. නිෂ්පාදන/ සුරා බදු ආදායම, 2026 වසරේ පළමු භාගයේ දී බදු ආදායමෙන් සියයට 20.8 ක් සහ සමස්ත ආදායමෙන් සියයට 19.0 ක් සඳහා දායක වූ අතර වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 67.5 ක් ලඟාකර ගන්නා ලදී.

මෝටර් රථ මත පනවා ඇති නිෂ්පාදන බද්දෙන් ලද ආදායම 2025 වසරේ පළමු භාගයේදී වූ රු. බිලියන 129.1 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 266.4 ක් දක්වා සියයට 106.2 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. 2025 වසරේ පෙබරවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වූ පරිදි මෝටර් රථ ආනයනය සඳහා වූ තාවකාලික සීමාවන් ඉවත් කිරීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

සිගරට් මත පනවා ඇති නිෂ්පාදන බද්දෙන් ලද ආදායම 2025 වසරේ පළමු භාගයේ දී වූ රු. බිලියන 44.0 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 57.7 ක් දක්වා සියයට 31.1 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. වෙනත් දිග ප්‍රමාණවලින් යුත් සිගරට් සංඛ්‍යාව පහත වැටුණ ද, මිලිමීටර් 60 සිට 67 දක්වා දිගින් යුත් සිගරට් සංඛ්‍යාව ඉහළ යාම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

2.7 වගුව | නිෂ්පාදන බදු/සුරා බදු ආදායම් කාර්යසාධනය: 2026 ජනවාරි - ජුනි

රු. මිලියන


බදු පදනම	2025	2026 (තාවකාලික)	වර්ධනය %
මත්පැන්	108,240	137,520	27.1
දුම්වැටි / දුම්කොළ	44,023	57,721	31.1
මෝටර් වාහන	129,146	266,360	106.2
ඛනිජ තෙල්	111,990	95,697	-14.5
අනෙකුත්	5,760	5,386	-6.5
එකතුව	**399,159**	**562,684**	**41.0**

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

එසේ වුවද, ඛනිජ තෙල් මත නිෂ්පාදන බදු ආදායම 2025 වසරේ පළමු භාගයේදී වූ රු. බිලියන 112.0 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 95.7 දක්වා සියයට 14.5 කින් අඩු විය. 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඩීසල් ආනයන පරිමාවන්හි අඩුවීමක් සිදුවීම මීට ප්‍රධාන වශයෙන් හේතු විය. පැණි බීම වර්ග, ශීතකරණ, පාම් තෙල් සහ මේද අම්ල ඇතුළු නිෂ්පාදන බද්දට යටත් අනෙකුත් අයිතම මගින් ලද නිෂ්පාදන බදු ආදායම ද 2025 වසරේ පළමු භාගයේදී වූ රු. බිලියන 5.8 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 5.4 දක්වා සියයට 6.5 කින් අඩු විය.

මත්පැන් මත සුරා බදු වලින් ලද ආදායම 2025 වසරේ පළමු භාගය තුළ දී වූ රු. බිලියන 108.2 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 137.5 දක්වා සියයට 27.1 කින් වර්ධනය විය. මත්පැන් නිෂ්පාදනයට අදාළ බදු ගෙවීමේ කාලසීමාවන් පිළිබඳ නව රීති හඳුන්වා දීම, ගාස්තු පැනවීම සහ නිෂ්පාදන පරිමාව ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. සමස්ත මත්පැන් නිෂ්පාදනය 2025 වසරේ පළමු භාගය තුළ දී වූ නිරපේක්ෂ ලීටර් මිලියන 17.4 සිට 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී නිරපේක්ෂ ලීටර් මිලියන 19.7 ක් දක්වා සියයට 13.3 කින් වර්ධනය විය. 2026 වසරේ පළමු භාගය තුළ මත්පැන් මත සුරා බදු වලින් ලද ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 56.6 ක් ලභා කර ගැනීමකි.

2.2 රූප සටහන | නිෂ්පාදන/ සුරා බදු කාර්යසාධනය: 2025/2026 ජනවාරි - ජුනි



මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

වෙනත් බදු

වෙනත් බදු වලින් ලද ආදායම, 2025 වසරේ පළමු මාස හය තුළ වූ රු. බිලියන 477.1 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 591.9 ක් දක්වා සියයට 24.1 කින් වර්ධනය විය.

රේගු ආනයන බද්දෙන් ලද ආදායම 2025 වසරේ මුල් මාස හය තුළ වූ රු.බිලියන 94.0 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 153.7 දක්වා සියයට 63.6 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. මෝටර් රථ ආනයන ප්‍රමාණය ඉහළ යාම සහ මෝටර් රථ සඳහා අදාළ වන රේගු ආනයන බදු අනුපාත මත සියයට 50.0 ක අධිභාරයක් පැනවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

සෙස් බද්දෙන් ලද ආදායම, 2025 වසරේ පළමු මාස හය තුළ වූ රු. බිලියන 41.5 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 41.9 ක් දක්වා සියයට 1.0 කින් සුළු වශයෙන් වර්ධනය විය. සෙස් බද්ද අදියර වශයෙන් ඉවත් කරමින් පැවතිය ද, ආනයන මත පනවනු ලබන සෙස් බද්දෙන් ලද ආදායම රු.බිලියන 40.8 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. මේ අතර, අපනයන මත පනවනු ලබන සෙස් බද්දෙන් ලද ආදායම 2025 වසරේ පළමු භාගය තුළ දී වූ රු. බිලියන 0.6 සිට 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 1.0 දක්වා සියයට 59.0 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය.සෙස් බද්දෙන් ලද ආදායම 2026 වසර සඳහා වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 90.0 න් සියයට 46.5 ක ලභාකර ගැනීමකි.

වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්දෙන් ලද ආදායම, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ලද රු. බිලියන 85.4 ට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගයේ දී රු. බිලියන 94.5 දක්වා සියයට 10.6 කින් වර්ධනය වූ අතර එය 2026 වසර සඳහා වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 190.0 න් සියයට 49.7 ක ළඟා කර ගැනීමකි. මීට ප්‍රධාන හේතුව වූයේ ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ යාම හේතුවෙන් ආනයන පරිමාවේ පුළුල් වර්ධනයක් සිදුවීමයි.

විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම 2026 වසරේ පළමු භාගය තුළ රු බිලියන 83.2 ක් දක්වා සියයට 7.2 කින් වර්ධනය විය. අර්තාපල් සහ ලොකු ඵෑණු සඳහා අදාළ බදු අනුපාත ඉහළ දැමීම සහ සහල් ආනයනය සඳහා පහසුකම් සැලසීමට පියවර ගැනීම මෙයට හේතු විය.

සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම 2025 වසරේ පළමු භාගය තුළ වූ රු. බිලියන 141.6 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 172.1 ක් දක්වා සියයට 21.5 කින් වර්ධනය වී ඇති අතර එය ආනයන සහ දේශීය ක්‍රියාකාරකම් වල වර්ධනය පිළිබිඹු කරයි. විදුලි සංදේශ සේවා පරිභෝජනය අඩුවීම හේතුවෙන් විදුලි සංදේශ බද්දෙන් ලද ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ රු. බිලියන 8.0 ට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගයේ දී රු. බිලියන 6.6 ක් දක්වා සියයට 17.3 කින් අඩු වී ඇත. සුඛෝභෝගී මෝටර් රථ බදු, ඔට්ටු ඇල්ලීම් හා සූදු බදු, කොටස් හුවමාරු බදු සහ අනෙකුත් අදාළ බදු වලින් ලද ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ රු. බිලියන 28.6 ට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගයේ දී රු. බිලියන 40.0 ක් දක්වා සියයට 39.6 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇති අතර එය 2026 වසර සඳහා වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 60.0 න් සියයට 66.5 ක් නියෝජනය කරයි.

බදු නොවන ආදායම

බදු නොවන ආදායම 2025 වසරේ පළමු භාගයේ දී ලද රු. බිලියන 169.6 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 243.6 දක්වා සියයට 43.6 කින් වර්ධනය විය. මහ බැංකුවේ ලාභ පැවරුම්, දඩ, ගාස්තු සහ අය කිරීම්, පොලී ආදායම, රජය සතු ව්‍යවසායන්ගෙන් ලද ලාභ සහ ලාභාංශ ආදායම් සහ සමාජ ආරක්ෂණ දායකත්වයන්ගෙන් ලැබුණු ඉහළ ආදායම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

2026 වසරේ පළමු භාගයේ දී දඩ, ගාස්තු සහ අයකිරීම් වලින් ලද ආදායම 2025 වසරේ සමාන කාලච්ඡේදයේ වූ රු. බිලියන 81.6 සිට රු. බිලියන 101.9 ක් දක්වා සියයට 24.9 කින් වර්ධනය විය. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව දඩ, ගාස්තු සහ අය කිරීම් වලින් ලද සමස්ත ආදායමෙන් සියයට 15.4 ක් සඳහා දායකත්වය ලබා දෙමින්, බදු නොවන ආදායම් සඳහා ප්‍රධාන දායකත්වය සපයන ආයතනයක් ලෙස පැවති අතර මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ එම දෙපාර්තමේන්තුව මගින් සපයනු ලබන සේවාවන් සඳහා, විශේෂයෙන්ම අලුතින් ආනයනය කරන ලද වාහන ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම ඉහළ යාමයි. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් උපයා ගන්නා ලද බදු නොවන ආදායම ද සුළු වශයෙන් වර්ධනය වී ඇත.

පොලී ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ලද රු. බිලියන 33.5 ට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගයේ දී රු. බිලියන 37.7 දක්වා සියයට 12.6 කින් වර්ධනය විය. රජය සතු ව්‍යවසායන්ගෙන් ලද ලාභ සහ ලාභාංශ ආදායම් 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ලද රු. බිලියන 12.2 ට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගයේ දී රු. බිලියන 12.7 දක්වා සියයට 3.7 කින් වර්ධනය විය. සමාජ ආරක්ෂණ දායකත්වයන්ගෙන් ලද ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ලද රු.බිලියන 29.5 ට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගයේ දී රු. බිලියන 33.0 දක්වා සියයට 11.5 කින් වර්ධනය විය. කුලී ආදායමෙන් ලද ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ලද රු. බිලියන 2.7 ට සාපේක්ෂව 2026 වසරේ පළමු භාගයේ දී රු. බිලියන 3.9 දක්වා සියයට 45.6 කින් වර්ධනය විය. සමස්තයක් වශයෙන් 2026 වසරේ පළමු භාගයේ දී එකතු කරන ලද බදු නොවන ආදායම 2026 වසර සඳහා වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 360.0 න් සියයට 67.7 ක ළඟාකර ගැනීමකි.

රු. බිලියන

අයිතමය	2025 ජනවාරි - ජූනි	2026 වාර්ෂික ඇස්තමේන්තුව	2026 (අ) ජනවාරි - ජූනි	විචලනය සඳහා ප්‍රධාන හේතු
ආදායම් බද්ද	488.5	1,210.0	568.4	වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 47.0 ක් ලභාකරගනිමින් 2026 මුල් මාස හය තුළ ආදායම් බදු ආදායම රු. බිලියන 568.4 දක්වා සියයට 16.3 කින් වර්ධනය වී ඇත. මෙම ආදායම් කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් පහත සඳහන් හේතු බලපා ඇත. - 2025 වසරේ අප්‍රේල් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි මත්පැන්, දුම්කොළ සහ සූදු සහ ඔට්ටු ඇල්ලීමේ කර්මාන්ත සඳහා සංස්ථාපිත ආදායම් බදු අනුපාතය සියයට 40 සිට සියයට 45 දක්වා ඉහළ නැංවීම; - 2025 වසරේ අප්‍රේල් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි යම් විදේශ මූලාශ්‍රයකින් ලැබෙන ඉපයීම් හා ලාභ මත සියයට 15 ක ආදායම් බද්දක් පැනවීම; - 2025 වසරේ අප්‍රේල් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි පොළී මත රඳවාගැනීමේ බදු අනුපාතය සියයට 5 සිට සියයට 10 දක්වා ඉහළ නැංවීම; - රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැටුප් ඉහළයාම; - ආර්ථික ක්‍රියාකාරකම් හී පුළුල් වීම පිළිබිඹු කරමින් 2026 වසරේ මුල් භාගයේදී දළ දේශීය නිෂ්පාදිතය සියයට 4.7 කින් වර්ධනය වීම; සහ - බදු පරිපාලන ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම තුළින් බදු පදනම පුළුල් කිරීම පිළිඹිබු කරමින් 2025 වසරේ ජූනි මාසය අවසාන වනවිට 1,255,384 ක් වූ ලියාපදිංචි ආදායම් බදු ලිපිගොනු සංඛ්‍යාව 2026 වසරේ ජූනි මස අවසාන වන විට 1,406,497 ක් දක්වා සියයට 12.0 කින් වර්ධනය වීම; කෙසේ වුවද, 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2026 වසරේ පළමු මාස හය තුළ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දෙන් ලද ආදායම සියයට 4.5 කින් ඉහළ ගියද, 2025 වසරේ අප්‍රේල් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි වසරකට රු. මිලියන 1.2 ක් ව පැවති බදු නිදහස් සීමාව වසරකට රු. මිලියන 1.8 දක්වා වැඩි කිරීම සහ සියයට 18 බදු ස්ථරය පුළුල් කිරීමේ සංයුක්ත බලපෑම සමස්ත ආදායම් බදු එකතුවීම පහළ අගයක් ගැනීමට හේතු වී ඇත.

රු. බිලියන

අයිතමය	2025 ජනවාරි - ජූනි	2026 වාර්ෂික ඇස්තමේන්තුව	2026 (අ) ජනවාරි - ජූනි	විචලනය සඳහා ප්‍රධාන හේතු
එකතු කළ අගය මත බද්ද	787.3	1,812.0	987.6	2026 වසරේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 54.5 ලභාකරගනිමින් 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 787.3 හා සැසඳීමේදී 2026 වසරේ මුල් මාස හය තුළ රු. බිලියන 987.6 ක් දක්වා එකතු කළ අගය මත බදු ආදායම සියයට 25.4 කින් වර්ධනය වී ඇත. මෙම කාර්යසාධනය සඳහා පහත සඳහන් හේතු ප්‍රධාන වශයෙන් බලපා ඇත. - ආනයනික රෙදි පිළි සඳහා පැවති ශූන්‍ය එකතු කළ අගය මත බදු අනුපාතය 2026 වසරේ අප්‍රේල් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කර ඒ සඳහා සම්මත එකතු කළ අගය මත බදු අනුපාතයක් පැනවීම; - 2026 වසරේ මුල් මාස හය තුළ මුලු භාණ්ඩ ආනයන වටිනාකම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඇ.ඩො. බිලියන 12.4 දක්වා සියයට 26.9 කින් ඉහළ යාම; - ආර්ථික ක්‍රියාකාරකම් හි පුළුල් වීම පිළිඹිබු කරමින් 2026 වසරේ මුල් භාගයේදී දළ දේශීය නිෂ්පාදිතය සියයට 4.7 කින් වර්ධනය වීම; - 2026 වසරේ පළමු මාස හය තුළ ආනයනය කරන ලද මෝටර් රථ ප්‍රමාණය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව 313,480 දක්වා සියයට 255.7 කින් ඉහළ යාම; සහ - බදු පරිපාලන ක්‍රියාමාර්ගයන්හී සහාය තුළින් එකතු කළ අගය මත බදු අනුකූලතාවය වැඩිදියුණු වීම පිළිඹිබු කරමින් 2026 වසරේ ජූනි මස අවසන් වන විට ලියාපදිංචි බදු ගෙවන්නන් සංඛ්‍යාව 2025 වසරේ ජූනි අවසන් වන විට වූ 27,596 ට සාපේක්ෂව 37,027 ක් දක්වා සියයට 34.2 කින් ඉහළ යාම.
නිෂ්පාදන බද්ද	399.2	834.0	562.7	වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 67.5 ක් ලභාකර ගනිමින් 2026 වසරේ මුල් මාස හය තුළ නිෂ්පාදන බද්දෙන් ලද ආදායම පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී රු. බිලියන 562.7 ක් දක්වා සියයට 41.0 කින් වර්ධනය වී ඇත. මෙම ශක්තිමත් ඉහළ කාර්සාධනය සඳහා ප්‍රධාන වශයෙන් පහත හේතු බලපා ඇත. - 2026 වසරේ මුල් මාස හය තුළ මත්පැන් නිෂ්පාදනය 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව නිරපේක්ෂ ලීටර් මිලියන 19.7 ක් දක්වා සියයට 13.3 කින් ඉහළයාම; - 2025 වසරේ පෙබරවාරි මස සිට බලපැවැත්වෙන පරිදි සියලුම වර්ගයේ මෝටර් රථ ආනයන සඳහා පැවති ආනයන සීමා ඉවත් කිරීම හේතුවෙන් මෝටර් රථවාහන මත වූ නිෂ්පාදන බදු ආදායම වර්ධනය වීම; - 2026 වසරේ පළමු මාස හය තුළ ආනයනය කළ මෝටර් රථ සංඛ්‍යාව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව 313,480 දක්වා සියයට 255.7 කින් ඉහළ යාම; සහ - සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී දුම්වැටි අලෙවිය දුම්වැටි මිලියන 921.7 දක්වා සියයට 2.4 කින් වර්ධනය වීම හේතුවෙන් දුම්වැටි මගින් ලද නිෂ්පාදන බදු ආදායම සියයට 31.1 කින් වර්ධනය වීම. කෙසේවුවද, සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී බණිජතෙල් මත වූ නිෂ්පාදන බදු ආදායම මෙන්ම පාම් තෙල් , මේද අම්ල, ශීතකරණ හා පැණි බීම වර්ග වැනි අනෙකුත් නිෂ්පාදන මත අයකරනු ලබන නිෂ්පාදන බදු ආදායම පිළිවෙලින් සියයට 14.5 කින් සහ සියයට 6.5 කින් අඩු වී ඇති අතර එය සමස්ත නිෂ්පාදන බදු ආදායම් කාර්යසාධනයට සෘණාත්මකව බලපෑම් එල්ලකර ඇත.

රු. බිලියන

අයිතමය	2025 ජනවාරි - ජූනි	2026 වාර්ෂික ඇස්තමේන්තුව	2026 (අ) ජනවාරි - ජූනි	විචලනය සඳහා ප්‍රධාන හේතු
රේගු ආනයන බද්ද	94.0	235.0	153.7	2026 වසරේ මුල් මාස හය තුළ රේගු ආනයන බද්දෙන් ලද ආදායම 2026 වසරේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 65.4 ක් ලෙස වාර්තා වී ඇත. මෙම ඉහළ ප්‍රතිඵලය ලබා ගැනීමට බලපෑ ප්‍රධාන හේතු පහත දැක්වේ. - මෝටර් රථ ආනයන මත රේගු ආනයන බද්දක් හඳුන්වාදීම සමඟින් මෝටර් රථවාහන සඳහා අදාළ වන රේගු ආනයන බදු මත සියයට 50 ක අධිභාරයක් පැනවීම; - 2026 වසරේ පළමු මාස හය තුළ ආනයනය කළ මෝටර් රථ සංඛ්‍යාව 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව 313,480 දක්වා සියයට 255.7 කින් ඉහළ යාම; - 2026 වසරේ අප්‍රේල් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි දැනට පවත්නා සියයට 0, සියයට 15, සහ සියයට 20 යන ආනයන බදු අනුපාතයන් සියයට 0, සියයට 10, සියයට 20 සහ සියයට 30 ලෙස සංශෝධනය කරමින් කාණ්ඩ හතරේ තීරුබදු ව්‍යුහයක් හඳුන්වාදීම; සහ - 2026 වසරේ මුල් මාස හය තුළ ආනයන 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 26.9 කින් වර්ධනය වීම.
වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද	85.4	190.0	94.5	2026 වසරේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 49.7 ක් ලෙස කරගනිමින් 2026 වසරේ මුල් මාස හය තුළ වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්දෙන් ලද ආදායම රු. බිලියන 94.5 දක්වා සියයට 10.6 කින් වර්ධනය වී ඇත. මෙම වර්ධනය සඳහා මූලික වශයෙන් හේතු වූයේ; - 2026 වසරේ මුල් මාස හය තුළ මුළු ආනයන වටිනාකම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඇ.ඩො. බිලියන 12.4 දක්වා සියයට 26.9 කින් වර්ධනය වීම.
විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද	77.6	129.0	83.2	2026 වසරේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 64.5 ලෙස කරගනිමින් 2026 වසරේ මුල් මාස හය තුළදී විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව රු. බිලියන 83.2 දක්වා සියයට 7.2 කින් මධ්‍යස්ථ ලෙස වර්ධනය වී ඇත. මෙම කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ; - 2025 වසරේ අගෝස්තු මස 26 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලොකු ඒෑණු සඳහා වන බදු අනුපාතය කිලෝග්‍රෑමයකට රු. 10 සිට කිලෝග්‍රෑමයකට රු. 50 දක්වා සහ අර්තාපල් සඳහා වන බදු අනුපාතය කිලෝග්‍රෑමයකට රු. 60 සිට කිලෝග්‍රෑමයකට රු. 80 දක්වා ඉහළ නැංවීම
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද	141.6	333.0	172.1	2026 වසරේ මුල් මාස හය තුළ සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම 2026 වසරේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 51.7 ක් ලෙස කරගෙන ඇත. මෙම කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ; - ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් වීම පිළිඹිබු කරමින් 2026 වසරේ මුල් භාගයේදී දළ දේශීය නිෂ්පාදිතය සියයට 4.7 කින් වර්ධනය වීම; - 2026 වසරේ මැයි මස 01 වන දින සිට ක්‍රියාත්මකවන පරිදි මෝටර් රථ ආනයනය කරනු ලබන අවස්ථාවේදී සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද පැනවීම; සහ - 2026 මුල් මාස හය තුළ මුළු ආනයන වටිනාකම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඇ.ඩො. බිලියන 12.4 දක්වා සියයට 26.9 කින් වර්ධනය වීම.

රු. බිලියන

අයිතමය	2025 ජනවාරි - ජූනි	2026 වාර්ෂික ඇස්තමේන්තුව	2026 (අ) ජනවාරි - ජූනි	විචලනය සඳහා ප්‍රධාන හේතු
වෙනත් බදු	78.5	167.0	88.5	2026 වසර සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 53.0 ක් ලභාකරගනිමින් 2026 වසරේ මුල් මාස හය තුළ වෙනත් බදු වලින් ලද ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී රු. බිලියන 88.5 ක් දක්වා සියයට 12.7 කින් වර්ධනය වී ඇත. මේ සඳහා මූලික වශයෙන් හේතුවූයේ; - ආනයන ඉහළ යාම හේතුවෙන් සෙස් බද්දෙන් ලද ආදායම සියයට 1.0 කින් වර්ධනය වීම; - මෝටර් රථ ආනයන සඳහා පැවති සීමාවන් ඉවත් කිරීමත් සමගින් 2026 වසරේ මුල් මාස හය තුළ මෝටර් රථ මත සුඛෝපභෝගී බද්දෙන් ලද ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයේ වූ රු. බිලියන 11.4 සිට රු. බිලියන 21.9 දක්වා වර්ධනය වීම; කෙසේ වුවද, විදුලි සංදේශ සේවා පරිභෝජනය අඩුවීම හේතුවෙන් 2026 වසරේ මුල් මාස හය තුළ විදුලි සංදේශ බද්දෙන් ලද ආදායම සියයට 17.3 කින් පහළ යාම වෙනත් බදු ආදායමේ කාර්යසාධනය යම් ප්‍රමාණයකට අඩුවීම සඳහා හේතු වී ඇත.
බදු නොවන ආදායම	169.6	360.0	243.6	2026 වසරේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 67.7 ක් ලභාකරගනිමින් 2026 වසරේ පළමු මාස හය තුළ බදු නොවන ආදායම 2025 වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී සියයට 43.6 කින් වර්ධනය වී ඇත. මෙම ශක්තිමත් කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන් මහ බැංකු ලාභ පැවරුම්, පොලී ආදායම, සමාජ ආරක්ෂණ දායකත්ව ආදායම් ලැබීම්, දඩ මුදල්, ගාස්තු සහ අය කිරීම්, කුලී ආදායම් සහ රජය සතු ව්‍යවසායන් මඟින් ලද ලාභ හා ලාභාංශ ආදායම් ඉහළයාම බලපා ඇත.
එකතුව	**2,321.7**	**5,270.0**	**2,954.2**	

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී.

(අ) තාවකාලික

2.1 විශේෂ සටහන | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2026 ජනවාරි - ජූනි

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ග
ආදායම් බද්ද - 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට සංශෝධන	
2026.06.03	2026 අංක 11 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත - 2025 සහ 2026 අයවැය මගින් යෝජනා කරන ලද බදු සංශෝධන ක්‍රියාත්මක කිරීම සඳහා 2026 අංක 11 දරන දේශීය ආදායම් (සංශෝධන) බලාත්මක කරන ලදී. • ඇස්තමේන්තුගත ගෙවිය යුතු බදු ප්‍රකාශය (SET) ගොනු කිරීමේ අවශ්‍යතාවය 2025/2026 තක්සේරු වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කිරීම. • පුද්ගලයෙකු විසින් ගෙවිය යුතු එක් එක් බදු වාරිකයක වටිනාකම එම පුද්ගලයා විසින් පෙර තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ආදායම් බද්ද මත පදනම්ව ගණනය කිරීම. • ගුවන් යානා, මෘදුකාංග බලපත්‍ර හෝ සම්බන්ධිත සේවාවන් සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් නිර්වාසික පුද්ගලයන් හට කරන ගෙවීම් ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

2.1 විශේෂ සටහන | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2026 ජනවාරි - ජූනි (සම්බන්ධිතයි .....)

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ග
2026.06.03	• ජීවිත රක්ෂණ ඔප්පු වලින් ලැබෙන මුදල් මත ආදායම් බදු අය කෙරෙන ආකාරය පැහැදිලි කිරීම. ඒ අනුව, රක්ෂිත පුද්ගලයාගේ මරණයේදී, රක්ෂණ ඔප්පුවේ කල්පිරීමේදී හෝ පවාරන අගයක් අත්කර ගැනීමේ දී, ජීවිත රක්ෂණ ඔප්පුවක් යටතේ පුද්ගලයෙකු විසින් ලබන එම මුදල් තක්සේරු ආදායම ගණනය කිරීමේ දී බැහැර කරන ලදී. කෙසේ වෙතත්, ජීවිත රක්ෂණ ඔප්පුව යටතේ සිදු කරන යම් වාර්ෂික දීමනා, විශ්‍රාම වැටුප්, විශ්‍රාම දීමනා හෝ ඒ හා සමාන ගෙවීම් තක්සේරු කළ හැකි ආදායමෙන් බැහැර කර නොමැත. • ශ්‍රී ලංකා රජයට හෝ 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ ස්ථාපිත හෝ ස්ථාපිත කර ඇති බවට සැලකෙන විශ්ව විද්‍යාලයකට තෑග්ගක් හෝ පරිත්‍යාගයක් ලෙස වත්කමක් පැවරීමෙන් ලැබෙන මුදල, වත්කම මාරු කිරීමට වහාම පෙරාතුව පැවති එහි ශුද්ධ පිරිවැයට සමාන ලෙස සැලකීම. • පුද්ගලයන්ට සහ හවුල්කාරිත්වයන්ට අදාළ වන ප්‍රාග්ධන ලාභ බදු අනුපාතය සියයට 10 සිට සියයට 15 දක්වා වැඩි කිරීම. අනෙකුත් සියලුම ආයතන සඳහා අදාළ වන ප්‍රාග්ධන ලාභ බදු අනුපාතය සියයට 30 කි. • බදු වාසිකභාවය පිළිබඳ වන නීති පහත පරිදි සංශෝධනය කිරීම: - i. විශේෂිත නේවාසික වීසා බලපත්‍රයක් ඇති යම් පුද්ගලයෙකු ආදායම් බදු කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ වාසිකයෙකු ලෙස නොසැලකේ. ii. ශ්‍රී ලංකා ධජය සහිත යාත්‍රාවක සේවය කරන පුද්ගලයෙකු ශ්‍රී ලංකාවේ වාසිකයෙකු ලෙස සලකනු ලබන්නේ ඔවුන් යාත්‍රාවේ සේවය කරන කාලය සඳහා පමණි. iii. ශ්‍රී ලංකා ධජය සහිත යාත්‍රාවක සේවය කරන විදේශීය පුරවැසියෙකු ආදායම් බදු ගෙවනු ලබන්නේ එම රැකියාවෙන් ලැබෙන ආදායම මත පමණක් වන අතර වෙනත් කිසිදු විදේශීය ආදායමක් මේ සඳහා අයත් නොවේ. • කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි ආදායම, බද්දෙන් නිදහස් මුදල් ප්‍රමාණ, රඳවා ගැනීමේ බදු සහ වෙනත් යම් තොරතුරු ඇතුළත් සහතිකයක් ඒකක භිමියන්ට ලබා දීමට අපොහොසත් වන ඕනෑම ඒකක භාරයක් හෝ අන්‍යෝන්‍ය අරමුදලක් ශ්‍රී ලංකාවේ වාසික සමාගමක් ලෙස සලකනු ලැබීම, වාසික සමාගම් සඳහා අදාළ වන පනතේ විධිවිධාන ඒ අනුව අදාළ වේ. • තක්සේරු වර්ෂයේදී සම්පූර්ණයෙන්ම අඩු කළ නොහැකි රජයට හෝ රජය විසින් ස්ථාපිත අරමුදල්වලට ලබා දෙන ඕනෑම පරිත්‍යාගයක් ඊළඟ වසරවලදී සුදුසුකම් ලත් අඩු කිරීම් ලෙස ඉදිරියට ගෙන යාමට අවසර දෙනු ලැබීම. • 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ සහ 2022 අංක 14 දරන අධිභාර බදු පනතේ විධිවිධාන යටතේ පනවන ලද පොලිය නිදහස් කිරීම. • වැඩි කළ ප්‍රාග්ධන දීමනා සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම ආයෝජනය ඇමරිකානු ඩොලර් මිලියන 3 සිට ඇමරිකානු ඩොලර් 250,000 දක්වා අඩු කිරීම. • අනෙකුත් පරිපාලන විධිවිධාන ඉහත සංශෝධන වලට අමතරව, අනුකූලතාව වැඩි දියුණු කිරීම, ක්‍රියා පටිපාටි විධිමත් කිරීම සහ බදු පරිපාලනයේ කාර්යක්ෂමතාවය සහ සඵලදායිතාවය ශක්තිමත් කිරීම අරමුණු කරගත් විවිධ පරිපාලන ප්‍රතිසංස්කරණ දේශීය ආදායම් පනත් කෙටුම්පතට ඇතුළත් කර ඇත.
මුද්දර ගාස්තු - 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත	
2026.02.24	2026.02.24 දිනැති අංක 2477/22 දරන ගැසට් නිවේදනය - ආපදාවලින් පීඩාවට පත් පුද්ගලයින් සඳහා ආපදා සහන දීමනා මත අදාල වන මුද්දර ගාස්තු ගෙවීමේ දී, රජය විසින් ගෙවනු ලබන රු. 25,000/= ඉක්මවන ගෙවීම් සඳහා නිකුත් කරන ලද රිසිට්පත් මත අය කරන ලද රු. 25/= ක මුද්දර ගාස්තුව නිදහස් කිරීම.

2.1 විශේෂ සටහන | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2026 ජනවාරි - ජූනි (සම්බන්ධිතයි .....)

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ග
ඔටවු ඇල්ලීම සහ සූදු බද්ද - 1988 අංක 40 දරන ඔටවු ඇල්ලීම සහ සූදු බදු පනත	
2025.12.17 බ.පැ. 2026.01.01	2025 අංක 25 දරන **ඔටවු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත** - 2025 අයවැය කතාවේ යෝජනා කර ඇති පරිදි පහත සඳහන් ආදායම් පියවරයන් බලාත්මක කිරීම සඳහා 1988 අංක 40 දරන ඔටවු ඇල්ලීමේ සහ සූදු බදු පනත සංශෝධනය කරන ලදී. • දළ එකතු කිරීමේ බද්ද සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි කිරීමට; සහ • ශ්‍රී ලාංකික පුරවැසියන් මත පනවා ඇති කැසිනෝ ප්‍රවේශ බද්ද ඇමරිකානු ඩොලර් 50 සිට ඇමරිකානු ඩොලර් 100 දක්වා වැඩි කිරීම.
සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත	
2026.04.09 බ.පැ. 2026.07.01 බ.පැ. 2026.05.01	2026 අංක 10 දරන **සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත** • 2026 ජූලි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) සඳහා ලියාපදිංචි වීමේ වාර්ෂික පිරිවැටුම් සීමාව රුපියල් මිලියන 60 සිට රුපියල් මිලියන 36 දක්වා අඩු කිරීම; සහ • 2026 මැයි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, වාහන ආනයනය කිරීමේ දී හෝ නිෂ්පාදනය කර විකිණීමේ දී සමාජ ආරක්ෂණ දායකත්ව බදු අය කිරීම සහ, අදාළ වාහන අලෙවියෙන් පසු අවස්ථාවේදී සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් නිදහස් කිරීම.
එකතු කළ අගය මත බද්ද - 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත	
2026.04.01	2026.03.03 දිනැති අංක 2478/07 දරන ගැසට් නිවේදනය - ආනයනික රෙදි මත වන ශුන්‍ය අනුපාත එකතු කළ අගය මත බද්ද ඉවත් කර සම්මත එකතු කළ අගය මත බද්ද අය කිරීම.
2026.06.30	2026 අංක 14 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත පහත දැක්වෙන ප්‍රධාන පියවරයන් ක්‍රියාත්මක කිරීම සඳහා 2026 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කරන ලදී. • නිර්වාසික සැපයුම්කරුවන් විසින් ඉලෙක්ට්‍රොනික වේදිකා හරහා සේවා සැපයීම සඳහා එකතු කළ අගය මත බද්ද පැනවීම ක්‍රියාත්මක වන දිනය 2026 ජූලි 01 වන දින දක්වා කල් දැමීම. • නිර්වාසික සැපයුම්කරුවන් විසින් ඩිජිටල් වේදිකා හරහා සේවා සැපයීම සඳහා එකතු කළ අගය මත බද්ද පැනවීම සඳහා ලියාපදිංචි කිරීමේ, අය කිරීමේ, එකතු කිරීමේ, වාර්තා ගොනු කිරීම යනාදියට අදාළ විධිවිධාන හඳුන්වාදීම. • සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) ඉවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මුදල් ආපසු ගෙවීමේ ක්‍රියාවලිය පහසු කිරීමට එකතු කළ අගය මත බදු පනතට සංශෝධන ඇතුළත් කිරීම. • චිත්‍රපට ප්‍රදර්ශන සේවා සැපයුමේ වටිනාකම තීරණය කිරීමේදී පළාත් පාලන ආයතන විසින් අය කරනු ලබන විනෝද බද්ද අඩු කිරීම සඳහා ඉඩදීම. • දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ වාර්තාවලට අනුව සුනාමි ව්‍යාපෘතිවල ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් විසින් සිදු කරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් වන හිඟ එකතු කළ අගය මත බදු මුදල් කපා හැරීම. • නැවත අපනයනය කිරීමේ පදනම මත ව්‍යාපෘති සඳහා ආනයනය කරන ලද යන්ත්‍ර, උපකරණ හෝ වාහන වැනි ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය කරන අවස්ථාවේ අත්හිටුවන ලද එකතු කළ අගය මත බද්ද, එකඟ වූ පරිදි එම භාණ්ඩ නැවත අපනයනය නොකළහොත් යෙදවුම් බදු ලෙස අඩු කිරීමට ඉඩ නොදීම.

2.1 විශේෂ සටහන | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2026 ජනවාරි - ජුනි (සම්බන්ධිතයි .....)

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ග
	• නියම කරනු ලබන දිනක සිට මාස තුනක් ඇතුළත එකතු කළ අගය මත බදු ලියාපදිංචි පුද්ගලයින් විසින් විකුණුම් ස්ථාන (POS) යන්ත්‍ර භාවිතය සහ ක්‍රියාත්මක කිරීම අනිවාර්ය කිරීම. • සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) ඉවත් කිරීමට සමගාමීව මූල්‍ය සේවා සඳහා වන වත්මන් එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 20.5 දක්වා වැඩි කිරීම. • එකතු කළ අගය මත බදු පනත යටතේ සිදු කරන ලද වැරදි සඳහා අපරාධ නඩු විධිවිධාන සහ දඩුවම් හඳුන්වාදීම. • ලාභාංශ ආදායම මත මූල්‍ය සේවා සැපයීම සඳහා වන එකතු කළ අගය මත බද්දේ ප්‍රතිපත්තිමය අභිප්‍රාය පැහැදිලි කිරීම.
නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද - 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත	
2026.04.01	2026.03.03 දිනැති අංක 2478/06 දරන ගැසට් නිවේදනය - අලුතින් නිර්මාණය කරන ලද ජාතික උප බෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සඳහා , දැනට අදාළ සංයෝජිත වර්ගීකරණය යටතේ ශීර්ෂය/ උප-බෙදීමට බලපැවැත්වෙන අනුපාත පදනම් කරගෙන නිෂ්පාදන බද්ද පැනවීම.
සුරා බද්ද - සුරාබදු ආඥා පනත (52 වන අධිකාරය)	
2025.12.12	සුරාබදු නිවේදන අංක 03/2025 (2025.12.11 දිනැති අංක 2466/22 දරන ගැසට් නිවේදනය) - වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තුව සහ ආරක්ෂිත ඇප තැන්පතු මුදල සංශෝධනය කිරීම සහ කර්මාන්ත ප්‍රවේශය සඳහා එක් වරක් අයකරනු ලබන ගාස්තුවක් පැනවීම.
වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද- 2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත	
2026.04.01	2026.03.03 දිනැති අංක 2478/05 දරන ගැසට් නිවේදනය - අලුතින් නිර්මාණය කරන ලද ජාතික උප බෙදුම් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සඳහා, දැනට අදාළ සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය/ උප-බෙදීමට බලපැවැත්වෙන අනුපාත පදනම් කරගෙන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පැනවීම.
සෙස් බද්ද - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත	
2026.04.01	2026.03.03 දිනැති අංක 2478/04 දරන ගැසට් නිවේදනය - අලුතින් නිර්මාණය කරන ලද හෝ සංශෝධිත නව ජාතික උප බෙදුම් සංකේතාංක සඳහා සෙස් බද්ද පැනවීම.
2026.04.01	2026.03.10 දිනැති අංක 2479/38 දරන ගැසට් නිවේදනය - 2026 අයවැය කතාවේ යෝජනා පරිදි ආනයනික රෙදි මත වන සෙස් බද්ද ඉවත් කිරීම. - සංවර්ධන ප්‍රතිපත්ති මෙහෙයුමට අනුකූලව අතරමැදි යෙදවුම් සඳහා සෙස් අනුපාතය සියයට 50 කින් අඩු කිරීම.
රේගු ආනයන බද්ද - 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත	
2026.04.01	ආදායම් සංරක්ෂණ ආඥා අංක 01/2026 (2026.03.03 දිනැති අංක 2478/03 දරන ගැසට් නිවේදනය) - 2026 අප්‍රේල් මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, එතෙක් පැවති, සියයට 0, සියයට 15 සහ සියයට 20 රේගු ආනයන තීරු බදු අනුපාත සියයට 0, සියයට 10, සියයට 20 සහ සියයට 30 දක්වා සංශෝධනය කරමින්, සිව්-වැදෑරුම් රේගු ආනයන තීරු බදු ව්‍යුහයක් හඳුන්වා දීම.
රේගු අධිභාරය - රේගු ආඥාපනත (235 වන අධිකාරය)	
2026.02.01	2026.01.31 දිනැති අංක 2473/31 දරන ගැසට් නිවේදනය - මෝටර් රථ වාහන ආනයනය කිරීමේදී පනවා ඇති සියයට 50 ක අධිභාරය, 2026 දෙසැම්බර් මස 31 දින දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.

2.1 විශේෂ සටහන | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2026 ජනවාරි - ජූනි (සම්බන්ධිතයි .....)

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ග
2026.04.01	2026.03.12 දිනැති අංක 2479/55 දරන ගැසට් නිවේදනය - 2026 අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රේගු ආනයන බද්ද සියයට 20 සිට සියයට 30 දක්වා වැඩි කිරීම සැලකිල්ලට ගනිමින්, මෝටර් රථ වාහන ආනයනය කිරීමේදී පනවා තිබූ සියයට 50 ක අධිභාරය ඉවත් කිරීම.
2026.05.16	2026.05.15 දිනැති අංක 2488/56 දරන ගැසට් නිවේදනය - මෝටර් රථ වාහන ආනයනය කිරීමේදී පනවා ඇති සියයට 15 ක අධිභාරය 2026 මැයි මස 16 දින සිට මාස 03 ක කාල සීමාවක් සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
2026.05.18	2026.05.17 දිනැති අංක 2488/69 දරන ගැසට් නිවේදනය - මෝටර් රථ වාහන ආනයනය සඳහා 2026 මැයි මස 15 හෝ ඊට පෙර ස්ථාපිත ණයවර ලිපි සඳහා ලබා දී ඇති සහනය අවභාවිත කිරීම වැළැක්වීම.
විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද - 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත	
2026.01.01	2025.12.31 දිනැති අංක 2469/12 දරන ගැසට් නිවේදනය - ආනයනික අයිතම 62 ක් සඳහා පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය 2026 දෙසැම්බර් මස 31 දින දක්වා දීර්ඝ කිරීම.
2026.04.01	2026.03.31 දිනැති අංක 2482/09 දරන ගැසට් නිවේදනය - 2026 අප්‍රේල් මස 01 දින සිට 2026 දෙසැම්බර් මස 31 දින දක්වා ක්‍රියාත්මක වන පරිදි දේශීය පොල්තෙල් නිෂ්පාදනය සඳහා විජලනය කළ පොල් කැබලි ආනයනය කිරීමේදී සහ ඖෂධ නිෂ්පාදන කටයුතු සඳහා ලුණු ආනයනය කිරීමේදී, නිශ්චිත නියාමන අනුමැතීන්ට යටත්ව, අදාළ බද්දේ ඉතිරි කොටස නිදහස් කරමින් සහනදායී විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් ලබා දීමට අවසර දීම.
2026.05.05	2026.05.04 දිනැති අංක 2487/02 දරන ගැසට් නිවේදනය - ආහාර ප්‍රතිපත්ති සහ සුරක්ෂිතතා කමිටුවේ නිර්දේශය සැලකිල්ලට ගනිමින්, බඩ ඉරිඟු ආනයනය මත පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2026 දෙසැම්බර් මස 31 දින සිට වැඩි කිරීම.
ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි - 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත	
2026.03.23	2026 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2026.03.23 දිනැති අංක 2481/02 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - අන්තර්ජාතික ගුවන් සේවා සපයන ශ්‍රී ලංකාවේ ගුවන් සේවා සමාගම් වෙත සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 4012.13 යටතේ වර්ගීකරණය කර ඇති සහ අන්තර්ජාතිකව පිළිගත් ගුවන් සේවා අධිකාරීන් විසින් නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූල වන නැවත අඩිය පිරවූ ගුවන් යානා ටයර් කොන්දේසි සහිතව ආනයනය කිරීම සඳහා අවසර ලබා දීම.
2026.04.01	2026 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2026.03.31 දිනැති අංක 2482/08 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - 2026 මාර්තු 03 දිනැති අංක 2478/03 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද ආදායම් සංරක්ෂණ නියෝග මගින් ප්‍රකාශයට පත්කර ඇති සංයෝජිත වර්ගීකරණ සංකේතාංකවල ජාතික උප බෙදීම්වලට අනුකූලව 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි යාවත්කාලීන කිරීම.

2.1 විශේෂ සටහන | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2026 ජනවාරි - ජූනි (සම්බන්ධිතයි .....)

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ග
2026.04.02	2026 අංක 03 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2026.04.02 දිනැති අංක 2482/12 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය) - පිළිවෙළින් සම්බා සහ කීරි සම්බා සඳහා ආදේශක සේ සළකණු ලබන සහ සංයෝජිත වර්ගීකරණ කේතාංක 1006.30.29 යටතේ වර්ගීකරණය කර ඇති පොන්නි සම්බා සහ කීරි/පාල් පොන්නි සහල් ඇතුළුව GR 11 සහල් ලෙස හඳුන්වන සහල් වර්ගය ආනයනය කිරීමේදී පැවති ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය 2026 අප්‍රේල් 30 වන දින දක්වා ඉවත් කිරීම.
2026.06.06, 2028.01.01	2026 අංක 04 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2026.05.07 දිනැති අංක 2487/29 දරන අති විශේෂ ගැසට් පත්‍රය) - 2026 ජූනි 06 වන දින සිට බලපැවැත්වෙන පරිදි සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ 84.15, 84.18, 84.19, 84.79, 87.04 සහ 87.07 යටතේ වර්ගීකරණය කරන ලද සහ හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) සමඟ පමණක් ක්‍රියා කරන ශීතකරණ සහ වායු සමීකරණ උපකරණ සහ උපාංග ආනයනය තහනම් කිරීම, සහ 2028 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි එවැනි ශීතකරණ සහ වායු සමීකරණ උපකරණ සහ උපාංග සඳහා ශීතකරණ පද්ධතියේ සංරචකයක් ලෙස භාවිතා කරන සහ හයිඩ්‍රොක්ලෝරෝෆ්ලෝරෝකාබන් (HCFCs) සමඟ පමණක් ක්‍රියා කරන සංයෝජිත වර්ගීකරණ කේත 8414.30 යටතේ වර්ගීකරණය කරන ලද සම්පීඩක ආනයනය තහනම් කිරීම.
2026.06.15	2026 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2026.06.15 දිනැති අංක 2493/03 දරන අති විශේෂ ගැසට් පත්‍රය) - සංයෝජිත වර්ගීකරණ කේත පනස් පහක් (55) යටතේ වර්ගීකරණය කර ඇති ලෝහ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම සඳහා අපනයන පාලන බලපත්‍ර (ECL) අවශ්‍යතාව පැනවීම.
2026.06.19	2026 අංක 06 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2026.06.18 දිනැති අංක 2493/39 දරන අති විශේෂ ගැසට් පත්‍රය) - භාණ්ඩ ආනයනය කිරීමේ ගෙවීම් ක්‍රම වලට අදාළ රෙගුලාසි, පහත සඳහන් කරුණු අනිවාර්ය කරමින් සංශෝධනය කිරීම; • සියලුම බැංකු විසින් එක් එක් ගනුදෙනුව සඳහා අනන්‍ය අංකයක් ලබා දීම සහ එලෙස ලබා දෙන ලද අංකයට අදාළ හෝ ඒ යටතේ සිදු කරනු ලබන එක් එක් ගනුදෙනුව සම්බන්ධ අදාළ ප්‍රේෂණකරුගේ (ආනයනකරුගේ) වලංගු බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය, ප්‍රේෂණකරුගේ (ආනයනකරුගේ) ලිපිනය, ප්‍රතිලාභියාගේ ලිපිනය, ප්‍රතිලාභියාගේ ගිණුම් අංකය, බැංකු කේතය, ශාඛා කේතය, විදේශ මුදල් වර්ගය සහ ප්‍රමාණය, ගෙවීම් ක්‍රමය, භාරදීමේ කොන්දේසි, ප්‍රේෂණය සිදුකළ දිනය, නාමමාත්‍ර ඉන්වොයිසි අංකය, සහ භාණ්ඩ පිළිබඳ විස්තරය යන තොරතුරු ඇතුළුව සියලුම තොරතුරු ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත වහාම දැනුම් දීම. • පෙර ගෙවීම් සිදු කිරීමට ප්‍රථම, ආනයනකරු විසින් පෙර ගෙවීමක් සිදු කිරීම සඳහා සුදුසුකම් ලත් ආනයනකරුවෙකු ලෙස ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වීම.
අපගමන බද්ද - 2003 අංක 25 දරන මුදල් පනත	
2025.12.29	2025.12.29 දිනැති අංක 2469/03 දරන ගැසට් නිවේදනය - මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ සිට ගුවන් යානයකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන සෑම තැනැත්තෙක්ම සඳහා, බදු නිදහස් කිරීමේ කාලය 2025 දෙසැම්බර් මස 29 දින සිට 2027 ජූනි මස 26 දින දක්වා මාස 18 දීර්ඝ කිරීම.
ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති- 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත	
2026.02.08	2026.02.08 දිනැති අංක 2474/66 දරන ගැසට් නිවේදනය - ව්‍යාපෘති, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනා ගැනීම සඳහා වන සුදුසුකම් ලැබීමේ නිර්ණායක ප්‍රකාශයට පත් කිරීම සහ අදාළ වන බදු නිදහස් කිරීම් සහ සහන නියම කිරීම.

2.1 විශේෂ සටහන | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2026 ජනවාරි - ජූනි (සම්බන්ධිතයි .....)

ක්‍රියාත්මක වන දිනය	ක්‍රියාමාර්ග
කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත - 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත	
2026.01.20	2026 අංක 1 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව (සංශෝධන) පනත - පහත සඳහන් ප්‍රධාන පියවරයන් බලාත්මක කිරීම සඳහා 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත සංශෝධනය කරන ලදී: • කොළඹ වරාය නගරය ප්‍රදේශය තුළ සේවයේ නියුතු පුද්ගලයන්ගේ සේවා නියුක්ති ආදායම මත අදාලවන ආදායම් බදු නිදහස් කිරීම් ඉවත් කිරීම. • වාර්ෂිකව බදු ආදායම් අභිමිවීම ප්‍රකාශයට පත් කිරීම සහ ඇස්තමේන්තුගත කිරීම, අනිවාර්ය සංස්ථාපිත ආදායම් බදු වාර්තා ගොනු කිරීම සහ තවදුරටත් කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විසින් කාර්ය සාධන ඉලක්ක (රැකියා, උපලබ්ධි වූ ආයෝජනය, නියම කර ඇති කාලසීමා) අධීක්ෂණය හරහා අනුකූලතාව සහ අධීක්ෂණය ශක්තිමත් කිරීම. • ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ඵලදායී බැංකු අධීක්ෂණය ඇතුළු නියාමන ක්‍රියාමාර්ග ඇතුළත් කිරීම.

2.3 රාජ්‍ය වියදම

රාජ්‍ය වියදම 2025 වසරේ පළමු මාස හය තුළ දී වූ රු. බිලියන 2,730.7 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 2,946.5 ක් දක්වා සියයට 7.9 කින් වැඩි විය. පුනරාවර්තන වියදම් 2025 වසරේ පළමු මාස හය තුළ දී වූ රු. බිලියන 2,506.8 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 2,669.9 ක් දක්වා සියයට 6.5 කින් වැඩි විය. ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම් 2025 වසරේ පළමු මාස හය තුළ දී වූ රු. බිලියන 223.9 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 276.6 ක් දක්වා සියයට 23.6 කින් වැඩි විය.

2.9 වගුව | රාජ්‍ය වියදම් කාර්ය සාධනය: 2026 ජනවාරි - ජූනි

රු.මිලියන

අයිතමය	2025	2026 (තාවකාලික)
පුනරාවර්තන වියදම්	**2,506,828**	**2,669,889**
වැටුප්	555,136	621,734
විශ්‍රාම වැටුප්	208,371	240,249
පොලී ගෙවීම්	1,264,591	1,234,580
වෙනත්	478,730	573,327
ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම්	**223,879**	**276,605**
එකතුව	**2,730,707**	**2,946,494**

මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

පොලී ගෙවීම්

දේශීය හා විදේශීය ණය සඳහා පොලී ගෙවීම් ඇතුළු සමස්ත පොලී ගෙවීම් සඳහා වියදම 2025 වසරේ පළමු මාස හයෙහි වූ රු. බිලියන 1,264.6 ට සාපේක්ෂව 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,234.6 ක් දක්වා සියයට 2.4 කින් අඩු විය. 2025 වසරේ පළමු මාස හයෙහි දේශීය ණය සඳහා වන පොලී ගෙවීම්, රු. බිලියන 1,117.5 සිට රු. බිලියන 1,075.8 දක්වා සියයට 3.7 කින් අඩු වීම හා විදේශීය ණය සඳහා වන පොලී ගෙවීම් රු. බිලියන 147.1 සිට රු. බිලියන 158.8 දක්වා සියයට 8.0 කින්, 2026 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ වැඩි වීම හේතු විය.

වැටුප් සහ විශ්‍රාම වැටුප්

පළාත් සභා ඇතුළු රාජ්‍ය සේවකයන්ගේ වැටුප් හා වේතන සඳහා වූ වියදම, 2025 වසරේ පළමු මාස හය තුළ වාර්තා වූ රු. බිලියන 555.1 හා සැසඳීමේදී, 2026 වසරේ පළමු මාස හය තුළ රු. බිලියන 621.7 දක්වා සියයට 12.0 කින් ඉහළ ගොස් ඇත. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව රාජ්‍ය සේවකයන්ගේ මූලික වැටුප වැඩි කිරීම මෙම වියදම් ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

කෙසේ වුවද, විශ්‍රාම වැටුප් සඳහා වූ වියදම 2025 වසරේ පළමු මාස හය තුළ වාර්තා වූ රු. බිලියන 208.4 හා සැසඳීමේදී, 2026 වසරේ පළමු මාස හය තුළ රු. බිලියන 240.2 දක්වා සියයට 15.3කින් ඉහළ ගොස් ඇත. 2020.01.01 දිනට පෙර විශ්‍රාම ගිය පුද්ගලයන්ට අදාළ විශ්‍රාම වැටුප් විෂමතා නිවැරදි කිරීම සඳහා රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණය මෙයට හේතු වී ඇත

සුබසාධන වියදම්

2026 වසරේ පළමු මාස හය තුළ අස්වැසුම මුදල් ප්‍රදාන, වැඩිහිටි දීමනා, වකුගඩු රෝගීන් සඳහා මුල්‍ය ආධාර, ආබාධිත පුද්ගල දීමනා, ආබාධිත රණවිරුවන්ට ආධාර, ගැබිණි මව්වරුන්ට පෝෂ්‍යදායී ආහාර පැකේජය (පෝෂණ මල්ල), පාසල් පෙළ පොත්, නිල ඇඳුම්, පොහොර සහනාධාරය ඇතුළු සමාජ සුබසාධන, සමාජ ආරක්ෂණ සහ සංවර්ධන සහායන් සඳහා වියදම් ලෙස රජය විසින් රු. බිලියන 550.8 ක් වැය දරා ඇත.

2.10 වගුව | ප්‍රධාන සුභසාධන වැඩසටහන් සඳහා වියදම්: 2026 ජනවාරි - ජුනි

රු. මිලියන

වැඩසටහනේ නම	2025	2026 (තාවකාලික)
සමාජ සුභසාධනය		
රජයේ රෝහල් සඳහා වෛද්‍ය සැපයුම් (ආයුර්වේද රෝහල් ඇතුළුව)	44,740	88,042
පාසල් ළමුන් සඳහා සෞඛ්‍ය රක්ෂණය (සුරක්ෂා)	444	386
විශ්‍රාමිකයන් සඳහා අග්‍රහාර රක්ෂණ ක්‍රමය	486	602
පෙර පාසල් ගුරුවරුන් සඳහා දීමනා	334	430
රණවිරු මාපිය රැකවරණ දීමනාව	699	705
රජයේ සේවකයින් සඳහා දේපල ණය පොලී	725	643
ආර්ථික වශයෙන් ලාභ නොලබන මාර්ග සඳහා ශ්‍රී ලංගමට ලබාදෙන සහනාධාර, සමාජීය වශයෙන් අනිවාර්ය බස් සේවා (සිසු සැරිය, ගැමි සැරිය සහ නිසි සැරිය) සහ සන්නද්ධ හමුදා නිදහස් ගමන් ප්‍රවේශපත්‍ර	1,985	1,778
1990 "සුව සැරිය" නොමිලේ ගිලන්රථ සේවාව	1,162	1,392
ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතු සඳහා පොළී ගෙවීම්	10,000	1,638
ලෝක ආහාර වැඩසටහන	110	67
වෙනත්	906	6,410
සමාජ ආරක්ෂණය		
අඩු ආදායම්ලාභී පවුල් සඳහා ආධාර	75,329	89,692
අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයින් සඳහා ආධාර	6,828	8,718
වැඩිහිටි පුද්ගලයින් සඳහා මුල්‍ය ආධාර	21,086	23,135
වකුගඩු රෝගීන් සඳහා මූල්‍ය ආධාර	2,296	2,606
පාසල් ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මූල්‍යාධාර	2,815	2,377
විශ්‍රාම වැටුප්	208,371	240,249
ඕයගිය හා තුවාල ලැබූ රණවිරුවන් සඳහා සේවා වන්දී	24,806	26,127
ගොවි විශ්‍රාම වැටුප	2,630	2,518
වෙනත්	152	126
සෞඛ්‍ය හා පෝෂණ		
ත්‍රීපෝෂ වැඩසටහන	1,126	788
ගැබිණි මව්වරුන් සඳහා පෝෂණීය ආහාර පැකේජය (පෝෂණ මල්ල)	3,058	2,794
පාසල් පෝෂ්‍යදායී ආහාර වැඩසටහන	12,215	12,722
පෙර පාසල් ළමුන් සඳහා උදෑසන ආහාරය	767	805
වෙනත්	144	291
අධ්‍යාපනය		
පාසල් පෙළ පොත්	1,530	670
පාසල් නිල ඇඳුම්	54	226
දුෂ්කර හා අතිදුෂ්කර පාසල් වල ළමුන් සඳහා පාවහන්	2,474	1,884
ශිෂ්‍යත්ව- 5 ශ්‍රේණියේ සිසුන්	253	344
මහපොළ සහ ශිෂ්‍යාධාර	2,405	2,678
රාජ්‍ය විශ්ව විද්‍යාලවලට ඇතුළත් වීමට නොහැකි වූ ශිෂ්‍යයින් සඳහා වූ ණය යෝජනා ක්‍රමය	758	886
පාසල් සහ උසස් අධ්‍යාපන වාර ප්‍රවේශපත්‍ර	5,900	6,400
වෙනත්	406	694
සංවර්ධන සහායයන්		
පොහොර සහ බෝග සහනාධාර	21,997	21,401
වෙනත්	3,004	636
එකතුව	**461,995**	**550,859**

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

2026 වර්ෂය සඳහා අස්වැසුම සහ අනෙකුත් වර්ගීකරණ කුටුම්භ මුදල් සහනාධාර සඳහා රුපියල් බිලියන 231 ක අයවැය ප්‍රතිපාදන වෙන් කර ඇත. එයින්, 2026 වසරේ පළමු මාස හය තුළ අඩු ආදායම්ලාභී පවුල් සඳහා දීමනා ලබාදීමට රුපියල් බිලියන 89.6ක් වියදම් දරා ඇත.

රජයේ රෝහල්වලට වෛද්‍ය සැපයුම් ද ඇතුලත්ව සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන් සඳහා 2026 වසරේ පළමු මාස හය තුළ දරන ලද වියදම රු. බිලියන 88 කි. නොමිලේ පෙළපොත්, නිල ඇඳුම්, දුෂ්කර පාසල්වල සිසුන් සඳහා පාවහන් වැනි අධ්‍යාපන සුබසාධන වැඩසටහන් සඳහා 2026 වසර පළමු මාස හය තුළ වියදම රු. බිලියන 2.7 කි. එමෙන්ම රසායනික පොහොර සඳහා වූ රජයේ සහනාධාරය වෙනුවෙන් 2026 වසරේ පළමු මාස හය තුළ දී දරන ලද වියදම රු. බිලියන 21.4 කි.

ආංශික වියදම්

පාසල් අධ්‍යාපනය

2026 වසරේ පළමු මාස හය තුළ පාසල් අධ්‍යාපනය සඳහා රු. බිලියන 218 ක මුදලක් වැය කර ඇති අතර, එයින් රු. බිලියන 210 ක් පුනරාවර්තන වියදම් වන අතර රු. බිලියන 8 ක් ප්‍රාග්ධන වියදම් වේ. 2025 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව මෙම වැඩසටහන සඳහා වන වියදම සියයට 15.2කින් ඉහළ ගොස් ඇත.

රජය විසින් පාසල් ආහාර පෝෂණ වැඩසටහන, පාසල් පෙළපොත් මුද්‍රණය, පාසල් නිල ඇඳුම් සහ දුෂ්කර පාසල්වල සිසුන් සඳහා පාවහන් ලබාදීම වැනි සුභසාධන වැඩසටහන් සඳහා අඛණ්ඩව ආයෝජනය කළ අතර, එම වැඩසටහන් සඳහා රු. බිලියන 16.2 ක් වැය වී ඇත.

ආබාධ සහිත සිසුන් මුහුණ දෙන අධ්‍යාපන දුෂ්කරතා සඳහා මූල්‍ය ආධාර සැපයීම සහ ඔවුන්ට බාධාවකින් තොරව අධ්‍යාපනය කටයුතු කරගෙන යාමට වඩා හොඳ අවස්ථා ඇති බව සහතික කිරීම සඳහා, ආබාධ සහිත සිසුන් සඳහා දීමනාවක් ලෙස 2026 සඳහා රු. මිලියන 50 ක් (එක් සිසුවෙකුට රු. 5,000/- බැගින්) වෙන් කර ඇත.

2026 වසරේ මුල් මාස හය තුළ ගුරු විද්‍යාල සහ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා වැය කර ඇති මුදල රු. මිලියන 279 ක් වන අතර මෙම වැඩසටහන සඳහා දරන ලද වියදම 2025 වසරේ එම කාලයට සාපේක්ෂව සියයට 197 කින් වැඩි වී තිබේ.

ප්‍රධාන වශයෙන් පාසල් ප්‍රතිසංස්කරණය, පුනරුත්ථාපනය සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු. බිලියන 8.1ක ප්‍රාග්ධන වියදමක් දරා ඇති අතර, පළාත් අධ්‍යාපනය සඳහා වන වියදම් ද මේ තුළ ඇතුළත් කර ඇත.

2.11 වගුව | අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වූ වියදම: 2026 ජනවාරි - ජූනි

රු. මිලියන

විස්තරය	2025	2026 (තාවකාලික)
පුනරාවර්තන වියදම්		
පාසල් ගුරුවරුන් සහ අනෙකුත් කාර්ය මණ්ඩල	165,975	183,813
පුද්ගල පඩිනඩි		
ජාතික	33,356	38,295
පළාත්	132,619	145,518
සුබසාධන වැඩසටහන්	16,971	16,235
විභාග ඇගයීම් කටයුතු	3,314	3,345
ප්‍රාග්ධන වියදම්		
පාසල් පුනරුත්ථාපන හා යටිතල පහසුකම් සංවර්ධනය	362	2,077
ගුරු සංවර්ධනය	94	279
අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධන ප්‍රතිසංස්කරණ	1	34
පළාත් අධ්‍යාපනය	2,873	5,745

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

උසස් අධ්‍යාපනය

2025 වසරේ පළමු මාස හයට සාපේක්ෂව 2026 වසරේ පළමු මාස හය තුළ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා වන වියදම රු. බිලියන 46.9 ක් දක්වා සියයට 2.3 කින් අඩු විය. පුනරාවර්තන වියදම සියයට 14.3 කින් රු. බිලියන 42.4 දක්වා වැඩි වූ අතර, ප්‍රාග්ධන වියදම රු. බිලියන 4.6 ක් ලෙස වාර්තා විය.

රජය විසින් විශ්වවිද්‍යාල සිසුන් සඳහා ලබාදෙන මහපොළ ශිෂ්‍යත්ව වාරිකය රු. 7,500 සිට රු. 10,000 දක්වාත් ශිෂ්‍යාධාර වාරිකය රු. 6,500 සිට රු. 9,000 දක්වාත් වැඩි කිරීම තුළ 2026 මුල් මාස හය තුළ එම දීමනාව සඳහා දරන ලද සත්‍ය වියදම රු. බිලියන 2.7 ක් විය.

2.12 වගුව | උසස් අධ්‍යාපනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වන වියදම්: 2026 ජනවාරි - ජුනි

රු. මිලියන

විස්තරය	2025	2026 (තාවකාලික)
පුනරාවර්තන වියදම්		
විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා පුද්ගල පඩිනඩි ගෙවීම	29,928	33,783
මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම	2,405	2,678
මූලධන වියදම්		
විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන හා පහසුකම් වැඩිදියුණු කිරීම	3,205	2,943
නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය (ශ්‍රී ලංකා රජය - කුවේට් රජය)	121	672
සබරගමුව විශ්වවිද්‍යාලය සඳහා වෛද්‍ය පීඨයක් ස්ථාපිත කිරීම - අදියර ii (ශ්‍රී ලංකා රජය -සෞදි රජය)	222	270
වයඹ විශ්වවිද්‍යාලයේ නගර සංවර්ධන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය - සෞදි රජය)	133	22
අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති	174	151

මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව

නිපුණතා සංවර්ධනය හා වෘත්තීය අධ්‍යාපනය

2026 වසරේ පළමු මාස 06 තුළ දී නිපුණතා සංවර්ධනය හා වෘත්තීය අධ්‍යාපනය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 4,828 ක් ද මූලධන වියදම් සඳහා රු. මිලියන 724 ක් ද ලෙස රු. මිලියන 5,552 ක මුළු වියදමක් දරා ඇත. 2025 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව, පුනරාවර්තන වියදම් සියයට 11.3 කින් සහ ප්‍රාග්ධන වියදම් සියයට 70.7කින් ඉහළ ගොස් ඇත.

2025 වසරට සාපේක්ෂකව රු.මිලියන 350 ක අමතර ප්‍රතිපාදන වෙන් කරමින්, වෘත්තීය අධ්‍යාපනයේ යෙදී සිටින සිසුන් සඳහා හිමි වන (නිපුණතා සිසු දිරිය) මාසික දීමනාව රු. 5,000 සිට රු. 7,500 දක්වා වැඩි කිරීමට කටයුතු කර ඇත. 2026 පළමු මාස 6 තුළ ඒ සඳහා දරන ලද සත්‍ය වියදම රු.මිලියන 484 ක් විය.

2.13 වගුව | නිපුණතා සංවර්ධනය හා වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා වියදම: 2026 ජනවාරි - ජුනි

රු.මිලියන

විස්තරය	2025	2026 (තාවකාලික)
නිපුණතා සංවර්ධනය හා වෘත්තීය අධ්‍යාපනය	2,810	3,386
කාර්මික අධ්‍යාපනය හා පුහුණුව	1,258	1,435
"නිපුණතා සිසු දිරිය"	317	484
තාක්ෂණ විද්‍යාල සහ කාර්මික විද්‍යාල 7ක් නවීකරණය කිරීම	54	11
වෘත්තීය අධ්‍යාපනය ලබන සිසුන් සඳහා ශිෂ්‍ය වාර ප්‍රවේශපත්‍ර	53	48
ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක වැඩසටහන	34	89
වෘත්තීය පුහුණු කටයුතු වැඩි දියුණු කිරීම	3	82
වෘත්තීය හා තාක්ෂණික පුහුණු සංවර්ධනය	8	17

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

විද්‍යා සහ තාක්ෂණය

2026 වසරේ පළමු මාස හය තුළදී විද්‍යා සහ තාක්ෂණය සඳහා රු.මිලියන 1,582.2 ක සමස්ත වියදමක් දරන ලද අතර එය පිළිවෙලින් රු.මිලියන 1,369.5ක් පුනරාවර්තන වියදම් සඳහා ද රු.මිලියන 212.7ක් ප්‍රාග්ධන වියදම් සඳහා ද දරන ලදී.

2.14 වගුව | විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වෙනුවෙන් කරන ලද වියදම: 2026 ජනවාරි - ජුනි

රු. මිලියන

විස්තරය	2025	2026 (තාවකාලික)
ද්වීපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය ගිවිසුම් සහ අනෙකුත් රටවල් සමඟින් විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාවය	2.4	0.35
පර්යේෂණ ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීම	0.3	2.92
විද්‍යා තාක්ෂණ ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම	-	0.27

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

සෞඛ්‍ය

2026 වසරේ පළමු මාස හය තුළ පළාත් සභා සහ මධ්‍යම රජයේ සෞඛ්‍ය වියදම් සලකා බැලීමේ දී 2025 වසරේ එම කාල සීමාවට සාපේක්ෂව බටහිර හා දේශීය වෛද්‍ය යන ක්ෂේත්‍ර දෙකෙහි සෞඛ්‍ය සේවාවන් සඳහා වන රජයේ මුළු වියදම සියයට 38 කින් එනම් රු. බිලියන 280.4 දක්වා වැඩි වී ඇත. සමස්ත සෞඛ්‍ය වියදම්වලින් පුනරාවර්තන වියදම රු. බිලියන 264.4 ක් වන අතර මූලධන වියදම රු. බිලියන 16.0 කි. පුනරාවර්තන වියදම් සැලකීමේ දී එහි ප්‍රධාන කාණ්ඩයක් වන වෛද්‍ය සැපයුම් සංරචකය යටතේ ඖෂධ, ශල්‍ය උපකරණ සහ රසායනාගාර උපකරණ සඳහා රු. බිලියන 88.0 ක් වියදම් කර ඇත.

2.15 වගුව | සෞඛ්‍ය අංශයේ ප්‍රධාන කාර්යයන් සඳහා වන වියදම: 2026 ජනවාරි - ජූනි

රු. මිලියන

විස්තරය	2025	2026 (තාවකාලික)
මුළු පුනරාවර්තන වියදම්	**190,152**	**264,388**
සේවා සැපයීමේ වියදම්	95,953	118,950
එයින් වෛද්‍ය නිලධාරීන් සහ සහය කාර්යය මණ්ඩල වැටුප් සඳහා වන වියදම	75,753	99,463
වෛද්‍ය සැපයීම්	44,793	88,025
පළාත් සෞඛ්‍ය	49,406	57,413
රාජ්‍ය ආයෝජන වියදම	**12,620**	**16,015**
වෛද්‍ය උපකරණ	2,326	3,003
සෞඛ්‍ය පද්ධතීන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය- ආසියානු සංවර්ධන බැංකුව	903	686
රේබීය අමාත්‍යාංශය යටතේ ගැනෙන රෝහල්වල හදිසි ප්‍රතිකාර ඒකක වැඩිදියුණු කිරීම	79	46
ශ්‍රී ලංකාවේ පිළිකා රෝගීන් සඳහා ඉහළ ගුණාත්මකභාවයකින් යුත් අධි ශක්ති විකිරණ ප්‍රතිකාර ලබාදීම	495	1760
මහනුවර ජාතික රෝහලේ ඇටමිදුළු බද්ධ කිරීමේ ඒකකයක් ඉදි කිරීම	62	162
රිජ්වේ ආර්යා ළමා රෝහලේ හෘද මධ්‍යස්ථානයක් ඉදිකිරීම	184	113
මොණරාගල දිස්ත්‍රික් මහ රෝහලෙහි තට්ටු පහකින් සමන්විත ශල්‍ය වාට්ටු හා ශල්‍යාගාර සංකීර්ණය ඉදිකිරීම	71	27
බදුල්ල පළාත් මහ රෝහලේ දස මහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම	98	-
ශ්‍රී ලංකාවේ පෙළ වෛද්‍ය ඉංජිනේරු අංශයේ ධාරිතා සංවර්ධනය	267	271
කරාපිටිය ශික්ෂණ රෝහලේ ශල්‍ය වෛද්‍ය ඒකකය ඉදිකිරීම	59	100
රත්නපුර ශික්ෂණ රෝහලේ හෘද රෝග සත්කාර සංකීර්ණය ඉදිකිරීම	43	54
මහනුවර ශික්ෂණ රෝහලේ පිළිකා ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම	132	85
කලවාන මූලික රෝහලේ පස්මහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම	-	207
කළුතර ශික්ෂණ රෝහලේ මහල් 8 කින් යුත් වෛද්‍ය වාට්ටු සංකීර්ණය ඉදිකිරීම දෙවන අදියර	-	40
ප්‍රාථමික සෞඛ්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය - ලෝක බැංකුව)	-	276
වෙනත් රාජ්‍ය ආයෝජන වියදම්	7,505	6,565
පළාත් සෞඛ්‍ය ආයෝජන	396	2,620

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

කෘෂිකර්මය

වැවිලි, පශු සම්පත්, ධීවර හා ඉඩම් සංවර්ධනය යන උප අංශයන්ද ඇතුළත්ව කෘෂිකර්ම අංශය සඳහා 2025 වසරේ පළමු මාස හය තුළ දරා ඇති වියදම් වන රු. බිලියන 59.4 ට සාපේක්ෂව එම අංශ සඳහා 2026 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී දරා ඇති වියදම රු. බිලියන 70.4 දක්වා සියයට 18.6 කින් වැඩි වී ඇත

2.16 වගුව | කෘෂිකර්ම අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වෙනුවෙන් දරන ලද වියදම: 2026 ජනවාරි - ජූනි

රු. මිලියන

විස්තරය	2025	2026 (තාවකාලික)
කෘෂි බෝග සංවර්ධනය	**46,835**	**55,867**
එයින්; පොහොර සහනාධාරය	*21,997*	*21,401*
ආරක්ෂිත වී තොගයක් පවත්වාගෙන යාම	-	*6,501*
දිට්වා සුළි කුණාටුවෙන් හානියට පත් කුඹුරු සහ තෝරාගත් වෙනත් බෝග සඳහා වන්දි ගෙවීම	-	*4,021*
පශු සම්පත් සංවර්ධනය	**616**	**2,134**
එයින් දිත්වා සුළි කුණාටුවෙන් බලපෑමට ලක්වූ ලියාපදිංචි සත්ත්ව ගොවිපොළවල සිට මියගිය සතුන් වෙනුවෙන් වන්දි ලබා දීම	-	*1,379*
වැවිලි කර්මාන්ත	3,948	4,996
ධීවර හා ජලජ සම්පත්	3,954	3,183
ඉඩම් හා ඉඩම් සංවර්ධන	4,007	4,200
මුළු එකතුව	**59,360**	**70,380**

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

ජල සම්පාදන හා සනීපාරක්ෂාව

සුරක්ෂිත ජල සැපයුමක් සහ ගුණාත්මක සනීපාරක්ෂණ සේවාවන් ජනතාව වෙත ලබාදීම තහවුරු කිරීම සඳහා රජය විසින් 2026 වසරේ පළමු මාස හය තුළ රු. මිලියන 6,091ක මුදලක් වැය කර ඇත. එම වියදමෙන් රු. මිලියන 517ක් පුනරාවර්තන වියදම් ලෙසද, රු. මිලියන 5,574ක් ප්‍රාග්ධන වියදම් ලෙසද වැය කර ඇත.

ජනගහනයෙන් වැඩි පිරිසකට සුරක්ෂිත හා පිරිසිදු පානීය ජල පහසුකම් සැපයීම අරමුණු කර ගනිමින්, නව ජල සම්පාදන ව්‍යාපෘති ආරම්භ කිරීම, පවතින ජල සම්පාදන පද්ධතිවල ධාරිතාව වැඩිදියුණු කිරීම මෙන්ම දැනට ක්‍රියාත්මක වෙමින් පවතින නව ව්‍යාපෘති කඩිනමින් නිම කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇත. ඒ අනුව, දේශීය අරමුදල් මෙන්ම විදේශීය මූල්‍ය පහසුකම් යටතේ ජල සම්පාදන හා සනීපාරක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ව්‍යාපෘති රැසක් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.

මෙම ආයෝජන තුළින් දිවයින පුරා ජනතාවගේ සුරක්ෂිත පානීය ජලය සඳහා ප්‍රවේශය පුළුල් කිරීමත්, සනීපාරක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීමත් මඟින් ජනතාවගේ සෞඛ්‍ය සහ ජීවන තත්ත්වය නංවාලීම රජයේ ප්‍රමුඛ අරමුණකි.

මාර්ග සහ පාලම්

2026 වසරේ මුල් මාස හය තුළ මාර්ග සහ පාලම් සඳහා වියදම රු. මිලියන 76,186 ක් වන අතර එය පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 2.7 ක පමණ අඩුවීමකි.

වියදම් අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මාර්ග සංවර්ධන කටයුතු සහ මාර්ග සංවර්ධන අධිකාරියේ බැඳීම් නිරවුල් කිරීම සඳහා වන වියදම් අඩුවීමය. කෙසේ වෙතත් මාර්ග පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීම, පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම සහ ග්‍රාමීය මාර්ග සංවර්ධනය ඇතුළු තෝරාගත් යටිතල පහසුකම් ක්‍රියාකාරකම් සඳහා වන වියදම් වැඩිවීම මඟින් මෙම වියදම් අඩුවීමේ බලපෑම යම් ප්‍රමාණයකට අවම කර ඇත. විශේෂයෙන්ම ජාතික මාර්ගවල නඩත්තුව, මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම සහ ජාතික මාර්ග පද්ධතියෙහි අබලන් වූ පාලම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අඛණ්ඩව වියදම් කිරීම මඟින් පවතින මාර්ග ජාලය නඩත්තු කිරීම මෙන්ම නව යටිතල පහසුකම් සංවර්ධනයට සමගාමීව දැනට පවතින මාර්ග පද්ධතීන්හි අවහිරතා ඉවත් කිරීමේ වැදගත්කම අවධාරණය කරයි.

මාර්ග සංවර්ධන අධිකාරියේ බැඳීම් නිරවුල් කිරීම යටතේ වියදම්වල සැලකිය යුතු අඩුවීම ප්‍රධාන වශයෙන් ඉදිරි වසරවල ගෙවීමට තිබූ ඇතැම් ණය සම්බන්ධ වගකීම් 2025 වසරේ දී පියවීම හේතුවෙන් සිදුවිය. එබැවින් මෙම කාණ්ඩය යටතේ අඩු වියදමක් වාර්තාවීම මාර්ග අංශයේ ක්‍රියාකාරකම්වල සාපේක්ෂ අඩුවීමක් පිළිබිඹු නොකරයි.

තවද, සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ දිට්වා පුනරුත්ථාපන වැඩසටහන සාපේක්ෂව මන්දගාමී ප්‍රගතියක් වාර්තා කළ අතර, ඊට හේතුව වූයේ බොහෝ කොන්ත්‍රාත්තු සැලසුම් කිරීමේ සහ ලංසු කැඳවීමේ අදියරවල පැවතීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස එම කාලපරිච්ඡේදය තුළ වියදම් සහ භෞතික ප්‍රගතිය යන දෙකම සාපේක්ෂව අඩු මට්ටමක පැවතුණි. සැලසුම්කරණ හා ප්‍රසම්පාදන ක්‍රියාවලීන් අවසන් වී කොන්ත්‍රාත්තු ක්‍රියාත්මක කිරීමේ අදියරට පිවිසීමත් සමඟ දිත්වා පුනරුත්ථාපන වැඩසටහන්වල ප්‍රගතිය වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2.17 වගුව | මාර්ග සහ පාලම් සඳහා වියදම්: 2026 ජනවාරි - ජූනි

රු. මිලියන

	ව්‍යාපෘතිය / වැඩසටහන	2025	2026 (තාවකාලික)
1	**අධිවේගී මාර්ග සංවර්ධනය**	**15,793**	**15,534**
	මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය	14,577	10,220
	කොළඹ - රත්නපුර - පැල්මඩුල්ල අධිවේගී මාර්ගය	523	502
	කණු මතින් දිවෙන නව කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා වන අධිවේගී මාර්ගය	3	-
	කණු මත දිවෙන වරාය නගර අධිවේගී මාර්ගය	690	2,547
	කඩවත පද්ධති අන්තර් හුවමාරුව සහ මධ්‍යම අධිවේගී මාර්ගයේ අදියර I හි මීරිගම දෙසට මීටර් 500 ක් ඉදිකිරීම	-	2,265
2	**මාර්ග සංවර්ධනය**	**25,443**	**24,210**
	මාර්ග නඩත්තුව හා වැඩි දියුණු කිරීම	11,000	11,841
	කොළඹ දිස්ත්‍රික් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය	777	443
	බස්නාහිර පළාත් ජාතික මහාමාර්ග ව්‍යාපෘතිය	124	93
	ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන	2,913	2,957
	A 17 මාර්ග කොටස පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය (රක්වාන - සූරියකන්ද)	378	564
	අන්තර්ගතිකව සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය	3,830	3,827
	ප්‍රධාන මාර්ග හා අධිවේගී මාර්ග වෙත ප්‍රවේශය සඳහා සහ මාර්ග තදබදය අවම කිරීම සඳහා විකල්ප මාර්ග පද්ධතියක් සංවර්ධනය කිරීම	5,588	1,581
	පළාත් මාර්ග නඩත්තුව සහ පුනරුත්ථාපනය	389	2,040
	අනෙකුත් මාර්ග සංවර්ධනය	444	864
3	**මාර්ග පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීම**	**704**	**3,700**
4	**පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම**	**3,174**	**4,939**
	ජාතික මාර්ග ජාලයේ හානි වූ සහ දුර්වල පාලම් පුනරුත්ථාපනය	230	1,196
	පරණ පාලම් කොටස් යොදා ගනිමින් ග්‍රාමීය පාලම් ඉදිකිරීම	151	156
	කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් දෙකක් සැලසුම් කොට ඉදිකිරීම	81	3,409
	කොම්පඤ්ඤවීදිය දුම්රිය ස්ථානය අසල සහ උත්තරානන්ද මාවතෙහි දුම්රිය මාර්ගයට ඉහළින් ගුවන් පාලම් ඉදිකිරීම	2,576	-
	ජාතික මහාමාර්ගයන්හි පාලම් 25 ක් ප්‍රතිසංස්කරණය කිරීම	136	52
	මුලතිව් වඩඩුවාකල් පාලම ඉදිකිරීම	-	126
5	**"මග නැහුම" ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන**	**388**	**4,494**
6	**ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම (ප්‍රමුඛ මාර්ග ව්‍යාපෘති හැර අනෙකුත් ව්‍යාපෘති)**	**3,235**	**1,739**
7	**මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය හිඟය පියවීම සඳහා ලබා දුන් මූල්‍ය දායකත්වය**	**29,526**	**20,741**
8	**දිවිවා පුනරුත්ථාපන වැඩසටහන**	**-**	**829**
	එකතුව	**78,263**	**76,186**

මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව

ප්‍රවාහන

2025 වසරේ මුල් මාස 6ට සාපේක්ෂව 2026 වසරේ එම කාලය තුළ ප්‍රවාහන අංශය සඳහා රජයේ වියදම සියයට 9.1 කින් රු. බිලියන 33.5 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර, එයින් රු. බිලියන 22.2 ක් සහ රු. බිලියන 11.3 ක් පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් ලෙස පිළිවෙලින් වැය කර ඇත. මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය ඉදිකිරීම් සහ දුම්රිය මාර්ග සහ දුම්රිය ඇණියේ නඩත්තු හා පුනරුත්ථාපන කටයුතු වල වියදම් මෙසේ වියදම් ඉහල යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

2026 වසරේ මුල් මාස හය තුළ, දුම්රිය ප්‍රවාහන සේවය වැඩිදියුණු කිරීම සඳහා කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය සහ මහව සිට ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සහ දුම්රිය යටිතල පහසුකම්වල නඩත්තු හා පුනරුත්ථාපනය කිරීමද ඇතුළු ප්‍රධාන යටිතල පහසුකම් වෙනුවෙන් රු. බිලියන 8.7 ක් වැය කර ඇත.

2026 වසරේ මුල් භාගයේදී බස් ප්‍රවාහනය සඳහා වියදම රුපියල් බිලියන 7.2 කි. මෙම වියදම ආර්ථික වශයෙන් ලාභ නොලබන මාර්ගවල ශ්‍රී ලංගම බස් රථ ධාවනය

කිරීම සහ පාසල් සහ උසස් අධ්‍යාපන වාර ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම වැනි සුභසාධන සේවාවන් සඳහා වැය කරන ලදී. මෝටර් රථ ප්‍රවාහන පනත ක්‍රියාත්මක කිරීම සඳහා මෙම කාලය තුළ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව රුපියල් බිලියන 1.0 ක් වියදම් කර ඇත.

නිවාස සංවර්ධනය

ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සහ නිවාස අවශ්‍යතාවය තහවුරු කිරීම සඳහා 2026 වර්ෂයේ පළමු මාස හය තුළ රුපියල් මිලියන 9,195ක මුදලක් වැය කර ඇත. එම වියදමෙන් රුපියල් මිලියන 420ක් පුනරාවර්තන වියදම් ලෙසද, රුපියල් මිලියන 8,775ක් ප්‍රාග්ධන වියදම් ලෙසද වැය කර ඇත.

අඩු ආදායම්ලාභී සහ නිවාස අවශ්‍යතාවයෙන් පෙළෙන පවුල් සඳහා "තමන්ගේම තැනක් – ලස්සන ජීවිතයක්" වැඩසටහන යටතේ ආරක්ෂිත හා යහපත් නිවාස පහසුකම් සැලසීම සඳහා 2026 වර්ෂයේ දී ප්‍රමුඛතාවය ලබා දී ඇත. නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහන යටතේ 2026 වර්ෂය තුළ නිවාස ඒකක 10,500ක් ඉදිකිරීම ඉලක්ක කර ඇති අතර, 2026 වර්ෂයේ පළමු මාස හය තුළ දී රු. මිලියන 4,404ක මූල්‍ය සහාය ලබා දී ඇත.

ඒ හා සමගාමීව, වතු ප්‍රජාවගේ නිවාස අවශ්‍යතා සපුරාලීම සඳහා නිවාස ඒකක 2,897ක් ඉදිකිරීමේ වැඩසටහනක් වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කර ඇති අතර, මේ වන විට ඒ සඳහා රු. මිලියන 397ක වියදමක් දරා ඇත. තවද, නාගරික ප්‍රදේශවල අඩු ආදායම්ලාභී ජනතාව සඳහා වඩාත් යහපත් හා සුරක්ෂිත ජීවන පරිසරයක් නිර්මාණය කිරීම අරමුණු කරගත් නාගරික පුනර්ජීවන වැඩසටහන සහ චීන ආධාර වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභී නිවාස ඒකක 2,726ක් ඉදි කිරීම සඳහා 2026 වර්ෂයේ පළමු මාස හය තුළ රු. මිලියන 2,297ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇත. මෙම විවිධ මුලපිරීම් හරහා, සමාජයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා නිවාස ස්ථාවරත්වය තහවුරු කිරීමට සහ ඔවුන්ගේ සමස්ත ජීවන තත්ත්වය ඉහළ නැංවීමට රජය අඛණ්ඩව දායකත්වය සපයයි.

නාගරික සංවර්ධනය

2026 වර්ෂයේ පළමු මාස හය තුළ නාගරික සංවර්ධනය සඳහා මුළු වියදම රුපියල් මිලියන 1,380ක් විය. එයින් රුපියල් මිලියන 838ක් නාගරික පහසුකම් සංවර්ධන වැඩසටහන් සඳහා වැය කර ඇති අතර, එහි ප්‍රධාන වශයෙන් සියක් නගර /නාගරික යටිතල පහසුකම් හා නගර සංවර්ධන වැඩසටහන සහ අනුරාධපුර උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය ඇතුළත් විය.

අපද්‍රව්‍ය කළමනාකරණය හා පරිසර ආරක්ෂණය සඳහා රුපියල් මිලියන 542ක් වැය කර ඇති අතර, මෙම අංශය යටතේ ඔලියමුල්ල සහ කොළොන්නාව වැසි ජල කළමනාකරණ වැඩසටහන් මෙන්ම පවතින ඇළ මාර්ග, වැව්, තෙත් බිම් සහ ඇවිදින මං තීරු නඩත්තු කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම ප්‍රධාන ව්‍යාපෘති සහ වැඩසටහන් ලෙස ක්‍රියාත්මක කරන ලදී.

පරිසරය

2026 වසරේ පළමු මාස හය තුළ පාරිසරික අංශය සඳහා රජය විසින් දරන ලද සමස්ත වියදම රු. බිලියන 6.7 ක් වන අතර, එයින් රු. බිලියන 6 ක් පුනරාවර්තන වියදම් සහ රු.මිලියන 649 ක් ප්‍රාග්ධන වියදම් වේ. මුළු වියදමෙන් ප්‍රධාන වශයෙන් රු.මිලියන 155ක් පරිසර සංරක්ෂණයටත්, රු.මිලියන 243 ක් වන ආවරණය පුළුල් කිරීම සහ වන ආරක්ෂණය සඳහාත්, රු.මිලියන 213 ක් විදුලි වැට ඉදි කිරීම ඇතුළු අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහාත් වැය කරන ලදී.

මෙයට අමතරව, වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණය ආශ්‍රිත ප්‍රධාන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 117ක් යොදවා ඇති අතර, රු. මිලියන 27ක් සහ රු. මිලියන 36ක් පිළිවෙලින් සත්වෝද්‍යාන සහ උද්භිද උද්‍යාන සංවර්ධනය ආශ්‍රිත ප්‍රධාන කටයුතු සඳහා වැය කරන ලදී. ඉතිරි වියදම් පරිසරය සුරැකීම සඳහාත්, වනජීවී, වන සම්පත් හා වෙරළ සංරක්ෂණය සඳහාත් සහ සත්වෝද්‍යාන හා උද්භිද උද්‍යාන සංවර්ධනය සඳහාත් වූ වැඩසටහන් සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ආශ්‍රිත මෙහෙයුම් හා පරිපාලන කටයුතු වෙනුවෙන් දරා ඇත.

වාරිමාර්ග හා ජල කළමනාකරණ

2026 වසරේ පළමු මාස හය තුළ වාරිමාර්ග හා ජල කළමනාකරණය සඳහා වන වියදම රු. බිලියන 13.6 ක් වූ අතර, එම වියදමෙන් රු. බිලියන 7.5ක් රේඛීය අමාත්‍යාංශය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වාරිමාර්ග පද්ධති සංවර්ධනය හා වැඩිදියුණු කිරීම සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා වැය කර ඇත. ඉතිරි රු. බිලියන 6.1 මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (අදියර II) සඳහා වැය කරන ලදී.

2.4 භාණ්ඩාගාර මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය

අයවැය ඇස්තමේන්තු හා සසඳන විට 2026 වසර තුළ මහා භාණ්ඩාගාරයේ මුදල් ප්‍රවාහ මෙහෙයුම් රජයේ මූල්‍ය ද්‍රවශීලතා තත්ත්වයේ සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරයි. ඇස්තමේන්තු ඉක්ම වූ ආදායම් ලැබීම සහ විචක්ෂණශීලී වියදම් කළමනාකරණය හේතුවෙන්, පුරෝකථනය කළ මුදල් හිඟය සැලකිය යුතු ලෙස අඩු කර ගැනීමටත්, කාලපරිච්ඡේදය

අවසානයේ ප්‍රශස්ථ මුදල් ශේෂයක් පවත්වා ගැනීමටත් භාණ්ඩාගාරයට හැකි විය. මෙම වර්ධනයන් මඟින් ආදායම් එකතු කිරීමේ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීමට, මූල්‍ය විනය නැංවීමට සහ මූල්‍ය කළමනාකරණයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට රජය ගන්නා අඛණ්ඩ උත්සාහයන් පිළිබිඹු වේ.

භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව, ආදායම් සහ අනෙකුත් ලැබීම් ඇස්තමේන්තුගත රු. බිලියන 2,425.1 සාපේක්ෂව රු. බිලියන 2,877.5 ක් ලෙස සටහන් විය. මෙය ඇස්තමේන්තුවට වඩා රු. බිලියන 452.4 ක හෝ සියයට 18.7 ක වැඩිවීමකි. මෙම වාසිදායක කාර්යසාධනය තුළින් ආදායම් රැස්කිරීමේ ප්‍රවර්ධනය සහ රජයේ ආදායම් මාර්ග සහ අනෙකුත් ලැබීම්වලින් අපේක්ෂිත ප්‍රමාණය ඉක්මවා මුදල් ගලා ඒම පෙන්නුම් කරයි.

වියදම් පාර්ශවය සලකා බැලීමේදී, පුනරාවර්තන ගෙවීම් සඳහා වූ මුළු මුදල් පිටතට ගලා යාම ඇස්තමේන්තුගත රු. බිලියන 3,166.7 කට සාපේක්ෂව රු. බිලියන 2,616.7 ක් විය. මෙය අයවැය ඇස්තමේන්තුවට වඩා රු. බිලියන 550.0 ක අඩුවීමක් වන අතර, එමඟින් සමාලෝචනයට භාජනය වන කාලසීමාව තුළ ඵලදායී වියදම් කළමනාකරණයක් සහ පුනරාවර්තන වියදම් පාලනය කිරීමක් පෙන්නුම් කරයි. එලෙසම, ප්‍රාග්ධන ගෙවීම් සඳහා වූ මුදල් පිටතට ගලා යාම රු. බිලියන 545.8 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයට සාපේක්ෂව රු.බිලියන 336.6 ක් වූ අතර, එමඟින් රු. බිලියන 209.2 ක ඉතිරියක් පෙන්නුම් කරයි. මෙම ප්‍රතිඵලයට සංවර්ධන ව්‍යාපෘති අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීම සහ රාජ්‍ය ආයෝජන වියදම් ප්‍රමුඛතාගත කිරීම හේතු වී ඇත.

ඇස්තමේන්තුගත ප්‍රමාණය ඉක්මවා රැස්කළ ආදායම් සහ ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා අඩු වියදම් හේතුවෙන්, ශුද්ධ මුදල් හිඟය මුලින් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා අඩු අගයක් දැක්වීය. රු. බිලියන 1,287.3 ක හිඟයක් පුරෝකථනය කර තිබූ නමුත්, සැබෑ හිඟය රු. බිලියන 75.8 ක් පමණක් විය. මෙය ඇස්තමේන්තුගත තත්ත්වයට වඩා රු. බිලියන 1,211.5 ක දියුණුවක් නිරූපණය කරන අතර, සමස්ත භාණ්ඩාගාර මෙහෙයුම් සඳහා ඉහළ නැංවූ ආදායම් කාර්යසාධනය සහ වියදම් පාලන පියවරයන්හි ධනාත්මක බලපෑම මින් ඉස්මතු වේ.

බැඳීම් මූල්‍යයනය සඳහා අරමුදල් සැපයීමට, රජය එම කාලසීමාව තුළ රු. බිලියන 1,655.8 ක දළ ණය ගැනීම් සිදු කර ඇති අතර, එය රු. බිලියන 1,737.2 ක් වූ ඇස්තමේන්තුගත ණය අවශ්‍යතාවයට වඩා අඩු අගයකි. මේ අතර ණය ආපසු ගෙවීම සඳහා ඇස්තමේන්තු කර තිබූ රු. බිලියන 1,882.4ට සාපේක්ෂව සත්‍ය වශයෙන් ණය ආපසු ගෙවීම රු. බිලියන 1,835.3 ක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඇස්තමේන්තුගත සෘණ ශුද්ධ ණය ගැනීමේ තත්ත්වය වූ රු. බිලියන 145.2 කට සාපේක්ෂව ශුද්ධ ණය ගැනීම් රු. බිලියන 179.6 ක සෘණ ශේෂයක් වාර්තා කළේය. මෙයින් රජයේ විවක්ෂණශීලී ණය කළමනාකරණය සහ ණය මත රඳා පැවතීම ක්‍රමයෙන් හීනවීම පිළිඹිබු කරයි.

2.18 වගුව | රජයේ මුදල් ප්‍රවාහ ක්‍රියාකාරිත්ව ප්‍රකාශය : 2026 ජනවාරි - ජූනි

රු. බිලියන

අයිතමය	2026	
	ඇස්තමේන්තුව	තත්‍ය
ආරම්භක මුදල් ශේෂය	**915.8**	**915.8**
ආදායම් හා වෙනත් ලැබීම් මඟින් සමස්ථ මුදල් ගලා ඒම	2,425.1	2,877.5
මෙහෙයුම් ක්‍රියාකාරකම් වල සමස්ථ මුදල් ගලා යෑම්	-3,166.7	-2,616.7
ආයෝජන කටයුතු සඳහා සමස්ථ මුදල් ගලායාම්	-545.8	-336.6
ශුද්ධ මුදල් අතිරික්තය / (හිඟය)	-1,287.3	-75.8
දල ණය ගැනීම් භාවිතය	1,737.2	1,655.8
ණය ආපසු ගෙවීම්	-1,882.4	-1,835.3
ශුද්ධ ණය ගැනීම් භාවිතය	-145.2	-179.6
ගැලපීම් ගිණුමේ ශේෂය (TEB/ ශුද්ධ තැන්පතු යනාදිය)	-	29.8
අවසාන මුදල් ශේෂය	**-516.6**	**690.3**

මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

ඒ අනුව, කාලච්ඡේදය අවසානයේ අවසාන මුදල් ශේෂය රු. බිලියන 690.3 ක් ලෙස පැවති අතර, එය රු. බිලියන 516.6 ක ඇස්තමේන්තුගත සෘණ ශේෂය සැලකිය යුතු ලෙස අභිබවා යාමකි. සැලකිය යුතු ධනාත්මක මුදල් ශේෂයක් පවත්වා ගැනීමෙන් රජයේ මුදල් කළමනාකරණ උපාය මාර්ගවල ඵලදායීතාවය පෙන්නුම් කරන අතර, අනාගත වියදම් අවශ්‍යතා සහ ණය සේවාකරණ බැඳීම් ඉටු කිරීම සඳහා වැදගත් ද්‍රවශීලතා ස්වාරක්ෂකයක් සපයයි.

සමස්තයක් වශයෙන් ගත් කල, 2026 වසරේ මහා භාණ්ඩාගාරයේ මුදල් ප්‍රවාහ කාර්යසාධනය මඟින් ශක්තිමත් ආදායම් වර්ධනය, කළමනාකරණය කළ වියදම් මට්ටම් සහ විවක්ෂණශීලී ණය කළමනාකරණ පිළිවෙත්වල සහාය ඇතිව මූල්‍ය මෙහෙයුම්වල කැපී පෙනෙන වර්ධනයක් පිළිබිඹු කරයි. මෙම කාලසීමාව තුළ අත්පත් කර ගත් ඉහළ මුදල් තත්ත්වය රජයේ මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව වැඩි කරන අතර ප්‍රමුඛතා ආර්ථික හා සමාජීය වැඩසටහන්වලට සහාය වෙමින් මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීමට ඇති හැකියාව ශක්තිමත් කරයි.

3 වන පරිච්ඡේදය

රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යසාධනය

3.1 සමාලෝචනය

ආර්ථිකයේ අනෙකුත් සියලුම ක්ෂේත්‍රයන්හි දක්නට ලැබෙන මෙහෙයුම් බාධාවන්ට සමානව, මැදපෙරදිග ගැටුම් හේතුවෙන් 2026 වර්ෂයේ දෙවන කාර්තුව තුළදී රාජ්‍ය ව්‍යවසායය ක්ෂේත්‍රයට ද අමුද්‍රව්‍ය පිරිවැය ඉහළ යාම්, සැපයුම් දාමයන්හි බාධාවන් සහ ඇණවුම් අවලංගු වීම් ඇතුළු අභියෝගයන්ට මුහුණ දීමට සිදු විය. එම අභියෝග මධ්‍යයේ වුවද, ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 51 මඟින් 2025 වර්ෂයේ පළමු මාස හය තුළ වූ රු. බිලියන 227.8 ක සමස්ත ලාභයට සාපේක්ෂව 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 259.3 ක සමස්ත ලාභයක් වාර්තා කරමින් වර්ධනය වූ කාර්යසාධනයක් වාර්තා කර ඇත[1].

මැදපෙරදිග ගැටුම් මඟින් මහජනතාවට සහ පුළුල් ආර්ථිකයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා, 2026 වර්ෂයේ අප්‍රේල් සිට ජූනි දක්වා කාලය තුළදී මහා භාණ්ඩාගාරය විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට රු. බිලියන 41 ක සහ සී/ස නැෂනල් සිස්ටම් ඔපරේටර් (පුද්ගලික) සමාගමට රු. බිලියන 15 ක සහනාධාර ලබා දෙන ලදී.

අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව, රාජ්‍ය ව්‍යවසායය ප්‍රතිසංස්කරණය සඳහා වූ විශේෂිත ඒකකයක් 2026 මාර්තු මාසයේදී මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදී. එම ඒකකය දැනට තෝරාගත් රාජ්‍ය ව්‍යවසායයන් 33 ක් ඇවර කිරීමේ කටයුතුවල නිරතව සිටී. තවද, 2026 අයවැය යෝජනාවලට අනුකූලව, තෝරාගත් රාජ්‍ය ව්‍යවසායයන්හි සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායක මුදල්, සහ පාරිතෝෂික ගෙවීම්වලට අදාලව දීර්ඝ කාලයක් පවතින හිඟ වගකීම් පියවීමට මහා භාණ්ඩාගාරය කටයුතු කරමින් සිටී. මේ සඳහා වෙන් කරන ලද රු. බිලියන 5 ක මුදලින් රු. බිලියන 2.8 ක් 2026 අගෝස්තු මස අවසානය වන විට ගෙවා නිම කර තිබුණි.

මේ අතර, විදුලිබල ක්ෂේත්‍රයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්යයන් පූර්ණ රාජ්‍ය හිමිකාරීත්වය සහිත සමාගම් හයක් වෙත පවරන ලද අතර, එම සමාගම් 2026 මාර්තු මස 9 වන දින නිල වශයෙන් සිය මෙහෙයුම් ආරම්භ කළේය. මෙම ප්‍රතිසංස්කරණ පියවරට සහාය දැක්වීමක් ලෙස, සේවකයින් සඳහා හඳුන්වා දුන් අනිවාර්ය විශ්‍රාම යෝජනා ක්‍රමයෙන් මතු වූ වගකීම් පියවීම උදෙසා මහා භාණ්ඩාගාරය විසින් සී/ස ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (පුද්ගලික) සමාගම, සී/ස නැෂනල් ට්‍රාන්ස්මිෂන් නෙට්වර්ක් සර්විස් ප්‍රොවයිඩර් (පුද්ගලික) සමාගම, සී/ස ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුෂන් ලංකා (පුද්ගලික) සමාගම සහ සී/ස නැෂනල් සිස්ටම් ඔපරේටර් (පුද්ගලික) සමාගම වෙත ආසන්න වශයෙන් රු. බිලියන 8 ක හිමිකම් ප්‍රාග්ධනයක් ලබා දෙන ලදී.

රාජ්‍ය ව්‍යවසායයන්ගෙන් 2025 වර්ෂයේ පළමු මාස හය තුළ අයබදු සහ ලාභාංශ එකතු කිරීම රු. බිලියන 11.7 ක් වූ අතර, එය 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 12.6 ක් දක්වා වැඩි වී ඇත.

3.2 රජය සතු ප්‍රධාන ව්‍යාපාර දහය පිළිබඳ සමාලෝචනය

ලංකා බැංකුව

2025 වර්ෂය අවසානය වන විට රු. බිලියන 5,468 ක් වූ ලංකා බැංකුවේ වත්කම් පදනම 2026 වර්ෂයේ ජූනි මස අවසන් වන විට රු. බිලියන 5,421 ක් දක්වා සියයට 0.9 කින් ආන්තික වශයෙන් පහළ ගොස් ඇත. 2025 වර්ෂය අවසානය වන විට රු. බිලියන 2,372 ක් වූ ණය සහ අත්තිකාරම් 2026 වර්ෂයේ ජූනි මස අවසන් වන විට රු. බිලියන 2,529 ක් දක්වා සියයට 6.6 කින් ඉහළ ගොස් ඇත. 2025 වර්ෂය අවසානය වන විට රු. බිලියන 4,389 ක් වූ ලංකා බැංකුවේ තැන්පතු පදනම 2026 වර්ෂයේ පළමු මාස හය තුළ රු. බිලියන 4,319 ක් දක්වා සියයට 1.6 කින් පහළ ගොස් ඇත. 2025 වර්ෂය අවසානය වන විට සියයට 5.59 ක් වූ අක්‍රීය ණය (අදියර III) අනුපාතය, 2026 වර්ෂයේ ජූනි මස අවසානය වන විට සියයට 5.01 ක් දක්වා වැඩි දියුණු වී ඇත. 2025 වර්ෂයේ පළමු මාස හය තුළ වූ රු. බිලියන 59.4 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 62.6 ක බදු පෙර ලාභයක් වාර්තා කරමින් ලංකා බැංකුව ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයක් වාර්තා කර ඇත. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2026 වර්ෂයේ මුල් මාස හය තුළ මුළු මෙහෙයුම් ආදායම රු. බිලියන 131.4 ක් දක්වා සියයට 9.2 කින් ඉහළ යාමයි.

මහජන බැංකුව

2025 වර්ෂය අවසානය වන විට රු. බිලියන 3,708 ක් වූ මහජන බැංකුවේ වත්කම් පදනම 2026 වර්ෂයේ

[1]ලංකා විදුලිබල මණ්ඩලය සම්බන්ධයෙන්, 2026 වර්ෂය සඳහා සලකා බලා ඇත්තේ 2026.01.01 සිට 2026.03.09 දක්වා කාල සීමාවේ ලාභයයි.

ජූනි මස අවසානය වන විට රු. බිලියන 3,754 ක් දක්වා සියයට 1.2 කින් ආන්තික වශයෙන් ඉහළ ගොස් ඇත. 2025 වර්ෂය අවසානයේ රු. බිලියන 3,230 ක් වූ බැංකුවේ තැන්පතු පදනම, 2026 වර්ෂයේ ජූනි මස අවසානය වන විට රු. බිලියන 3,165 ක් දක්වා සියයට 2.0 කින් අඩු වී ඇත. 2025 වර්ෂය අවසානයේ රු. බිලියන 1,731 ක් වූ ණය හා අත්තිකාරම්, 2026 වර්ෂයේ ජූනි මස අවසානය වන විට රු. බිලියන 1,899 ක් දක්වා සියයට 9.7 කින් වර්ධනය වී ඇත. 2025 වර්ෂය අවසානය වන විට සියයට 7.7 ක් වූ අක්‍රීය ණය (අදියර III) අනුපාතය 2026 වර්ෂයේ ජූනි මස අවසානය වන විට සියයට 6.7 ක් දක්වා වැඩි දියුණු වී ඇත. 2025 වර්ෂයේ පළමු මාස හය තුළ රු. බිලියන 28 ක් වූ බදු පෙර ලාභයට සාපේක්ෂව 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය සඳහා රු. බිලියන 32.6 ක සියලු කාලයේ ඉහළම බදු පෙර ලාභයක් මහජන බැංකුව විසින් වාර්තා කර ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ශුද්ධ පොළී ආදායම රු. බිලියන 82.4 ක් දක්වා සියයට 18.9 කින් ඉහළ යාමයි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව

2025 වර්ෂය අවසානය වන විට රු. බිලියන 1,831 ක් වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වත්කම් පදනම 2026 වර්ෂයේ ජූනි මස අවසානය වන විට රු. බිලියන 1,870 ක් දක්වා සියයට 2.1 කින් ආන්තික වර්ධනයක් වාර්තා කර ඇත. 2025 වර්ෂය අවසානයේ රු. බිලියන 1,608 ක් වූ බැංකුවේ තැන්පතු පදනම 2026 වර්ෂයේ ජූනි මස අවසානය වන විට රු. බිලියන 1,633 ක් දක්වා සියයට 1.6 කින් වර්ධනය වී ඇත. 2025 වර්ෂය අවසානය වන විට රු. බිලියන 551 ක් වූ ණය සහ අත්තිකාරම් 2026 වර්ෂයේ ජූනි මස අවසානය වන විට රු. බිලියන 601 ක් දක්වා සියයට 9.0 කින් ඉහළ ගොස් ඇත. 2025 වර්ෂය අවසානය වන විට සියයට 2.5 ක්වූ අක්‍රීය ණය (අදියර III) අනුපාතයට සාපේක්ෂව 2026 වර්ෂයේ ජූනි මස අවසානය වන විට එය සියයට 2.1 ක් දක්වා වර්ධනය වී ඇත. 2025 වර්ෂයේ පළමු මාස හය තුළ වාර්තා කළ රු. බිලියන 24.1 ක් වූ බදු පෙර ලාභය හා සසඳන විට 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ බදු පෙර ලාභය රු. බිලියන 22.6 ක් දක්වා සියයට 6.2 කින් පහළ ගොස් ඇති අතර සේවක වියදම් රු. බිලියන 13.8 ක් දක්වා සියයට 10.0 කින් ඉහළ යාම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 2026 වර්ෂයේ මුල් මාස හය තුළ රු. මිලියන 3,067 ක ආදායමක් වාර්තා කළ අතර, එය 2025 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ ඉපැයූ රු. මිලියන 2,833 ට සාපේක්ෂව සියයට 8.3 ක වර්ධනයකි. සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 2025 වර්ෂයේ පළමු මාස හය තුළ වූ රු. මිලියන 2,378 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ බදු පෙර ලාභය රු. මිලියන 2,623 ක් දක්වා සියයට 10.3 කින් ඉහළ නංවා ඇත. 2025 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට රු. මිලියන 133,430 ක් වූ සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ මුළු වත්කම් 2026 වර්ෂයේ ජූනි මස අවසානය වන විට රු. මිලියන 136,750 ක් දක්වා සියයට 2.5 කින් ඉහළ ගොස් ඇත.

රක්ෂණ ව්‍යාපාරයේ නිරත සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි පූර්ණ හිමිකාරිත්වය දරන පරිපාලිත සමාගම් වන සී/ස ශ්‍රී ලංකා ජීවිත රක්ෂණ සමාගම සහ සී/ස ශ්‍රී ලංකා සාමාන්‍ය රක්ෂණ සමාගම ද 2026 වර්ෂයේ පළමු මාස හය තුළ පිළිවෙලින් රු. මිලියන 34,060 ක් සහ රු. මිලියන 14,669 ක් ලෙස සියයට 21.9 කින් සහ සියයට 22.8 කින් සැලකිය යුතු ආදායම් වර්ධනයක් වාර්තා කර ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ සී/ස ශ්‍රී ලංකා ජීවිත රක්ෂණ සමාගමෙහි සහ සී/ස ශ්‍රී ලංකා සාමාන්‍ය රක්ෂණ සමාගමෙහි ශුද්ධ ඉපැයුම් වාරිකය පිළිවෙලින් සියයට 15.3 කින් සහ සියයට 23.9 කින් ඉහළ යාමයි. එහි ප්‍රතිඵලයක් ලෙස, සී/ස ශ්‍රී ලංකා ජීවිත රක්ෂණ සමාගම විසින් 2025 වර්ෂයේ පළමු මාස හය තුළ වූ රු. මිලියන 1,563 ට සාපේක්ෂව 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ සියයට 4.4 ක වර්ධනයක් සමඟින් රු. මිලියන 1,631 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත. මේ අතර, සී/ස ශ්‍රී ලංකා සාමාන්‍ය රක්ෂණ සමාගම ද 2026 වර්ෂයේ පළමු මාස හය සඳහා 2025 වර්ෂයේ පළමු මාස හය තුළ වූ රු. මිලියන 2,087 ට සාපේක්ෂව රු. මිලියන 2,504 ක් දක්වා බදු පෙර ලාභයේ සියයට 20 ක වර්ධනයක් වාර්තා කර ඇත. 2025 වර්ෂයේ දෙසැම්බර් මස අවසන් වන විට පැවති මුළු වත්කම් හා සසඳන විට සී/ස ශ්‍රී ලංකා ජීවිත රක්ෂණ සමාගමෙහි සහ සී/ස ශ්‍රී ලංකා සාමාන්‍ය රක්ෂණ සමාගමෙහි මුළු වත්කම් 2026 වර්ෂයේ ජූනි මස අවසන් වන විට, පිළිවෙලින් රු. මිලියන 288,660 ක් සහ රු. මිලියන 64,616 ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගොස් ඇත.

ලංකා විදුලිබල මණ්ඩලය සහ එහි අනුප්‍රාප්තික සමාගම්

2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ හඳුන්වා දුන් ප්‍රධාන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණවල කොටසක් ලෙස, 2026 මාර්තු 5 දිනැති අංක 2478/41 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් 2026 මාර්තු 9 දිනය ලංකා විදුලිබල මණ්ඩලයේ (ලංවිම) අනුප්‍රාප්තික සමාගම්වල මෙහෙයුම් නීත්‍යානුකූලව ආරම්භ කිරීම සනිටුහන් කරමින් ‘‘බලපැවැත්වෙන දිනය’’ ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. මෙම ප්‍රතිසංස්කරණවලට අනුකූලව, විදුලි උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදාහැරීම, පද්ධති මෙහෙයුම් සහ ඒ ආශ්‍රිත සහායක සේවා ඇතුළුව විදුලිබල අගය දාමයේ විවිධ කාර්යයන් වෙන් වෙන්ව ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ පූර්ණ හිමිකාරිත්වය දරන සමාගම් හයක් ස්ථාපිත කරන ලදී. එම සමාගම් සී/ස ඉලෙක්ට්‍රිසිටි ජෙනරේෂන් ලංකා (පුද්ගලික) සමාගම, සී/ස නැෂනල් ට්‍රාන්ස්මිෂන්

නෙට්වර්ක් සර්විස් ප්‍රවයිඩර් (පුද්ගලික) සමාගම, සී/ස ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුෂන් ලංකා (පුද්ගලික) සමාගම, සී/ස නැෂනල් සිස්ටම් ඔපරේටර් (පුද්ගලික) සමාගම, සී/ස එනර්ජි වෙන්චර්ස් ලංකා (පුද්ගලික) සමාගම සහ සී/ස සීර්බී එම්ප්ලෝයීස් ෆන්ඩ් (පුද්ගලික) සමාගම වශයෙන් වේ.

විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස, අනුප්‍රාප්තික සමාගම් වෙත අනුයුක්ත වීමට තෝරා නොගත් ලංචිම සේවකයින් සඳහා ක්‍රියාත්මක කළ ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමය සඳහා පහසුකම් සැලසීමට මහා භාණ්ඩාගාරය විසින් රු. මිලියන 8,006 ක කොටස් ප්‍රාග්ධන දායකත්වයක් ද ලබා දෙන ලදී.

2026 වර්ෂයේ පළමු මාස හය තුළදී, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් විදුලි ගාස්තු සංශෝධන දෙකක් අනුමත කරන ලදී. 2026 අප්‍රේල් මාසයේදී සිදු කරන ලද දෙවන කාර්තුවේ ගාස්තු සමාලෝචනයේදී, අවසාන පාරිභෝගික විදුලි ගාස්තුවල සමස්ත සාමාන්‍යයේ සියයට 10.3 ක ඉහළ නැංවීමක් අනුමත කරන ලදී. ඉන් අනතුරුව, 2026 මැයි මාසයේදී සිදු කරන ලද විශේෂ ගාස්තු සමාලෝචනයකින් පසුව, මාසික විදුලි පරිභෝජනය ඒකක 180 ඉක්මවන ගෘහස්ථ, සාමාන්‍ය කාර්ය සහ ආගමික කාර්ය පාරිභෝගිකයින්; H2 සහ H3 කාණ්ඩ යටතේ ඇති හෝටල් පාරිභෝගිකයින්; I2 සහ I3 කාණ්ඩ යටතේ ඇති කාර්මික පාරිභෝගිකයින්; සහ සියලුම රාජ්‍ය ආයතන යන තෝරාගත් පාරිභෝගික කාණ්ඩ සඳහා අතිරේක සියයට 18.0 ක ගාස්තු වැඩිවීමක් අනුමත කරන ලදී. මේ අතර, සමස්ත පාරිභෝගික පදනමෙන් ආසන්න වශයෙන් සියයට 95 ක් නියෝජනය කරන අනෙකුත් පාරිභෝගික කාණ්ඩයන්ට සහාය ලබා දීම සඳහා රජය විසින් සී/ස නැෂනල් සිස්ටම් ඔපරේටර් (පුද්ගලික) සමාගම වෙත රු. මිලියන 15,000 ක සහනාධාරයක් ලබා දෙන ලදී.

2025 වර්ෂයේ පළමු මාස හය තුළදී, ජල විදුලිය, තාප විදුලිය (ගල් අඟුරු), සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය, සුළං විදුලිය සහ වහල මත සවි කළ සූර්ය බලශක්තිය, හා තාප විදුලිය (ඉන්ධන) ලෙස 34:31:23:12 ක්ව පැවති උත්පාදන සංයුතිය 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ 25:30:24:21 ක් ලෙස වෙනස් වී ඇත. ඉල්ලුමේ වර්ධනය පිළිබිඹු කරමින්, සමස්ත විදුලි උත්පාදනය ආසන්න වශයෙන් ගි.වො.පැය 9,304 ක් දක්වා සියයට 7.0 කින් ඉහළ ගොස් ඇත. එම කාලය තුළම, ජල විදුලි උත්පාදනය ආසන්න වශයෙන් සියයට 23.0 කින් ගි.වො.පැය 2,975 සිට 2,294 ක් දක්වා අඩු විය. වහල මත සවි කළ සූර්ය බලශක්ති පද්ධති මඟින් සිදු කරන ලද විදුලි උත්පාදනය ආසන්න වශයෙන් සියයට 57.0 කින් සැලකිය යුතු ලෙස ගි.වො.පැය 711 සිට ගි.වො.පැය 1,115 ක් දක්වා වැඩි වුවද, වැඩි වූ විදුලි ඉල්ලුම සහ ජල විදුලි උත්පාදනයේ අඩුවීමෙහි ඒකාබද්ධ බලපෑම පියවාලීමට එම වැඩිවීම ප්‍රමාණවත් නොවීය. ඒ අනුව, පැන නැඟුනු සැපයුම් අවශ්‍යතාව සපුරාලීම සඳහා ඉන්ධන මත පදනම් වූ තාප විදුලි උත්පාදනය ආසන්න වශයෙන් සියයට 88.0 කින් ගි.වො.පැය 1,014 සිට ගි.වො.පැය 1,904 ක් දක්වා ඉහළ ගොස් ඇත.

2026 වර්ෂයේ පළමු මාස හය තුළ විදුලි අලෙවියෙන් උපයාගත් ආදායම සියයට 20.0 කින් රු. බිලියන 231.2 ක් දක්වා ඉහළ ගොස් ඇත. 2025 වර්ෂයේ පළමු මාස හය තුළ ලංචිම විසින් වාර්තා කළ රු. බිලියන 192.5 ක ආදායමට සාපේක්ෂව, 2026 වර්ෂයේ පළමු මාස හයේ ඉපැයූ ආදායම තුළ 2026 මාර්තු 9 දක්වා ලංචිම විසින් විදුලි අලෙවියෙන් උපයාගත් රු. බිලියන 80 ක ආදායම සහ ඉතිරි කාලය තුළ සී/ස ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුෂන් ලංකා (පුද්ගලික) සමාගම විසින් උපයාගත් රු. බිලියන 151.1 ක ආදායම ඇතුළත් වේ. මෙම ආදායමේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සමාලෝචනයට ලක් වූ කාලපරිච්ඡේදය තුළ විදුලි ඉල්ලුම සියයට 7.0 කින් ගි.වො.පැය 9,304 ක් දක්වා ඉහළ යෑම සහ විදුලි ගාස්තු අඛණ්ඩව අවස්ථා දෙකකදී ඉහළ නැංවීමත් ය. ඒ අනුව, 2025 වර්ෂයේ පළමු මාස හය තුළ විදුලි ඒකකයක් සඳහා වූ සාමාන්‍ය අලෙවි ආදායම කි.වො.පැයට රු. 24.6 ට සාපේක්ෂව 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය සඳහා කි.වො.පැයට රු. 31.9 ක් දක්වා ඉහළ ගොස් ඇත. 2026 ජනවාරි 1 සිට මාර්තු 9 දක්වා කාලපරිච්ඡේදය තුළ ලංචිම විසින් රු. බිලියන 1.48 ක ශුද්ධ ලාභයක් වාර්තා කරන ලදී.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

2026 වර්ෂයේ පළමු කාර්තුව අවසානයේ දී මැද පෙරදිග ගැටුම්කාරී තත්ත්වය උග්‍ර වීම හේතුවෙන් දේශීය ඉන්ධන මිල ගණන් ඉහළ යාම පෙන්නුම් කරමින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි 2025 වර්ෂයේ පළමු මාස හය තුළ වාර්තා වූ රු. බිලියන 410.7 ට සාපේක්ෂව ශුද්ධ විකුණුම් ආදායම 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 576.6 ක් දක්වා සියයට 40.4 කින් ඉහළ ගොස් ඇත. මෙම ගැටුම්කාරී තත්ත්වය හෝමුස් සමුද්‍ර සන්ධිය හරහා ඛනිජ තෙල් ප්‍රවාහනයට සීමා පැනවීම ඇතුළුව ගෝලීය බලශක්ති සැපයුම් දාමයන්ට සැලකිය යුතු බාධා ඇති කළ අතර, ගෝලීය බොරතෙල් හා ඛනිජ තෙල් මිල ගණන් මෙන්ම නැව් ගාස්තු සහ රක්ෂණ වියදම් ද අසාමාන්‍ය ලෙස වර්ධනය වීමට මෙය හේතු පාදක විය. ගෝලීය ඛනිජ තෙල් මිල ඉහළ යාම සහ ඛනිජ තෙල් ආනයනය සඳහා දැරීමට සිදු වූ ඉහළ පිරිවැය පෙන්නුම් කරමින්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ත ඛනිජ තෙල් ආනයන වියදම 2025 වර්ෂයේ පළමු මාස හය තුළ වූ ඇ.ඩො. මිලියන 999.9 ට සාපේක්ෂව 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ. ඩො. මිලියන 1,737.9 ක් දක්වා සියයට 73.8 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. ඒ අනුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි 2025 වර්ෂයේ පළමු මාස හය තුළ රු. බිලියන 377.9 ක් වූ විකුණුම්

පිරිවැය 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ සියයට 50.2 කින් රු. බිලියන 567.6 ක් දක්වා ඉහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි 2025 වර්ෂයේ පළමු මාස හය තුළ රු. බිලියන 32.8 ක් වූ දළ ලාභය 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 8.9 ක් දක්වා සියයට 72.9 කින් පහත වැටී ඇත.

මැද පෙරදිග කලාපයේ ඇති වූ ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන් සාමාන්‍ය ජනතාවගේ දෛනික ජීවිතයට සහ සමස්ත ආර්ථිකයට ඇති විය හැකි අහිතකර බලපෑම අවම කිරීම සඳහා රජය විසින් ඛනිජ තෙල් කර්මාන්තයට සහනාධාර ලබාදීමට පියවර ගන්නා ලදී. ඒ අනුව, දේශීය ඛනිජ තෙල් වෙළෙඳපොළ ක්‍රියාකරුවන් සඳහා මහා භාණ්ඩාගාරය විසින් ආසන්න වශයෙන් රු. බිලියන 57 ක් ඉන්ධන සහනාධාර ලෙස ලබා දෙන ලදී. 2026 අප්‍රේල් සිට ජුනි දක්වා කාලය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ලබා දුන් සහනාධාර ප්‍රමාණය රු. බිලියන 41 ක් විය.

ප්‍රධාන වශයෙන් 2026 වර්ෂයේ අප්‍රේල් සිට ජුනි දක්වා කාලය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ලැබුණු සහනාධාරය හේතුවෙන්, දළ ලාභයේ සැලකිය යුතු පහළ යාමක් තිබියදීත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි 2025 වර්ෂයේ පළමු මාස හය තුළ රු. බිලියන 11.1 ක් වූ මෙහෙයුම් ලාභයට සාපේක්ෂව 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයේ මෙහෙයුම් ලාභය රු. බිලියන 23.9 ක් දක්වා ඉහළ ගොස් ඇත. තවද, 2025 වර්ෂයේ පළමු මාස හය තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ රු. බිලියන 3.5 ක් වූ උපලබ්ධි නොවූ විනිමය ලාභයට සාපේක්ෂව 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 7.2 ක උපලබ්ධි නොවූ විනිමය ලාභයක් වාර්තා කර ඇත. ඒ අනුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 2025 වර්ෂයේ පළමු මාස හය තුළ රු. බිලියන 17.0 ක් වූ ශුද්ධ ලාභයට සාපේක්ෂව 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ ශුද්ධ ලාභය රු. බිලියන 29.2 ක් දක්වා සියයට 71.8 කින් ඉහළ ගොස් ඇත.

ශ්‍රීලංකන් ගුවන් සමාගම

ශ්‍රීලංකන් ගුවන් සමාගම 2026/27 මූල්‍ය වර්ෂයේ පළමු මාස තුන තුළ සැලකිය යුතු මූල්‍ය අලාභයක් වාර්තා කර ඇත. සමාගම විසින් ඉදිරිපත් කරන ලද විගණනය නොකළ කළමනාකරණ ගිණුම් අනුව, අදාළ කාලපරිච්ඡේදය තුළ මුළු ආදායම රු. බිලියන 82.8 ක් වූ අතර, 2025/26 මූල්‍ය වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයේ දී මුළු ආදායම රු. බිලියන 62.6 ක් විය. අදාළ කාලපරිච්ඡේදය තුළ මැදපෙරදිග කලාපයේ ගැටුම්කාරී තත්ත්වය උත්සන්න වීම හේතුවෙන් ගුවන් සම්බන්ධතා කෙරෙහි බාධා ඇති වූ අතර, ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් මැදපෙරදිග ගමනාන්ත කිහිපයක් වෙත ගුවන් ගමන් තාවකාලිකව අත්හිටුවා ගුවන් අවකාශ සීමා ලිහිල් කිරීමෙන් අනතුරුව නැවත ගුවන් ගමන් ආරම්භ කරන ලදී. විශේෂයෙන්ම මැදපෙරදිග ගමනාන්ත, ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ගුවන් ගමන් ජාලය කෙරෙහි ඇති වැදගත්කම හේතුවෙන්, මෙම බාධා වීම් මගි හා භාණ්ඩ ප්‍රවාහන ආදායම් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කිරීමේ අවදානමක් ඇති කළේය. ඒ අතර, එම කාලය තුළ කලාපීය ගුවන් ගමන් තාවකාලිකව ශ්‍රී ලංකාව හරහා යොමු කිරීම සහ ගුවන් ගමන් මාර්ග වෙනස් කිරීම, ගුවන් සේවා අංශය වෙත ඇති වූ අහිතකර බලපෑම යම් ප්‍රමාණයකට අවම කරමින් ඇතැම් අතිරේක ගුවන් සේවා හා මගී ගමන් සේවා සඳහා අවස්ථාව සලසන ලදී.

මුළු ආදායමේ වර්ධනයක් පැවතියද, 2025/26 මූල්‍ය වර්ෂයේ පළමු මාස තුන තුළ වූ රු. බිලියන 67.8 ට සාපේක්ෂව 2026/27 මූල්‍ය වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ මුළු වියදම සියයට 40.4 කින් රු. බිලියන 95.2 ක් දක්වා ඉහළ යන ලදී. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් ගුවන් යානා ඉන්ධන පිරිවැය සියයට 93.0 කින් පමණ රු. බිලියන 41.2 ක් දක්වා ඉහළ යාම හේතු විය. ඒ අනුව, විදේශ විනිමය අනුපාත වෙනස්වීම්වල බලපෑමට පෙර අදාළ කාලපරිච්ඡේදය තුළ සමාගම ආසන්න වශයෙන් රු. බිලියන 12.5 ක මෙහෙයුම් අලාභයක් වාර්තා කර ඇත.

විදේශ විනිමය අනුපාතවල සිදු වූ වෙනස්වීම් සමාගමේ මූල්‍ය කාර්යසාධනය කෙරෙහි තවදුරටත් අහිතකර ලෙස බලපා ඇත. ඒ අනුව, සමාගම විසින් සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා රු බිලියන 35.6 ක බදු පෙර අලාභයක් වාර්තා කර ඇති අතර, 2025/26 මූල්‍ය වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයේදී වාර්තා වූ ශුද්ධ අලාභය රු. බිලියන 12 ක් විය. ශ්‍රීලංකන් කේටරින් සමාගමේ වර්ධනය වූ රු. බිලියන 3.4 ක ශුද්ධ ආදායම හේතුවෙන් සමූහයේ ශුද්ධ අලාභය රු. බිලියන 32.2 ක් දක්වා අඩු විය.

ඉහත මූල්‍ය කාර්යසාධනය මඟින් ශ්‍රීලංකන් ගුවන් සමාගම අඛණ්ඩව සැලකිය යුතු ව්‍යුහාත්මක මූල්‍ය හා ද්‍රවශීලතා අභියෝගයන්ට මුහුණ දෙමින් සිටින බව පෙන්නුම් කරයි. සැලකිය යුතු මෙහෙයුම් හිඟය, ඉහළ ඉන්ධන හා නඩත්තු පිරිවැය, විදේශ විනිමය අලාභ සහ මූල්‍ය පිරිවැය හේතුවෙන් සිය මෙහෙයුම් හා මූල්‍ය වගකීම් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර මුදල් ප්‍රවාහයක් ජනනය කිරීමට සමාගමට ඇති හැකියාව තවදුරටත් සීමා වී ඇත. සමාගම සතුව පවතින ඉහළ ණය බර සහ අඛණ්ඩ මෙහෙයුම් පවත්වාගෙන යාම සඳහා රජයේ සහාය අවශ්‍ය වීම හේතුවෙන් මෙම තත්ත්වය විශේෂයෙන් වැදගත් වේ.

ශ්‍රීලංකන් ගුවන් සමාගමේ මූල්‍ය තත්ත්වය අඛණ්ඩව ඉහළ ණය බරකින් යුක්ත විය. 2026 ජුනි මස අවසානය වන විට සමාගමේ මුළු වත්කම් රු. බිලියන 209.9 ක් වූ අතර, මුළු වගකීම් රු. බිලියන 561.4 ක් විය. ඒ අනුව, සමාගම විසින් රු. බිලියන 351.5 ක සෘණ හිමිකම්

ප්‍රාග්ධනයක් වාර්තා කර ඇත. එබැවින්, සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ ද සමාගම සිය ප්‍රාග්ධනයේ සැලකිය යුතු හානියකට ලක්ව පවතින තත්ත්වයක් වාර්තා කර ඇත.

2026 වර්ෂයේ පළමු මාස හය තුළ අදාළ ත්‍රෛපාර්ශ්වික ගිවිසුම් යටතේ ලංකා බැංකුව සහ මහජන බැංකුව විසින් ලබා දී ඇති තෝරාගත් ණය පහසුකම්වල පළමු හා දෙවන වාරික ගෙවීම් සඳහා රජය විසින් මූල්‍ය සහාය ලබා දෙන ලදී. මීට අමතරව, ශ්‍රීලංකන් ගුවන් සමාගමේ කෙටි කාලීන මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා රජය විසින් ඇ.ඩො. මිලියන 30 ක මුදලක් ලබාදෙන ලදී. තවද, ඇ.ඩො. මිලියන 175 ක රජය විසින් සහතික කරන ලද බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීමෙන් අනතුරුව, ප්‍රතිව්‍යුහගත කරන ලද ඇ.ඩො. මිලියන 126.5 ක බැඳුම්කර 2026 මාර්තු 20 දින සිට බලපැවැත්වෙන පරිදි රජයේ ණය තොගයට ඇතුළත් කරන ලදී. අඛණ්ඩ මෙහෙයුම් හා බාහිර බලපෑම් මධ්‍යයේ වුවද සමාගමේ මෙහෙයුම් පවත්වාගෙන යාමට සහ කෙටිකාලීන මූල්‍ය වගකීම් ඉටු කිරීම සඳහා මෙම ක්‍රියාමාර්ග මගින් අත්‍යවශ්‍ය සහායක් සපයනු ලැබීය. තවද, ශ්‍රීලංකන් ගුවන් සමාගමේ මූල්‍ය තිරසාරභාවය සහ වාණිජමය ශක්‍යතාව ශක්තිමත් කිරීම මෙන්ම රජය මත දිගුකාලීනව ඇති විය හැකි මූල්‍ය බර අවම කිරීමේ අරමුණින්, පුළුල් සමාලෝචනයක් සිදු කිරීම සඳහා උපායමාර්ග හා ප්‍රතිව්‍යුහගත කිරීමේ කමිටුවක් ස්ථාපිත කිරීමට 2026 ජුනි මාසයේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2026 වර්ෂයේ පළමු මාස හය තුළ ජල සම්බන්ධතා ආසන්න වශයෙන් 60,000 ක් පද්ධතියට එක් කිරීමට සමත් වී ඇති අතර, ඒ අනුව 2026 ජුනි මස අවසානය වන විට සමස්ත ජල සම්බන්ධතා සංඛ්‍යාව මිලියන 3.31 ක් දක්වා ඉහළ නංවා ඇත. කෙසේ වෙතත්, 2026 ජුනි මස අවසානය වන විට නළ ජල සැපයුම් ආවරණය සහ ආරක්ෂිත පානීය ජල ආවරණය පිළිවෙළින් සියයට 62.8 ක් සහ සියයට 94.5 ක් දක්වා පහත වැටී ඇති අතර, 2025 ජුනි මස අවසානයේදී එම අගයන් පිළිවෙළින් සියයට 63.7 ක් සහ සියයට 99.1 ක් විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ වාර්තාකරණ ක්‍රමවේදයන්හි වෙනස්කම් වන අතර, 2025 වර්ෂයේදී ආවරණ දර්ශක ගෘහ ඒකක පදනම මත වාර්තා කර ඇති අතර, 2026 වර්ෂයේ දී ජනගහන පදනම මත වාර්තා කර ඇත. මේ අතර, නළ මලාපවහන ආවරණය 2025 ජුනි මස අවසානයේ පැවති සියයට 2.08 ට සාපේක්ෂව 2026 ජුනි මස අවසානය වන විට සියයට 2.11 ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගොස් ඇත.

2026 වර්ෂයේ පළමු මාස හය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ආදායම, 2025 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 41.5 හා සසඳන විට සියයට 5.1 කින් රු. බිලියන 43.6 ක් දක්වා ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් ජලය පොම්ප කිරීමේ පිරිවැය මෙන්ම කුලී, ගාස්තු සහ වෙනත් බදු ඉහළ යාම හේතුවෙන්, විකුණුම් පිරිවැය රු. බිලියන 15 සිට රු. බිලියන 16.5 ක් දක්වා ආසන්න වශයෙන් සියයට 10.0 කින් ඉහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2025 වර්ෂයේ පළමු මාස හය තුළ වාර්තා වූ රු. බිලියන 26.5 ක දළ ලාභයට සාපේක්ෂව 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළදී මණ්ඩලය රු. බිලියන 27.1 ක දළ ලාභයක් වාර්තා කර ඇත. මේ අතර, 2025 වර්ෂයේ පළමු මාස හය තුළ පැවති රු. බිලියන 17.7 ක ශුද්ධ ලාභයට සාපේක්ෂව 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ දී මණ්ඩලයේ ශුද්ධ ලාභය රු. බිලියන 16.2 ක් දක්වා සියයට 8.5 කින් පහත වැටී ඇත. මේ අතර, සමාලෝචනයට භාජනය කළ කාලපරිච්ඡේදය තුළ ඒකකයක සාමාන්‍ය පිරිවැය රු. 88 ක් ලෙස වාර්තා වී ඇති අතර, එය 2025 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. 82 ට සාපේක්ෂව රු. 6 ක වැඩිවීමකි.

2025 වර්ෂයේ පළමු මාස හය තුළ පිළිවෙලින් ඝන මීටර් මිලියන 419.1 ක් සහ ඝන මීටර් මිලියන 317.6 ක් ලෙස පැවති ජල නිෂ්පාදනය සහ ජල අලෙවිය මෙම කාලපරිච්ඡේදය තුළ පිළිවෙලින් ඝන මීටර් මිලියන 440.8 ක් සහ ඝන මීටර් මිලියන 333.5 ක් දක්වා ළඟාවෙමින් ආසන්න වශයෙන් සියයට 5.0 කින් ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ ආදායම් නොලබන ජල ප්‍රමාණය සියයට 24.2 සිට සියයට 24.4 ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගොස් ඇත.

2026 වර්ෂයේ පළමු මාස හය තුළදී මණ්ඩලය විසින් ව්‍යාපෘති දෙකක් සම්පූර්ණ කරන ලදී. මීට අමතරව, ප්‍රධාන ජල සම්පාදන ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට සහ ණය ආපසු ගෙවීමට පහසුකම් සැලසීම සඳහා, 2026 වර්ෂයේ පළමු මාස හය තුළ දී මහා භාණ්ඩාගාරය විසින් රු. බිලියන 5.9 ක හිමිකම් ප්‍රාග්ධනයක් ලබා දී ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

මැදපෙරදිග කලාපයේ උත්සන්න වූ ගැටුම් හේතුවෙන් ජාත්‍යන්තර වෙළඳාම සහ නාවික ප්‍රවාහන කටයුතු සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිතතාව ඉහළ ගොස් ඇති පසුබිමක, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 2026 වර්ෂයේ පළමු මාස හය තුළ රු. බිලියන 53.1 ක මුළු ආදායමක් වාර්තා කළ අතර, එය 2025 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයේ වාර්තා කළ රු. බිලියන 52 ක ආදායමට සාපේක්ෂව සියයට 2.1 ක සුළු වර්ධනයකි. මෙහෙයුම් ආදායම රු. බිලියන 44.1 ක් දක්වා සියයට 9.0 කින් ඉහළ යාම මෙම කාර්යසාධනයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. මෙම කාලපරිච්ඡේදය තුළ ගෝලීය නාවුක මාර්ගවල ඇති විය හැකි බාධා කළමනාකරණය කිරීම සහ වරාය මෙහෙයුම් අඛණ්ඩව

පවත්වාගෙන යාම තහවුරු කිරීම සඳහා වරාය අධිකාරිය විසින් පර්යන්ත මෙහෙයුම්කරුවන් සහ ප්‍රධාන නාවුක සමාගම් සමඟ සමීප සම්බන්ධීකරණයකින් කටයුතු කරන ලදී. විශේෂයෙන්ම, ආසියාව, මැදපෙරදිග, අප්‍රිකාව සහ යුරෝපය සම්බන්ධ කරන ප්‍රධාන ප්‍රතිඅපනයන මධ්‍යස්ථානයක් ලෙස කොළඹ වරායේ කාර්යභාරය හේතුවෙන් වෙනස්වන කලාපීය නාවුක පරිසරය කොළඹ වරාය සඳහා අවදානම් මෙන්ම අවස්ථාවන් ද ඇති කර ඇත. මෙහෙයුම් කාර්යසාධනය අනුව, අදාළ කාලපරිච්ඡේදය තුළ හසුරුවන ලද බහාලුම් භාණ්ඩ ප්‍රමාණය අඩි විස්සේ බහාලුම් ඒකක මිලියන 1.2 ක් දක්වා සියයට 6.0 කින් අඩු වූ අතර, සාම්ප්‍රදායික භාණ්ඩ ප්‍රමාණය මෙට්‍රික් ටොන් මිලියන 5.8 ක් දක්වා සියයට 15.0 කින් පමණ ඉහළ ගොස් ඇත.

2025 වර්ෂයේ පළමු මාස හයට අනුකූලව 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ මුළු වියදම් සමස්තයක් ලෙස නොවෙනස්ව රු. බිලියන 23.7 ක් ලෙස පැවතිණි. ඒ අනුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2026 වර්ෂයේ පළමු මාස හය තුළ රු. බිලියන 29.4 ක මෙහෙයුම් ලාභයක් ඉපැයූ අතර, 2025 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයේ දී මෙහෙයුම් ලාභය රු. බිලියන 28.3 ක් විය.

මූල්‍ය ආදායම සියයට 25.0 කින් ඉහළ යාම හේතුවෙන්, 2025 වර්ෂයේ පළමු මාස හය තුළ වූ රු. බිලියන 1.7 ට සාපේක්ෂව 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ ශුද්ධ මූල්‍ය ආදායම රු. බිලියන 2.4 ක් දක්වා ඉහළ ගොස් ඇත. මීට අමතරව, 2025 වර්ෂයේ පළමු මාස හය තුළ වාර්තා කළ රු. බිලියන 0.8 ක විදේශ විනිමය අලාභයට සාපේක්ෂව, 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ අධිකාරිය විසින් රු. බිලියන 2.7 ක විදේශ විනිමය ලාභයක් වාර්තා කර ඇත. ඒ අනුව, විදේශ විනිමය ලාභයෙන් පසු බදු පෙර ලාභය රු. බිලියන 34.5 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර, 2025 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයේ දී එය රු. බිලියන 29.2 ක් විය. ආදායම් බදු සඳහා රු. බිලියන 5.4 ක ප්‍රතිපාදන වෙන් කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි ලාභය 2025 වර්ෂයේ පළමු මාස හය තුළ වූ රු. බිලියන 24.5 ට සාපේක්ෂව, 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 29.1 ක් දක්වා සියයට 19.0 ක ඉහළ යාමක් වාර්තා කර ඇත.

සමස්තයක් වශයෙන්, 2026 වර්ෂයේ පළමු මාස හය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඉහළ මෙහෙයුම් ආදායම, වියදම් ස්ථාවර මට්ටමක පැවතීම, වැඩි වූ ශුද්ධ මූල්‍ය ආදායම සහ හිතකර විදේශ විනිමය අනුපාත වෙනස්වීම්හි සහායෙන් වැඩිදියුණු වූ ලාභදායීතාවක් පෙන්නුම් කර ඇත. කෙසේ වෙතත්, අධිකාරියේ මූල්‍ය කාර්යසාධනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා බහාලුම් භාණ්ඩ ප්‍රමාණයේ අඩුවීම සහ ගෝලීය නාවුක ප්‍රවාහන පරිසරයේ සිදුවන වෙනස්කම් සමීපව අධීක්ෂණය කළ යුතු ක්ෂේත්‍ර ලෙස තවදුරටත් පවතී.

ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම

ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම 2026 වර්ෂයේ පළමු මාස හය තුළ ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයක් වාර්තා කර ඇත. 2025 වර්ෂයේ පළමු මාස හය තුළ වූ රු. බිලියන 23.9 ට සාපේක්ෂව 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ මුළු ආදායම රු. බිලියන 27.5 ක් දක්වා සියයට 15.0 කින් ඉහළ ගොස් ඇත. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් ගුවන් සේවා නොවන ආදායම සියයට 17.0 කින් රු. බිලියන 23.4 ක් දක්වා ඉහළ යාම හේතු විය. මැදපෙරදිග ගැටුම්කාරී තත්ත්වය උත්සන්න වීම හේතුවෙන් කලාපීය ගුවන් සේවා කටයුතුවලට සැලකිය යුතු බාධා ඇති වූ පසුබිමක මෙම ආදායම් වර්ධනය අත්කරගෙන ඇත. මැදපෙරදිග ගුවන් අවකාශය තාවකාලිකව වසා දැමීම සහ එම කලාපයේ ගමනාන්ත කිහිපයක් වෙත සහ ඉන් පිටතට ගුවන් ගමන් අත්හිටුවීම හේතුවෙන් ගුවන් ගමන් සැලකිය යුතු සංඛ්‍යාවක් අවලංගු කිරීමට සිදු වූ අතර, එක් දිනක් තුළ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ පමණක් ගුවන් ගමන් 115 ක් අවලංගු කරන ලදී. කෙසේ වෙතත්, මෙම බාධාකාරී තත්ත්වය තුළ ගුවන් යානා සහ මගීන් ශ්‍රී ලංකාව වෙත තාවකාලිකව යොමු කිරීම සහ ගුවන් ගමන් මාර්ග වෙනස් කිරීම හේතුවෙන් මෙරට ගුවන් සේවා අංශයට යම් පරිපූරක ප්‍රතිලාභයක් ලැබුණු අතර, එමඟින් ගුවන්තොටුපළ ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා ද සහායක් ලැබිණි.

සමාගමේ මුළු වියදම 2025 වර්ෂයේ පළමු මාස හය තුළ වූ රු. බිලියන 11.1 ට සාපේක්ෂව 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ සියයට 1.8 කින් සුළු වශයෙන් රු. බිලියන 11.3 ක් දක්වා ඉහළ යන ලදී. ඒ අනුව, ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමට සිය මෙහෙයුම් ලාභය 2025 වර්ෂයේ පළමු මාස හය තුළ වූ රු. බිලියන 12.8 ට සාපේක්ෂව 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 26.0 කින් රු. බිලියන 16.1 ක් දක්වා ඉහළ නංවා ගැනීමට හැකි විය.

ඉහළ මූල්‍ය ආදායම සහ හිතකර විදේශ විනිමය අනුපාත වෙනස්වීම් හේතුවෙන් ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමෙහි මූල්‍ය කාර්යසාධනය තවදුරටත් ශක්තිමත් විය. මූල්‍ය ආදායම සියයට 20.0 කින් රු. බිලියන 4.2 ක් දක්වා ඉහළ ගිය අතර, 2025 වර්ෂයේ පළමු මාස හය තුළ වාර්තා වූ රු. බිලියන 4.3 ක විදේශ විනිමය අලාභයට සාපේක්ෂව, 2026 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 5.6 ක විදේශ විනිමය ලාභයක් වාර්තා කරන ලදී. ඒ අනුව, 2026 වර්ෂයේ පළමු මාස හය තුළ ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම විසින් රු. බිලියන 24.9 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇති අතර, එය 2025 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයේ දී වූ රු. බිලියන 11.2 ක බදු පෙර ලාභයට සාපේක්ෂව සියයට 122.0 ක වර්ධනයකි.

සමස්තයක් වශයෙන්, සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම ශක්තිමත් මූල්‍ය කාර්යසාධනයක් වාර්තා කර ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ගුවන් සේවා සහ සංචාරක අංශ සඳහා මැදපෙරදිග ගුවන් මාර්ගවල පවතින වැදගත්කම හේතුවෙන්, මැදපෙරදිග කලාපයේ තවදුරටත් පවතින අවිනිශ්චිතතාව, විශේෂයෙන්ම ගුවන් සම්බන්ධතා සහ මගී ගමන් සඳහා ඇති විය හැකි බලපෑම අඛණ්ඩව සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ.

3.1 වගුව | රජය සතු ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්වල ප්‍රතිසංස්කරණ/ ගෙන ඇති ප්‍රධාන පියවර

ආයතනය	ප්‍රතිසංස්කරණ/ ගෙන ඇති ප්‍රධාන පියවර
රාජ්‍ය බැංකු	• ස්වාධීන අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩලවල බහුතරය නියෝජනය කිරීම තහවුරු කිරීමේ අරමුණින්, ස්වාධීන අධ්‍යක්ෂවරුන් තෝරා ගැනීමේ සහ පත් කර ගැනීමේ විශේෂ ක්‍රියා පටිපාටියක් හරහා අධ්‍යක්ෂ මණ්ඩලවල පාලනය සහ සුළුදායීත්වය ශක්තිමත් කරන ලදී. • මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා GovPay, රාජ්‍ය ඩිජිටල් ගෙවීම් ක්‍රමවේදය සහ LankaQR වැනි ක්‍රමවේදයන් වෙත ප්‍රවේශය පුළුල් කිරීම සහ ඒකාබද්ධ කිරීම ශක්තිමත් කිරීම. • ශක්තිමත් අධීක්ෂණ යාන්ත්‍රණයක් සහ වැඩිදියුණු කළ නැවත අයකර ගැනීමේ ක්‍රියාවලීන් හරහා ණය කළඹේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම. • කාලීන නියාමන අවශ්‍යතා සමඟ යාවත්කාලීන වීම, අත්‍යවශ්‍ය වෙනස්කම් සිදුකිරීම සහ පාරදෘෂ්‍ය වාර්තාකරණ භාවිතයන් පවත්වාගෙන යාම. • දැනට සිටින ගනුදෙනුකරුවන් වෙත සහය දීමට සහ නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා නව නිෂ්පාදිත සංවර්ධනය කිරීම. • මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීමේ අභිලාශයෙන් වරප්‍රසාද නොලත් ප්‍රජාව වෙත මූල්‍ය සේවා ලබාදීම පුළුල් කිරීම.
ලංකා විදුලිබල මණ්ඩලය සහ එහි අනුප්‍රාප්තික සමාගම්	• ලංවිම වෙත පැවරී තිබූ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවන ලද සමාගම් හය 2026.03.09 දින සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී.
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	• 2026 අප්‍රේල් සිට ජුනි දක්වා කාලය තුළ ගෝලීය බලශක්ති වෙළෙඳපොළේ ඇති වූ බාධා හේතුවෙන් සාමාන්‍ය ජනතාවගේ දෛනික ජීවිතයට සහ සමස්ත ආර්ථිකයට ඇතිවන බලපෑම අවම කිරීම සඳහා, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත රු. බිලියන 41 ක් ඇතුළුව, සංස්ථාවට සහ අනෙකුත් ඛනිජ තෙල් වෙළෙඳපොළේ ක්‍රියාත්මක වන සමාගම් තුන සඳහා ආසන්න වශයෙන් රු. බිලියන 57 ක ඉන්ධන සහනාධාර ලබා දෙන ලදී.
ඒ/ස ශ්‍රීලංකන් ගුවන් සමාගම	• 2024 ජුනි මාසයේදී කල් පිරීමට නියමිත වූ ඇ. ඩො. මිලියන 175 ක වටිනාකමකින් යුත් ඇප බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කරන ලද අතර, එහි වටිනාකම ඇ. ඩො. මිලියන 126.5 ක් ලෙස තීරණය විය. තවද, මෙම ප්‍රතිව්‍යුහගත බැඳුම්කර වටිනාකම 2026 මාර්තු 20 සිට රජයේ ණය තොගයට ඇතුළත් කර ගැනීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. • 2026 මැයි 04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, ගුවන් සේවයේ කඩිනම් මූල්‍ය අවශ්‍යතා සඳහා සහාය වීම පිණිස ඇ. ඩො. මිලියන 30 ක කෙටි කාලීන අරමුදල් ලබා දෙන ලදී.
ශ්‍රී ලංකා වරාය අධිකාරිය	• ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විධායක නොවන කාර්ය මණ්ඩලය සඳහා වන බඳවා ගැනීමේ ක්‍රමවේදයන්ට අනුමැතිය ලබා දෙන ලද අතර, එමඟින් බඳවා ගැනීම් සහ කාර්ය මණ්ඩල සැකසුම් විධිමත් කිරීමටත් කාර්යක්ෂම කිරීමටත් මග පෑදේ.

මූලාශ්‍ර: රාජ්‍ය ව්‍යවසායයන් හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

3.2 වගුව | ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 හි බදු පෙර ලාභය

රු. මිලියන

	රාජ්‍ය ව්‍යවසාය	2024 (තක්ෂ)	2025 (තාවකාලික)	2026 (ජන.-ජූනි) (තාවකාලික)
1	ලංකා බැංකුව	106,904	120,827	62,655
2	මහජන බැංකුව	41,584	64,409	32,639
3	ජාතික ඉතිරිකිරීමේ බැංකුව	26,268	44,493	22,572
4	රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව	158	737	405
5	නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව	64	10	205
6	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	3,210	5,830	3,540
7	සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය	63,177	68,510	36,520
8	සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව	3,546	6,891	2,623
9	ජාතික රක්ෂණ භාර අරමුදල	16,442	9,391	12,833
10	ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව	560	592	507
11	කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය	-3,182	-1,907	335
12	ලංකා විදුලිබල මණ්ඩලය**	141,605	-38,740	1,479
13	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	34,188	36,461	29,156
14	ශ්‍රී ලංකා වරාය අධිකාරිය	46,349	57,246	34,505
15	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	23,833	31,604	16,171
16	සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම	28,671	33,658	24,854
17	සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සමාගම*	-7,595	-23,211	-35,588
18	ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය	547	4,312	-471
19	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව	-773	-899	-182
20	ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය	607	395	60
21	රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව[අ]	-1,217	-565	-193
22	සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගම	-64	1,410	999
23	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය	396	-143	287
24	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව	-69	-35	-60
25	ජනතා වතු සංවර්ධන මණ්ඩලය	-229	-222	-26
26	සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම	415	635	206
27	සීමාසහිත හලාවත වැවිලි සමාගම	219	650	272
28	සීමාසහිත කළුබෝවිටියන තේ කර්මාන්තශාලාව*	-7	84	16
29	ශ්‍රී ලංකා කජු සංස්ථාව	14	17	1
30	සීමාසහිත ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගම	-77	649	254
31	සීමාසහිත ලංකා පොස්පේට් සමාගම*	465	459	65
32	සීමාසහිත කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම*	-1	14	-5
33	සංවර්ධන ලොතරැයි මණ්ඩලය	4,197	7,487	5,343
34	ජාතික ලොතරැයි මණ්ඩලය	6,203	8,177	5,349
35	රාජ්‍ය ඖෂධ සහ නිෂ්පාදන සංස්ථාව	3,083	2,478	1,441
36	ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව	183	276	31
37	රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව	2,474	3,772	970
38	ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල	552	363	723
39	සීමාසහිත ස්වාධීන රූපවාහිනී ජාලය	3	62	-37
40	ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව	-247	-191	-166

රු. මිලියන

	රාජ්‍ය ව්‍යවසාය	2024 (තත්‍ය)	2025 (තාවකාලික)	2026 (ජන.-ජූනි) (තාවකාලික)
41	ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව	-176	-203	-68
42	ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය	25	35	6
43	රාජ්‍ය දැව සංස්ථාව	825	1,139	274
44	ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව*	370	429	65
45	සීමාසහිත ලංකා සතොස සමාගම	-776	-536	-89
46	රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව	284	145	-185
47	ලංකා ධීවර සංස්ථාව(අ)	-53	132	10
48	ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව	-101	-376	257
49	සීමාසහිත හොටෙල් ඩිවලොපර්ස් ලංකා සමාගම	-268	139	9
50	සීමාසහිත ලංකා සීනි සමාගම	-1,944	-3,193	-1,525
51	සීමාසහිත ලංකා පොහොර සමාගම(ආ)	118	-	-
52	සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම(ආ)	555	-	-
53	සීමාසහිත රාජ්‍ය පොහොර සමාගම*	-	723	234
	එකතුව	**541,316**	**444,421**	**259,276**

මූලාශ්‍ර : රාජ්‍ය ව්‍යවසායයන් හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

(ආ) මෙම සමාගම් දෙක ඒකාබද්ධ කිරීමෙන් රාජ්‍ය පොහොර සමාගම සංස්ථාගත කරන ලදී.

**2026 අප්‍රේල් - ජූනි*

***2026 සඳහා, 2026.01.01 සිට 2026.03.09 දක්වා කාලය සඳහා බදු පෙර ලාභය*

3.3 වගුව | රාජ්‍ය ව්‍යවසායයන් වෙතින් ලද අයබදු/ ලාභාංශ ආදායම

රු. මිලියන

රාජ්‍ය ව්‍යවසාය	තත්‍ය 2024	2025	2026 (ජන.-ජූනි)
අයබදු	**33,190**	**47,332**	**8,923**
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	-	6,088	-
ලංකා බැංකුව	-	5,000	-
මහජන බැංකුව	-	2,000	1,550
ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව	-	6,000	-
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව	9,000	3,000	-
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	-	200	-
රාජ්‍ය දැව සංස්ථාව	-	585	-
රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව	300	779	-
ජාතික රක්ෂණ භාර අරමුදල	2,919	4,973	602
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය	1,468	1,688	185
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය	25	145	90
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය	928	1,150	-
ජාතික ලොතරැයි මණ්ඩලය	1,060	1,250	315
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය	13	269	-
ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව	300	150	-
ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය	-	15	-

රු. මිලියන

රාජ්‍ය ව්‍යවසාය		කත්‍ය	
	2024	2025	2026 (ජන.-ජුනි)
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය	500	1,000	2,000
සිවිල් ගුවන් සේවා අධිකාරිය	750	1,000	-
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව	100	487	200
ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය	850	280	-
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය	-	5,000	-
ජාතික ගමනාගමන කොමිෂන් සභාව	250	300	250
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	-	275	250
ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධන අධිකාරිය	-	100	-
ශ්‍රී ලංකා වරාය අධිකාරිය	607	2,000	3,000
ජාතික ඖෂධ නියාමන අධිකාරිය	880	751	150
මාර්ග සංවර්ධන අධිකාරිය	1,749	2,128	-
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම	15	100	-
සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය	-	10	15
ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ ජාතික ආයතනය	85	30	-
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව	5	76	-
පශ්චාත් උපාධි අධ්‍යයන කළමනාකරණ ආයතනය	4	30	28
වෙනත් රාජ්‍ය ව්‍යවසායයන්	11,381	474	288
ලාභාංශ	**7,890**	**9,211**	**3,731**
සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව	1,271	1,987	4
සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම	1,286	2,931	-
සීමාසහිත ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගම	158	-	-
සීමාසහිත ලංකා පොස්පේට් සමාගම	75	125	-
සීමාසහිත ලංකා ලේලන්ඩ් සමාගම	-	14	-
සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම	75	-	111
සීමාසහිත මන්තායි සෝල්ට් සමාගම (සී/ස ජාතික ලුණු සමාගම)	-	30	40
සීමාසහිත ලංකා පොහොර සමාගම	15	-	-
සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම	30	-	-
සීමාසහිත පරන්තන් කෙමිකල් සමාගම	131	33	-
සීමාසහිත රජයේ වාණිජ නීතිගත සංස්ථාව	50	116	-
සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම	-	227	680
සීමාසහිත ඩි ලා රූ ලංකා (පුද්ගලික) සමාගම	1,324	494	-
සීමාසහිත ලංකා විදුලිබල සමාගම	436	436	-
සීමාසහිත ලංකා කාර්මික වතු සමාගම	98	101	-
සීමාසහිත ලංකා කෘෂි කර්මාන්ත සමාගම	202	226	131
වැවිලි සමාගම්	559	214	167
ලංකා ත්‍රිපෝෂ සමාගම	100	123	-
වෙනත් රාජ්‍ය ව්‍යවසායයන්	2,080	2,155	2,598
එකතුව	**41,080**	**56,543**	**12,654**

මූලාශ්‍ර : රාජ්‍ය ව්‍යවසායයන් හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

4 වන පරිච්ඡේදය

විදේශීය මූල්‍යයනය සහ රාජ්‍ය ණය කළමනාකරණය

4.1 සමාලෝචනය

2026 වසරේ පළමු භාගය තුළ ණය තත්ත්වය ප්‍රධාන වශයෙන් දේශීය මූල්‍යකරණය මත පදනම් වූ අතර, එය 2026 පළමු භාගයේ මුළු ණය ගැනීම්වලින් සියයට 82 ක් පමණ විය. මෙය ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බැඳුම්කර මගින් ලබා ගන්නා ලදී. භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ අඩුවීම කෙටිකාලීන මූල්‍යකරණයෙන් ඉවත්වීම පිළිඹිබු කරයි. බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික ණය හිමියන් අතර විදේශීය ණය විවිධාංගීකරණය වී පැවති අතර, ණය ගැනීමේ සීමාව භාවිත කිරීම වාර්ෂික සීමාවෙන් සියයට 24.9 ක් ලෙස සාපේක්ෂ මධ්‍යස්ථ මට්ටමක පැවැතුණි.


විදේශීය ණය ප්‍රතිසංස්කරණ වැඩසටහන සැලකිය යුතු ප්‍රගතියක් අඛණ්ඩව අත්කරගත් අතර, 2026 වසරේ ජූනි මස අවසානය වන විට ප්‍රතිව්‍යුහගතකරණයට යටත් ද්විපාර්ශ්වික ණය තොගයෙන් සියයට 93 ක් ආවරණය වන පරිදි ගිවිසුම්වලට එළඹී තිබුණි. පළමු භාගය තුළ විදේශීය මූල්‍යකරණය ඇ.ඩො. මිලියන 913 ක් වූ අතර, එහි විශාලතම කොටස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසින් දරන ලදී. එමෙන්ම, ප්‍රතිලබ්ධීන්ගෙන් සියයට 77 ක් අයවැය මූල්‍යකරණය සඳහා වන අතර, එමගින් රජයේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීමේදී වැඩසටහන් පාදක මූල්‍යකරණයේ පවතින කාර්යභාරය ඉස්මතු වේ.

4.2 රාජ්‍ය ණය තොගය

2026 වසරේ ජූනි මස අවසානය වන විට මුළු රාජ්‍ය ණය තොගය රු. බිලියන 31,999 ක් (ඇ.ඩො. මිලියන 95,047 කට සමාන) විය.

2026 වසරේ ජූනි මස අවසානය වන විට රජයේ විදේශීය ණය ප්‍රමාණය ඇ.ඩො. බිලියන 38 ක් (රු.බිලියන 12,796 කට සමාන) විය. රජයේ මුළු විදේශීය ණයවලින් සියයට 39 ක් බහුපාර්ශ්වික ණය වූ අතර, වාණිජ ණය සියයට 33 ක් සහ ද්විපාර්ශ්වික ණය සියයට 28 ක් විය.

4.1 රූපසටහන | ණය හිමියන් අනුව රජයේ විදේශ ණය: 2026 ජූනි මස අවසානය වන විට (ඇ.ඩො. බිලියන)



මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

දේශීය අංශය සැලකීමේදී, 2026 වසරේ ජූනි මස අවසානය වන විට දේශීය ණය තොගය රු. බිලියන 19,203 ක් විය. ආණ්ඩුවේ සමස්ත දේශීය ණය තොගයෙන් සියයට 84 ක් භාණ්ඩාගාර බැඳුම්කර වූ අතර, භාණ්ඩාගාර බිල්පත් සියයට 12 ක් විය.

4.3 ණය ගැනීමේ සීමා උපයෝජනය

2026 මුදල් වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද මුළු දළ ණය ගැනීමේ සීමාව රු. බිලියන 3,740 ක් වූ අතර, එයින් රු. බිලියන 1,954 ක් 2026 වසරේ ජනවාරි මස 01 සිට ජූනි මස 30 දක්වා කාලය සඳහා වෙන් කර තිබුණි. මෙයට පිළිවෙලින් රු. බිලියන 1,590 ක සහ රු. බිලියන 364 ක දේශීය හා විදේශීය ණය ගැනීම් ඇතුළත් විය.

මෙම ණය ගැනීම්වල ප්‍රධාන අරමුණු වූයේ ණය බැඳීම් පියවීම සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා සහාය වීමයි. වාර්තා කරන දිනය වන විට, දේශීයව භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම මගින් රු. බිලියන 1,353.7 ක් සහ විදේශීය මූල්‍ය ප්‍රභවයන් මගින් රු. බිලියන 297.4 ක් රැස් කර ගෙන තිබුණි. ඒ අනුව, 2026 වසරේ පළමු භාගයේ මුළු ණය ගැනීම්වලින් සියයට 82 ක් පමණ දේශීයව, ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බැඳුම්කර හරහා ලබාගෙන ඇත. භාණ්ඩාගාර බැඳුම්කර භාවිතා කරන ලද්දේ දේශීය ණය සේවාකරණ ගෙවීම් සඳහා පමණි.

මෙම කාල සීමාව තුළ රු. බිලියන 720.9 ක් වූ භාණ්ඩාගාර බිල්පත්වල ඍණාත්මක ශුද්ධ නිකුතුව මගින් පෙන්නුම් කරන්නේ නව නිකුත් කිරීම්වලට වඩා නැවත ගෙවීම් වැඩි වූ බවයි. එමගින් භාණ්ඩාගාර බිල්පත්වල හිඟ ණය ප්‍රමාණය අඩු කිරීමට මුදල් ප්‍රවාහ මූල්‍යයනය භාවිතා කර ඇති බව තහවුරු වේ.

ඒ අනුව, 2026 වසරේ ජූනි මස අවසානය වන විට මුළු ණය ගැනීමේ සීමා උපයෝජනය රු. බිලියන 930.2 ක් වූ අතර, එය 2026 වසර සඳහා වූ වාර්ෂික ණය ගැනීමේ සීමාවෙන් සියයට 24.9 ක් නියෝජනය කරයි.

4.1 වගුව | දේශීය ණය ගැනීම් (දළ) : ජනවාරි - ජූනි 2026

ණය මෙවලම	රු. බිලියන
භාණ්ඩාගාර බැඳුම්කර	1,353.77

මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

4.2 වගුව | දේශීය ණය ගැනීම් (ශුද්ධ) : ජනවාරි - ජූනි 2026

ණය මෙවලම	රු. බිලියන
භාණ්ඩාගාර බිල්පත්	-720.94

මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

4.4 විදේශීය මූල්‍යනය

4.4.1 2026 වසරේ පළමු භාගය තුළ විදේශීය මූල්‍යන එකඟතා

ඩිජිටල් පරිවර්තන ව්‍යාපෘතිය සඳහා මූල්‍ය පහසුකම් සැලසීම පිණිස රජය ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය (IDA) සමඟ ඇ.ඩො. මිලියන 50 ක ණය ගිවිසුමකට එළඹුණි. මෙම ගිවිසුම 2026 වසරේ මැයි මස 13 වන දින අත්සන් කරන ලද අතර, වසර 5 ක සහන කාලයක් ඇතුළත්ව ණය කල්පිරීමේ කාලය වසර 25 ක් වන අතර පොලී අනුපාතය සියයට 1.50 කි.

4.4.2 2026 ජනවාරි 1 සිට ජූනි 30 දක්වා කාලය තුළ විදේශීය මූල්‍යන ප්‍රතිලබ්ධීන් සහ උපයෝජනය

මුළු **විදේශීය මූල්‍යන** ප්‍රතිලබ්ධීන් ප්‍රමාණය ඇ.ඩො. මිලියන 913.03 ක් විය. එහි විශාලතම කොටස ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ අරමුදල් පහසුකම (EFF) යටතේ වාර්තා වූ අතර එය මුළු ප්‍රමාණයෙන් සියයට 76.1 ක් විය. ඉන් අනතුරුව ලෝක බැංකුවෙන් (සියයට 10.5) සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් (සියයට 7.3) **විදේශීය මූල්‍යන** ප්‍රතිලබ්ධීන් සිදු විය.

4.3 වගුව | විදේශීය ණය ප්‍රතිලබ්ධීන් : 2026 ජනවාරි 01 සිට 2026 ජූනි 30 දක්වා

සංවර්ධන හවුල්කරු	ණය මුදල (ඇ. ඩො. මිලියන) (තාවකාලික)
ජපාන රජය	13,454,277.10
අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල	2,630,460.43
ඉන්දියානු අපනයන-ආනයන බැංකුව	7,572,739.89
ආසියානු සංවර්ධන බැංකුව	66,323,966.92
ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව	23,279,115.37
ලෝක බැංකුව	96,336,432.35
ජාත්‍යන්තර කෘෂිකාර්මික සංවර්ධන අරමුදල	3,500,000.00
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල - 2023 -2026 විස්තීර්ණ අරමුදල් පහසුකම (EFF) වැඩසටහන	695,143,845.51
ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල	4,790,373.40
එකතුව	**913,031,210.97**


මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

විවිධ මුදල් වර්ගවලින් කරන ලද ප්‍රතිලබ්ධීන් ඇමරිකානු ඩොලර් බවට පරිවර්තනය කිරීම සඳහා ඒ ඒ දිනවල පැවති විනිමය අනුපාත භාවිතා කර ඇත.

විශේෂ ගැනුම් හිමිකම් විනිමය ඇ.ඩො. බවට පරිවර්තනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පෙර මාසයේ අවසානයේ පැවති මාසික විනිමය අනුපාතික භාවිතා කර ඇත.

අරමුණ අනුව ප්‍රතිලබ්ධීන් වෙන්කිරීම සැලකීමේදී, විශාලතම කොටස අයවැය සහාය සඳහා වෙන් කර ඇති අතර, එය මුළු ප්‍රතිලබ්ධීන්ගෙන් සියයට 77 ක් විය. ඉතිරිය විවිධ ආර්ථික ක්ෂේත්‍ර අතර විවිධාංගීකරණය විය. මාර්ග සහ පාලම් ක්ෂේත්‍රය දෙවන විශාලතම වෙන්කිරීම (සියයට 7) ලබා ගත් අතර, ඉන් පසුව ගොඩබිම් ප්‍රවාහනය (සියයට 3) විය. ඉතිරිය කෘෂිකර්මය, සෞඛ්‍ය සහ සමාජ සුභසාධනය, නිවාස හා නාගරික සංවර්ධනය, මානුෂීය ආධාර, ග්‍රාමීය සංවර්ධනය සහ ජල සම්පාදනය වැනි අනෙකුත් ක්ෂේත්‍ර සඳහා වෙන් කරන ලදී.

4.2 රූප සටහන: සංවර්ධන පාර්ශවකරුවන්/ණය දෙන ආයතන අනුව 2026 ජනවාරි 01 සිට ජූනි 30 දක්වා ප්‍රතිලබ්ධීන් (ඇ.ඩො. මිලියන)




මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

4.5 ණය සේවාකරණ ගෙවීම්

2026 වසරේ ජනවාරි මස 01 සිට ජූනි 30 දක්වා මුළු ණය සේවාකරණ ගෙවීම් ප්‍රමාණය රු. බිලියන 2,320 ක් විය (භාණ්ඩාගාර බිල්පත් කල්පිරීම් හැර). මෙයින් රු. බිලියන 1,125 ක් වාරික ගෙවීම් (මූලික මුදල්) සඳහා ද රු. බිලියන 1,195 ක් පොලී ගෙවීම් සඳහා ද විය. 2026 වසරේ පළමු භාගයේදී අන්තර් වාර්ෂික කල්පිරීම් ද ඇතුළත්ව භාණ්ඩාගාර බිල්පත් පියවීම් රු. බිලියන 3,083 ක් විය.

මුළු විදේශීය ණය සේවාකරණ ගෙවීම් ප්‍රමාණය ඇ.ඩො. මිලියන 1,253.9 ක් වූ අතර, එයින් ඇ.ඩො. මිලියන 812.0 ක් වාරික ගෙවීම් සඳහා ද ඉතිරි ඇ.ඩො. මිලියන 441.9 පොලී ගෙවීම් සඳහා ද විය.

4.3 රූප සටහන | ණය සේවාකරණ ගෙවීම්වල සංයුතිය



මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය

2026 වසරේ ජූනි මස අවසානය වන විට විදේශීය ගෙවීම්වලින් නොපියවූ ණය කිසිවක් නොතිබුණි. විදේශීය ගෙවීම් නොපියවූ ණය යනු අදාළ සහන කාලයන්ට යටත්ව, ගිවිසුම්ගත එකඟතාවල දක්වා ඇති පරිදි නියමිත වේලාවට ගෙවා නොමැති විදේශිකයන් වෙත ඇති ණය සේවාකරණ (වාරික සහ පොලී) වේ. කෙසේ වෙතත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහන නිරීක්ෂණය කිරීමේ අරමුණු සඳහා, අර්බුදයට ලක්ව ඇති හෝ විවාදාත්මක තත්ත්වයේ පවතින කල්ඉකුත් වූ ණය සහ ණය සේවාකරණ විදේශීය ගෙවීම් නොපියවූ ණය ලෙස සලකනු නොලැබේ. නැවත කාලසටහන්ගත කිරීමේ හෝ ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ ගිවිසුමකට එළඹීමට අපේක්ෂා කරන, ණය සේවාකරණ නොගෙවීම් නිසා ඇතිවන නොපියවූ ණය මෙම අර්ථ දැක්වීමෙන් බැහැර කර ඇත. ප්‍රතිව්‍යුහගතකරණය කරන ලද සහ ප්‍රතිව්‍යුහගතකරණය නොකළ ණය ගිවිසුම් දෙකම යටතේ ගෙවීම් අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරමින් පවතී.

4.6 ණය ප්‍රතිසංස්කරණ වැඩසටහනේ ප්‍රගතිය

2022 වසරේ අප්‍රේල් මාසයේදී රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම් අත්හිටුවීම ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, ශ්‍රී ලංකාව සිය විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමෙහිලා සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇති අතර, ද්විපාර්ශ්වික සහ වාණිජ ණයහිමියන් යන කාණ්ඩ දෙකෙහිම වැදගත් සන්ධිස්ථානයන් කරා ළඟා වී ඇත.

2024 වසරේ ජූනි මස 26 වන දින, ශ්‍රී ලංකාව රටේ ප්‍රධාන ද්විපාර්ශ්වික ණය හිමියන් නියෝජනය කරන නිල ණය හිමියන්ගේ කමිටුවේ (OCC) සාමාජිකයින් සමඟ ණය පිරියම් කිරීමේ ගිවිසුම (Debt treatment agreement) අවසන් කළේය. එදිනම චීන අපනයන-ආනයන බැංකුව සමඟ එම ආයතනයට අයත් ණය පිරියම් කිරීමේ ගිවිසුම ද අවසන් කළේය. මෙම ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සංශෝධන කටයුතු අත්සන් කිරීම හරහා ක්‍රියාත්මක කරන ලදී. 2024 වසරේ දෙසැම්බර් මස 24 වන දින චීන සංවර්ධන බැංකුව (China Development Bank) සමඟ සංශෝධිත ගිවිසුම් අත්සන් කිරීමත් සමඟ තවදුරටත් ප්‍රගතියක් අත්කර ගනිමින්, එම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ද අවසන් කරන ලදී.

මේ අතර, ජාත්‍යන්තර බැඳුම්කර (ISB) ප්‍රතිව්‍යුහගතකරණය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව 2024 වසරේ සැප්තැම්බර් මස 19 වන දින ජාත්‍යන්තර බැඳුම්කර හිමියන් සමඟ මූලික එකඟතාවයකට පැමිණියේය. නොපියවූ ජාත්‍යන්තර බැඳුම්කර නව බැඳුම්කර සඳහා හුවමාරු කිරීම 2024 වසරේ දෙසැම්බර් මස 16 වන දින සියයට 98 කට ආසන්න සහභාගීත්ව අනුපාතයක් සහිතව සම්පූර්ණ කරන ලද අතර, එමගින් නොගෙවා තිබූ සියලුම ජාත්‍යන්තර බැඳුම්කර ද නව ජාත්‍යන්තර බැඳුම්කර බවට පරිවර්තනය කිරීමට මග පෑදිණි.

පැරිස් සමාජයේ (Paris Club) සාමාජිකයින් සමඟ ද්විපාර්ශ්වික ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේදී ද ශ්‍රී ලංකාව වැදගත් ප්‍රගතියක් අත්කර ගත්තේය. ජපාන රජය, ඉන්දියානු අපනයන-ආනයන බැංකුව සහ ප්‍රංශ ජනරජය සමඟ ද්විපාර්ශ්වික සංශෝධිත ගිවිසුම් අත්සන් කිරීම ප්‍රධාන අත්කරගැනීම් මාලාවක් සලකුණු කළේය. ජපානය සමඟ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය 2025 වසරේ මාර්තු 24 වන දින අවසන් වූ අතර, පසුව 2025 වසරේ මාර්තු 25 ණය මාලා සහ 2025 වසරේ අප්‍රේල් මස 3 (ගැණුම්කරුවන්ගේ ණය ගිවිසුම්) යන දිනවල ඉන්දියානු අපනයන-ආනයන බැංකුව සමඟ ද්විපාර්ශ්වික සංශෝධිත ගිවිසුම් අත්සන් කරන ලදී. ශ්‍රී ලංකාව 2025 වසරේ ජූනි මස 16 වන දින ප්‍රංශ ජනරජයේ රජය සමඟ ද, 2025 වසරේ ජූලි මස 1 වන දින හංගේරියානු EXIM බැංකුව සමඟ ද, 2025 වසරේ ජූලි මස 14 වන දින සංවර්ධනය සඳහා වන සෞදි අරමුදල සමඟ ද, 2025 වසරේ අගෝස්තු මස 22 වන දින එක්සත් රාජධානිය සමඟ ද ද්විපාර්ශ්වික සංශෝධිත ගිවිසුම් අත්සන් කළේය. 2025 වසරේ ඔක්තෝබර් මස 27 වන දින ඔස්ට්‍රේලියානු රජය සමඟ ද, 2025 වසරේ නොවැම්බර් මස 11 වන දින ඩෙන්මාර්ක රජය සමඟ ද ද්විපාර්ශ්වික සංශෝධිත ගිවිසුම් අත්සන් කරන ලදී.

2026 වසරේ පළමු භාගය තුළ, රජය බෙල්ජියම, ජර්මනිය, ස්පාඤ්ඤය සහ කොරියානු ජනරජය යන රජයන් සමඟ ද්විපාර්ශ්වික ණය ප්‍රතිසංස්කරණ ගිවිසුම් අවසන් කළේය. ඒ අනුව, 2026 වසරේ ජූනි මස 30 වන විට ප්‍රතිව්‍යුහගතකරණය කිරීමට නියමිත ද්විපාර්ශ්වික ණය තොගයෙන් සියයට 93 ක් ආවරණය වන පරිදි ගිවිසුම් අවසන් කර තිබූ අතර, ඉතිරි කොටස 2026 වසර අවසානය වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ.

ණය ගිවිසුම් සාර්ථකව අවසන් කිරීමෙන් පසුව, ශ්‍රී ලංකාව අදාළ ණයහිමි පාර්ශවකරුවන් වෙත සේවාකරණ කිරීම නැවත ආරම්භ කර ඇත. මේ අතර, රටවල් 13 ක ණය හිමියන් සමඟ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය අඛණ්ඩව සිදුවෙමින් පවතී. මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සහ අදාළ ණයහිමියන් සමඟ සම්බන්ධීකරණයෙන්, ණය උපදේශකයින් ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීම සඳහා අවශ්‍ය සාකච්ඡා සහ ක්‍රියාවලීන් අඛණ්ඩව පවත්වාගෙන යයි.

4.7 රජයේ ඇපකර

2026 වසරේ මාර්තු මස 31 වන විට, භාණ්ඩාගාර ඇපකර (TG) සහ සහන ලිපි (LCs) සම්බන්ධ මුළු හිඟ ප්‍රාග්ධනය රුපියල් මිලියන 971,188.5 ක් විය. මෙම මුදලින්, රුපියල්වලින් තක්සේරු කරන ලද භාණ්ඩාගාර ඇපකර සහ සහන ලිපි රුපියල් මිලියන 473,013.3 ක් වූ අතර, රුපියල් බවට පරිවර්තනය කරන ලද විදේශ මුදල් බැඳීම් රුපියල් මිලියන 498,175.2 ක් විය.

එබැවින් විදේශ මූල්‍යමය බැඳීම් මුළු හිඟ මුදලෙන් සියයට 51.3 ක් නියෝජනය කළ අතර, රුපියල් මූල්‍යයනය සියයට 48.7 ක් විය. විදේශ මුදල් අතුරින්, ඇමෙරිකානු ඩොලර් මගින් ඇති බැඳීම් විශාලතම අගය වූ රු. මිලියන 401,661.7 ක් වූ අතර, ඉන් අනතුරුව, ජපන් යෙන් (Yen) වලින් නාමකරණය කර ඇති බැඳීම්වල වටිනාකම රු. මිලියන 53,471.1 ක් සහ යුරෝ වලින් නාමකරණය කර ඇති බැඳීම්වල වටිනාකම රු. මිලියන 43,042.4 ක් විය. 2026 වසරේ ජූනි මස 30 වන විට ඇපකර සීමා භාවිතය සාමාන්‍ය දළ ණය ගැනීමේ සීමාවෙන් සියයට 3 ක් විය.

4.4 වගුව | 2026.06.30 දක්වා මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද හිඟ භාණ්ඩාගාර ඇපකර සහ සහන ලිපි ලැයිස්තුව

රු. මිලියන

අනු අංකය	බැංකුවේ හෝ ආයතනයේ නම	ආයතනයේ නම	2026.06.30 දිනට නිකුත් කළ වටිනාකම		2026.06.30 දිනට නොපියවූ වටිනාකම	
1	ආසියානු සංවර්ධන බැංකුව	ලංකා විදුලි (පුද්ගලික) සමාගම (LECO)	16,833.12	223,880.44	16,802.82	147,505.23
		ලංකා විදුලිබල මණ්ඩලය	50,499.35		50,405.08	
		ලංකා විදුලිබල මණ්ඩලය	134,664.92		60,733.88	
		බලශක්ති ක්‍රියාකාරකම් සහාය පහසුකම (CEB)	5,049.93		2,730.33	
		ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	16,833.12		16,833.12	
2	ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව	ලංකා බැංකුව සහ මහජන බැංකුව	60,599.21	60,599.21	20,199.74	20,199.74
3	ලංකා බැංකුව	ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව	500.00	471,614.99	500.00	255,530.29
		ලංකා විදුලිබල මණ්ඩලය	4,540.00		51.18	
		ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	220,000.00		92,203.64	
		ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය	85.00		3.26	
		ජනතා වතු සංවර්ධන මණ්ඩලය	200.00		28.55	
		ලංකා කෝල් (පුද්) සමාගම	49,500.00		34,774.77	

රු. මිලියන

අනු අංකය	බැංකුවේ හෝ ආයතනයේ නම	ආයතනයේ නම	2026.06.30 දිනට නිකුත් කළ වටිනාකම		2026.06.30 දිනට නොපියවූ වටිනාකම	
		ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය	8,600.00		4,150.00	
		ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය	65,793.15		31,190.45	
		මාර්ග සංවර්ධන අධිකාරිය	118,970.03		89,337.84	
		රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව	1,126.81		990.61	
		රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව	2,300.00		2,299.99	
4	චීන සංවර්ධන බැංකුව	ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය	118,643.13	118,643.13	63,346.38	63,346.38
5	චීන ජාතික රසායනික ඉංජිනේරු අංක 14 ඉදිකිරීම් සමාගම (China National Chemical Engineering No.14 Construction Co. Ltd)	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	14,737.39	14,737.39	6,642.35	6,642.35
6	කොමර්ෂල් බැංකුව	ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය	968.36	968.36	363.08	363.08
7	DFCC බැංකුව	ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය	6,026.24	11,026.24	2,701.08	6,179.34
		මාර්ග සංවර්ධන අධිකාරිය	5,000.00		3,478.26	
8	ඉන්දියානු අපනයන-ආනයන බැංකුව (Exim Bank)	ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය	88,232.46	88,232.46	54,168.96	54,168.96
9	අපනයන සංවර්ධන මණ්ඩලය	ලංකා බැංකුව සහ මහජන බැංකුව	60.00	60.00	60.00	60.00
10	හැටන් නැෂනල් බැංකුව	ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම	4,000.00	20,507.22	4,000.00	10,466.19
		ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය	16,507.22		6,466.19	
11	හොංකොං සහ ෂැංහයි බැංකු සංස්ථාව (HSBC)	ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම	14,859.58	14,859.58	9,928.17	9,928.17
12	චීන කාර්මික සහ වාණිජ බැංකුව	ලංකා විදුලිබල මණ්ඩලය	14,130.53	14,130.53	8,931.65	8,931.65
13	නෙදර්ලන්තයේ ING බැංකුව NV	ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය	31,844.90	31,844.90	27,379.46	27,379.46
14	ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (IATA)	ශ්‍රී ලංකන් ගුවන් සමාගම	3,905.28	3,905.28	3,905.28	3,905.28
15	ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA)	ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම	154,463.05	154,463.05	53,471.12	53,471.12
16	ජාතික සංවර්ධන බැංකුව	ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය	20,306.30	20,306.30	11,883.47	11,883.47
17	ජාතික සංවර්ධන බැංකුව	ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය	1,074.13	1,074.13	991.43	991.43

රු. මිලියන

අනු අංකය	බැංකුවේ හෝ ආයතනයේ නම	ආයතනයේ නම	2026.06.30 දිනට නිකුත් කළ වටිනාකම		2026.06.30 දිනට නොපියවූ වටිනාකම	
18	ජාතික ඉතිරිකිරීමේ බැංකුව	ලංකා විදුලිබල මණ්ඩලය	5,000.00	147,098.87	2,500.00	118,920.71
		ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය	33,896.09		26,632.64	
		ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය	32,710.61		24,304.24	
		මාර්ග සංවර්ධන අධිකාරිය	75,492.17		65,483.83	
19	වී අලෙවි මණ්ඩලය	සමූපකාර තොග වෙළඳ සංස්ථාව	880.00	880.00	729.60	729.60
20	මහජන බැංකුව	ලංකා විදුලිබල මණ්ඩලය	6,500.00	113,483.90	4,535.34	78,544.40
		ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව	2,600.72		1,430.81	
		ලංකා නාවික සංස්ථාව	24,209.54		15,991.46	
		ජාතික පද්ධති මෙහෙයුම්කරු (පෞද්ගලික) සමාගම	20,560.00		20,524.25	
		ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය	4,563.98		2,313.09	
		මාර්ග සංවර්ධන අධිකාරිය	53,784.66		33,241.94	
		ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව	100.00		59.12	
		රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව	1,165.00		448.39	
21	ඉන්දියානු සංචිත බැංකුව (Reserve Bank of India)	ශ්‍රී ලංකා මහ බැංකුව	370,809.59	370,809.59	67,810.52	67,810.52
22	සම්පත් බැංකුව	මාර්ග සංවර්ධන අධිකාරිය	14,500.00	14,500.00	8,568.18	8,568.18
23	යුනි ක්‍රෙඩිට් බැංකුව ඔස්ට්‍රියා AG (Uni Credit Bank Austria AG)	ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය	19,425.14	19,425.14	15,662.96	15,662.96
	එකතුව		**1,917,050.71**	**1,917,050.71**	**971,188.51**	**971,188.51**

මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය